# பொருளியல் நோக்கு

ஜூலை/ஆகஸ்ட்
1984

## ஏற்றுமதி அபிவிருத்தி



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ලෝක වෙළඳාමේ උපනතීන්




Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ආර්ථික විමසුම

10 වෙනි වෙළුම    අංක 3    1984 ජූනි/ ජූලි/ අගෝස්තු

Appropriate Technology Services
121, POINT ... ROAD
NALLUR, JAFFNA
No 1275

ප්‍රකාශනය:
පර්යේෂණ අංශය
මහජන බැංකුව
ප්‍රධාන කාර්යාලය
11වෙනි මහල
කොළඹ 2.

## පටුන

### ලිපි

වැදගත් සිදුවීම් 2 ජූනි, ජූලි, අගෝස්තු 1984

### විශේෂාංග

එම්. ඩබලිව්. ජේ. ජී. මැන්දිස් 21 නාගරික පලාත්බද සංවර්ධනය දිරිගැන්වීමෙහිලා නාගරික සේවාවන් සහ කොටස් වෙළඳ පොලේ මෙහෙයුම් කටයුතු

27 1975 අප්‍රේල් – 1983 මාර්තු ආර්ථික විමසුම ලිපි–සූචිය

### විශේෂ වාර්තාව

ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ 3 අපනයන සංවර්ධනය ප්‍රතිපත්ති සහ ජයග්‍රහණයන්

10 අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සලසා දී ඇති අපනයන දිරිගැන්වීම් හා වෙනත් ආධාර.

16 අපනයන මූල්‍යකරණ හා අපනයන ණය රක්ෂණ පහසුකම්

17 විදේශීය සෘජු ආයෝජන සහ නිෂ්පාදිත භාණ්ඩ අපනයන

### මීළඟ කලාපය

- ශ්‍රී ලංකාවේ වී ගොවිතැන
- කොළඹ නගරයේ ව්‍යාපාර පරිශ්‍ර වෙළඳපොළ
- රජයේ ආයෝජන ප්‍රමුඛතා හා පෞද්ගලික අංශයේ අපේක්ෂා

ආර්ථික විමසුමේ අරමුණ නම් නොයෙක් තොරතුරු, අදහස්, වාර්තා, වාද විවාද ආදිය ඉදිරිපත් කරමින් ආර්ථිකය හා ආර්ථික සංවර්ධනය පිළිබඳව පාඨකයන් තුළ දැනුම හා උනන්දුව ජනිත කිරීමයි. ආර්ථික විමසුම මහජන බැංකුවේ ප්‍රජා සේවා, වැඩ පිළිවෙලකි. මෙහි ඇතුලත් කරුණු කතෘ මණ්ඩලයේ අදහස් අනුව මිස අවශ්‍යයෙන්ම බැංකු ප්‍රතිපත්ති අනුව සකස් වී නොමැත. කතුවරුන්ගේ නම් සහිත ලිපිවල ගැබවන්නේ ඔවුන්ගේ පෞද්ගලික අදහස් මිස ඔවුන් නියෝජනය කරන ආයතනවල අදහස් නොවේ. සඟරාව පිළිබඳ ඔබේ අදහස් හා විවේචනද සඟරාවේ පළකිරීමට ලිපිද ලැබෙන්නට සැළැස්සුවහොත් කෘතඥවෙමි.

ආර්ථික විමසුම මාසික ප්‍රකාශනයකි. දයක මුදල් ගෙවීමෙන් හෝ පොත්හල් වලින් ලබාගත හැක.

පිටකවරය: ගිබ්සන් පී. ඇතුලත්මුදලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# වැදගත් සිදුවීම්

**ජූනි :**

**21.** පැරිසියේදී ලෝක බැංකුවේ සභාපතිත්වයෙන් පවත්වන ලද ආධාර කණ්ඩායමේ වාර්ෂික රැස්වීමේදී 1984–85 සඳහා ශ්‍රී ලංකාවට ඩොලර් දශලක්ෂ 541 ප්‍රදානය කිරීමට තිවිස ගන්නා ලදී. මෙය ගිය වසරේදී ගිවිසගත් ඩොලර් දශ ලක්ෂ 473 සමග සසඳන විට 14.4% වැඩිවීමකි. මෙම ඩොලර් ද. ල. 541 ක් ආහාර හා භාණ්ඩ ආධාර දශ ලක්ෂ 102 ක්ද, මහවැලි නොවන ව්‍යාපෘතීන් සඳහා දශ ලක්ෂ 373 ක්ද, මහවැලි පහළ කොටසේ සංවර්ධනය සඳහා දශ ලක්ෂ 66 ක්ද වශයෙනි.

**25.** එකතුව ක්‍රෝනර් දශ ලක්ෂ 551 ක් වන ප්‍රදානයන් දෙකක් සඳහා ස්වීඩන හා ශ්‍රී ලංකා ආණ්ඩු අතර ගිවිසුම් පත් හුවමාරු කර ගැනිණ. මෙයින් දශ ලක්ෂ 510 ක් කොත්මලේ ව්‍යාපෘතියට ද, ශක්ෂය, ශ්‍රී ලංකාවේ බලශක්ති ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම වැඩිදියුණු කිරීමට ආධාර වන බලශක්ති මිනුම් ශිල්පී ක්‍රම හඳුන්වාදීමට ආධාර කරනු සඳහා අධ්‍යාපනයට හා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන්ටද ලබා දෙනු ඇත.

**29.** කැනේඩියානු ඩොලර් දශ ලක්ෂ 30 (රුපියල් දශ ලක්ෂ 586 ට ආසන්න) වටිනා ආහාර ආධාර ප්‍රදානයක් සඳහා ශ්‍රී ලංකා හා කැනඩා ආණ්ඩු අතර ගිවිසුම් පත් හුවමාරු විය. මෙය කැනඩාවෙන් තිරිඟු ඇට මිලදී ගැනීම හා ප්‍රවාහනය කිරීම පිණිස වසර තුනක් තුළදී යොද ගන්නවා ඇත. මෙම ප්‍රදානයෙන් උත්පාදනය කෙරෙන අතිරේක අරමුදල් කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිවල සහ අනෙකුත් ව්‍යාපෘතිවල දේශීය පිරිවැය සපුරා ගැනීම සඳහා යොදගන්නවා ඇත.

**30.** ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජීවන වියදම් දර්ශකය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය) 1984 ජූනි අවසානයට 556.8 ක් විය. මෙය 1983 ජූනි මසදී මෙය 472.6 ක්ද 1984 ජූනි අගදී 414.5 ක්ද විය.

**ජූලි :**

**1.** ආධාරක තෙල් (Base Oil) මෙට්‍රික් ටොන් 20,000 ක් (අපරැද්දේ තොගය) මිලදී ගැනීම සඳහා ඒහජන චීනයේ සිනොකෙම් සමාගම හා ලංකා ඛනිජ තෙල් සංස්ථාව අතර ගිවිසුමක් අත්සන් කරන ලද බව එහි සභාපතිවරයා නිවේදනය කළේය.

**2.** ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු සඳහා ගෙවන වාර්ෂික පොළිය 20% සිට 18% දක්වා අඩු කරන ලදී. මාස 6 තැන්පතු සඳහා ගෙවන වාර්ෂික පොලිය, 1% ක්, 14% දක්වා අඩු කරන ලදී. මෙතෙක් කළ අයුරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව තැන්පත් පොලී තීරණය කිරීමේ පුරුද්දෙන් බැහැරවීමක් මෙයින් පිළිබිඹු වේ. රජය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් මත රඳී සිටීම අඩු කිරීම අපේක්ෂාවෙන් තැන්පතු හා ණය සඳහා පොලී අනුපාත තීරණය කිරීමට ඉඩ ලැබෙන පරිදි වැඩි නම්‍යතාවක් ජා. ඉ. බැං. ට ලැබී ඇත.

**3.** මේ වසරේ පළමු හයමස ඇතුළත තේ සඳහා වටිනාකම වන ඉපයකරන ලද විකුණුම් බද්ද මෙතෙක් නොවූ විරූ වාර්තාවක් වෙමින් රු. ද. ලක්ෂ 1844.8 ක් විය. ගිය වසරේ මේ කාලය ම තුළ අය කරන ලද්දේ රු. දශ ලක්ෂ 364.9 කි. මෙය 405% වැඩිවීමකි.

**9.** නිල ප්‍රකාශයකට අනුව වැදගත් අමතර කොටස් ලබා ගැනීමට හැකියාවක් නොමැතිව වැඩ පොළවල නොදුවා බස් රථ තබා ගැනීමට හේතු වී ඇති උග්‍ර ද්‍රවශීලතා අර්බුදයෙන් මිදී, මාර්ගයන්හි බස් රථ ධාවනය කිරීම පිණිස, රු. දශ ලක්ෂ 150 ක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය රජයෙන් ඉල්ලා ඇත.

සැපයුම් මධ්‍යස්ථානයෙන් සීනි නිකුත් කිරීමේදී කිලෝවක මිල රු. 11.40 ක් වන පේ ශත .40 ක් ආහාර කොමසාරිස් වැඩි කරන ලදී.

මිලි ලීටර් 750 පොල් අරක්කු බෝතලයක මිල රු. 43.00 සිට රු. 47.00 දක්වා වැඩි කරන ලදී.

**26.** රබර් කිලෝවක අපනයන බද්ද සංශෝධනය කොට කිලෝ ග්‍රෑමයකට රු. 2.00 ක් අඩු කරන ලද බව රජය ප්‍රකාශ කළේය. දේශීය මිල පහත බැසීම හා නිෂ්පාදන වියදම් අධික වීමට මුහුණ පා ඇති නිෂ්පාදකයන්ට සහනයක් සැලසීම මෙම පියවරෙන් අපේක්ෂිතය. මේ නිසා 1984 දී රජයට අහිමිවන ආදයම රු. ද. ලක්ෂ 100 කි.

**31.** ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් ගණනය කර ඇති පරිදි 1984 ජූලි අවසානයට ජීවන වියදම් දර්ශකය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය) 561.1 ක් දක්වා නැග තිබුණි. මෙය 1983 ජූලි අවසානයේදී රු. 477.1 ක් විය.

**අගෝස්තු :**

**1.** අවුරුදු 6 ක මේරීම් කාලයක් ඇති රජයේ සුරැකුම්පත්වලට ගෙවනු ලබන වාර්ෂික පොළිය 16% දක්වා වැඩි කරන ලදී. මෙම සංශෝධනය කරන ලද්දේ, රජයේ රුපියල් ණය වැඩ සටහනට අරමුදල් ඇද ගැනීමේ පරමාර්ථයෙනි. මෙම සංශෝධනයට ප්‍රථම, රජයේ සුරැකුම්පත්වල වාර්ෂික පොලිය 14% ක්ද මේරුම් කාලය අවුරුදු 5 ක්ද විය.

**2.** කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ බී කලාපයේ 2 හා 3 තෝටයාශයන්හි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන කටයුතුවල පිරිවැය සපුරා ගැනීම සඳහා යුරෝවිනිමය ඒකක (ECU) දශ ලක්ෂ 20 (රුපියල් දශ ලක්ෂ 405 ආසන්න) ප්‍රදානයක් ලබා දීම පිණිස යුරෝපීය ආර්ථික ප්‍රජාව (EEC) සමග ගිවිසුම්පත් හුවමාරු කර ගන්නා ලදී.

**3.** වියළි කලාපයේ කුඩා පරිමාණ ගොවියාට සුදුසු වන ආකාරයෙන්, පලතුරු හා එළවළු වියළා නිෂ්පාදනය කිරීම හා ටින් කිරීම සඳහා ශිල්පී ක්‍රම වැඩිදියුණු කිරීමට කැනඩා ඩොලර් 11085 (රුපියල් 2,16,000 ක් ආසන්න) සහ තෝරාගත් නාගරික ප්‍රදේශවල සමාජසේවා කටයුතු සඳහා කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සියෙන් (C I D A) කැනඩා ඩොලර් දශ ලක්ෂ 4.7 (රු. දශ ලක්ෂ 92 ආසන්න) ලබා දීමටත් කැනඩා හා ශ්‍රී ලංකා රජයන් අතර ගිවිස ගන්නා ලදී.

**9.** පරිසර දූෂණය පාලන උපක්‍රම ශක්තිමත් කිරීම හා දිස්ත්‍රික් පරිසර ඒජන්සි සතු හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණුකොට නෝර්වීජියන් ක්‍රෝනර් දශ ලක්ෂයක් (රුපියල් තිස්ලක්ෂයක් ආසන්න) වටිනා ප්‍රදානයක් සැලසීමේ ගිවිසුම්පත්, නෝර්වීජියානු ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය (NORAD) හා ශ්‍රී ලංකා රජය අතර අත්සන් කරන ලදී.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org




**ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂය**

**1949 – 1982**

| වර්ෂය | මිල දර්ශකය අපනයන 1978=100 | මිල දර්ශකය ආනයන 1978=100 | අපනයන වටිනාකම (වි.ගැ.හි. දළ) | ආනයන වටිනාකම (වි.ගැ.හි. දළ) | වෙළඳ ශේෂය (වි.ගැ.හි. දළ) |
|---|---|---|---|---|---|
| 1949 | 12.96 | 7.83 | 224.00 | 216.21 | 7.79 |
| 1951 | 21.25 | 10.56 | 365.37 | 325.26 | 50.11 |
| 1953 | 16.74 | 10.56 | 314.74 | 434.79 | - 29.05 |
| 1955 | 19.51 | 9.42 | 397.69 | 310.50 | 87.19 |
| 1957 | 17.47 | 9.99 | 350.85 | 370.82 | - 19.97 |
| 1959 | 17.76 | 9.42 | 372.79 | 411.69 | - 38.90 |
| 1961 | 16.30 | 9.31 | 358.76 | 377.05 | - 18.29 |
| 1963 | 15.87 | 9.65 | 358.60 | 392.40 | - 33.80 |
| 1965 | 16.45 | 11.35 | 399.79 | 402.51 | - 2.72 |
| 1967 | 14.56 | 11.35 | 278.34 | 334.85 | - 56.51 |
| 1969 | 17.03 | 15.21 | 320.41 | 445.62 | -125.21 |
| 1970 | 17.18 | 15.89 | 338.73 | 391.41 | - 53.04 |
| 1971 | 17.03 | 17.03 | 307.73 | 353.47 | - 45.74 |
| 1972 | 17.18 | 17.93 | 282.40 | 320.34 | - 37.94 |
| 1973 | 19.94 | 23.72 | 309.00 | 348.40 | - 39.40 |
| 1974 | 31.00 | 42.00 | 425.00 | 582.87 | -157.87 |
| 1975 | 28.97 | 49.04 | 464.01 | 632.52 | -168.51 |
| 1976 | 34.06 | 44.04 | 484.01 | 557.02 | - 73.01 |
| 1977 | 55.06 | 54.03 | 650.98 | 616.67 | + 34.31 |
| 1978 | 100.00 | 100.00 | 675.00 | 797.30 | -122.30 |
| 1979 | 109.02 | 151.99 | 759.01 | 1,121.00 | -361.99 |
| 1980 | 126.06 | 217.03 | 817.98 | 1,576.00 | -758.02 |
| 1981 | 128.97 | 281.95 | 883.02 | 1,526.00 | -642.80 |
| 1982 | 119.07 | 308.97 | 919.02 | 1,604.07 | -685.50 |
| 1983 | 165.00 | 375.00 | 1,001.20 | 1.670.80 | -669.60 |

# අපනයන සංවර්ධනය

අපනයන ඉපැයුම් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ වේගය හා ස්ථායිතාවය සහ ජනතාවගේ ආදායම් හා ජීවන මට්ටමද තීරණය කිරීමේ වැදගත් සාධකයක් වී තිබේ. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම, එය සතු සම්පත් ප්‍රමාණය හා විශාලත්වය, සහ පුළුල් වෙමින් පවත්නා සම්පත් පරතරය සීමා කිරීමේ බලවත් අවශ්‍යතාවය යන කරුණු නිසා අපනයන වර්ධනය කඩිනම් කිරීම පරම අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. 1977 න් පසු රජය මෙම අදහස දැඩිලෙස පිළිගත් අතර, එදා සිට හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතු වෙන්, අපනයන කෙරෙහි වැඩි අවධාරණයක් කරමින් වෙළඳාම ලිහිල් කිරීමත් ආනයන ගැලීම නිදහස් කිරීමත් සිදුවිය. එහෙත් මෙම ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑමේදී ගන්නාලද පියවරවල් සහ ආර්ථික වතාවරණය, අපනයන සංවර්ධනයට ප්‍රමාණවත් තරමින් හා අරමුණු ඉටුකර ගැනීමට උපස්තම්භක වන තරමින් යෝග්‍ය පරිසරයක් සකස්කර දී නොමැත.

නව ප්‍රතිපත්තිමය පරමාර්ථයන්හි එක් වැදගත් ආරම්භක පියවරක් නම්; ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම ව්‍යවස්ථාමය අවශ්‍යතාවයක් බවට පත්කළ, 1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධනපනත පැනැවීමයි. මෙම අවශ්‍යතාවය අනුව අපනයන සංවර්ධන මණ්ඩලය මෙම කාර්යය ආරම්භ කළ අතර, විශේෂඥ කම්දුවල ආධාරයෙන් 1983 – 87 කාලය ආවරණය වන අයුරින් සැලැස්මක් නිර්මාණය කළාය. අපනයනවල වැදගත්කමත් අපනයන අංශය මුහුණපා සිටින ප්‍රධාන ගැටළුත්, සැලැස්මෙහි පහත දක්වෙන අයුරින් සංක්ෂිපයෙන් දක්වා ඇත.

අපනයනවල වැදගත්කම ගැන සඳහන් කරමින් එය පහත දක්වෙන කරුණු ප්‍රකාශ කරයි. 'ද. දේ. නි. න් තුනෙන් පංගුවකුත්, සේවා නියුක්ති උත්පාදනයෙන් හතරෙන් පංගුවකුත්, රජයේ ආදායමෙන් පහෙන් පංගුවකුත් එය උපයා දෙයි. අපනයනවල වෙනස් වීමක්, ආර්ථිකයේ අනෙක් සෑම අංශයකටම පාහේ බලපායි. අපනයනවල පිරිහීමක් දේශීය ආයෝජන, පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය, රජයේ ආදායම හා වියදම කෙරෙහි නොවැලැක්විය හැකි ප්‍රතිවිපාක උදකරයි. ස්වකීය ආයෝජන භාණ්ඩ අවශ්‍යතාවයන් සියල්ලම පාහේත්, අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩවලින් සැලකිය යුතු ප්‍රමාණයකුත් සඳහා රට, තම අපනයන ඉපැයුම් මත දැඩිසේ රැඳී සිටී. අපනයන, නවීන කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්ව මට්ටමේ විශාල කොටසක් තීරණය කිරීමටද මැදිහත් වෙයි. ගත වූ වසර ගණනාව තුළ ආර්ථිකය වඩාත් විවිධාංගීකරණය හා පුළුල්වීම සිදුවී ඇතත්, අපනයන තවමත් ආර්ථිකයේ වැදගත් තීරකයක් ලෙස පවත්නා අතර, ජනතාවගේ පොදු සුභසාධනය හා ජීවන මට්ටම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපායි. එබැවින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දිගු කාලීන සංවර්ධනය හා ස්ථායිතාවය උදෙසා උසස් අපනයන කාර්ය සාධනයක් අතිශයින් වැදගත් වෙයි. සතුටුදයක ගෙවුම් ශේෂ තත්ත්වයක්, සඳහාද අපනයන වැදගත්වේ. ආනයන ආදේශනය සඳහා විශේෂයෙන්ම කෘෂිකාර්මික අංශයෙහි යම් අවකාශයක් පවත්නා අතර, ශ්‍රී ලංකාවේ පිහිටීම සම්පත් ප්‍රමාණය හා විශාලත්වය, කාර්යක්ෂම ආනයන ආදේශනයට ඇති ඉඩකඩ සීමා කරයි.'

මෙම අංශයෙහි සුවිශේෂ ගැටළු පවත්නා ක්ෂේත්‍රයක් වෙත අවධාරනය යොමු කරමින් සැලැස්ම, ඍජු අදහස් ගණනාවක්ම පලකරයි. රටකින් භාණ්ඩ අපනයනය කිරීමේ හැකියාවට බලපාන සාධක දෙකක් තිබේ. ඒවා නම් ගුණාත්මක තත්වය සහ පිරිවැය හෝ ලාභදායීතාවයයි. ශ්‍රී ලංකාව වඩා විශාල ස්වභාවික වාසියක් සතුව සිටින යම් නිෂ්පාදන සම්බන්ධයෙන් පවා, ලෝක වෙළඳපලවල, තරඟකරුවන් සැළකිය යුතු තරමේ වාසි අත්කරගෙන ඇති නමුදු ශ්‍රී ලංකාව දුර්වලවී ඇති බැව් සත්‍ය





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# අපනයන සංවර්ධනය ප්‍රතිපත්ති සහ ජයග්‍රහණයන්

## ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ

ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව කරන ලද අධ්‍යයනයන් සඳහා ලාට්‍රෝබ් විශ්වවිද්‍යාලය විසින් ආචාර්ය උපාධියක් පිරිනමන ලද ආචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජ හා පරිපාලන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය වරයෙකි.

**ඓතිහාසික පසුබිම:**

1948 දී ඇය ලද දේශපාලන නිදහස සමඟ යටත් විජිත අතීතයෙන් ශ්‍රී ලංකාවට උරුම වූ ආර්ථික ව්‍යුහය 'යටත් විජිත අපනයන ආර්ථික ක්‍රමයක' ආදර්ශයකි. ආර්ථික වර්ධනයේ ගම්‍යතාව බොහෝ සෙයින් තේ, රබර් සහ පොල් යන ප්‍රාථමික අපනයන නිෂ්පාදන තුනේ වාසනා මහිමය මත රඳා පැවැත්තේය. අපනයන ආදායමෙන් සියයට 97 ක්ම මෙම බෝග තුනට අයත් විය. දළ ජාතික ආදායමෙන් සියයට 40 ක් සඳහා සෘජු දායකත්වයක් දැරූ මෙම බෝග තුන ඒවා ආශ්‍රිත උප සේවා ප්‍රමාණවත් අයුරින් සකස්වී නොමැති බව කීමට පුළුවන. එනිසා මැදකාලීන හා දිගු කාලීන අපනයන නිෂ්පාදන ආයෝජන වැඩ පිළිවෙල 1980 අග භාගයේදී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අරඹන ලද්දේ වුවද එවිට බලාපොරොත්තු වූ තරමේ නව අපනයන ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමට හැකිවී නැත. 1977 දී පටන්ගත් විවෘත, නිදහස්, අපනයන යොමු වූ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මෙය සංවේගය දනවන සුළු ප්‍රකාශයකි. ආර්ථිකය, නව ප්‍රතිපත්ති කෙරෙහි චමත්කාරජනක ලෙස බොහෝ ආකාරයන්ගෙන් ප්‍රතිචාරයක දක්වූ අතර ආර්ථික වර්ධන වේගය 1978 දී හා 1979 දී සියයට 8 ක්ද ඉන්පසු සියයට 6 ද වශයෙන් ආර්ථික ක්‍රියාවලිය වේගවත් වූ නමුදු, අපනයන අංශයේ වර්ධන වේගය ඊට පෙර වසර හත තුලදී අත්කර ගන්නා ලද මට්ටමේම නිශ්චලනව පැවති අතර එසේ නොවී නම් එම මට්ටම්වලින් ආන්තිකව පහලට වැටුණි. ගෙවුම් ශේෂය වටා ප්‍රධානම ගැටළුව සංකේන්ද්‍රණය වී ඇති හා ක්ෂණික හා දිගුකාලීන වර්ධන පෙළඹවීම් උත්පාදනය කළයුතු වන්නේ අපනයන අංශය බව පිළිගෙන ඇති ආර්ථිකයකට මෙය ව්‍යකුලත්වයට තුඩු දෙන කරුණකි.'

අපනයන අංශය හා ශ්‍රී ලංකා ආර්ථිකයට එහි වැදගත්කම පිළිබඳ සාමාන්‍ය විමර්ශනයක් සහ අපනයන ප්‍රතිපත්ති හා ඒවායේ බලපෑම පිළිබඳ සවිස්තර විමර්ශනයක්ද ඉදිරි පිටුවල පලවේ.

ඔස්සේ චක්‍ර වශයෙන්ද, දළ ජාතික ආදායම කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කළේය. රජයේ ආදායමෙන් සියයට 50 ක් තරම්ම ලැබුණේ අපනයන බදු වලිනි. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව එළැඹුණු සමයේ දී සාම්ප්‍රදායික අපනයනවලටත් පැහැදිලිවම තේ සහ රබර්වලටත් තිබූ ජාත්‍යන්තර ඉල්ලුමේ, අහිතකර ව්‍යුහමය වෙනස්කම් සිදුවන බවට පෙර ලකුණු පහළ වන්නට විය. ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන වර්ධන උපනතීන්ටද එමගින් අහිතකර බලපෑම් ඇතිවන බව පෙනෙන්නට විය. 1951 දී මෙරටට පැමිණි ලෝක බැංකු ආර්ථික දූත මණ්ඩලය ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ අතීත ගම්‍යතාව ඒ අයුරින්ම පවත්වාගෙන යාමට නොහැකි බව ප්‍රකාශ කිරීම මේ සම්බන්ධයෙන් දක්විය හැකි නිදසුනකි. කෙසේ වුවත් 1960 ගණන්වල අවසාන භාගය දක්වා වූ නිදහසට පසු යුගයේදී මෙරට අපනයන ව්‍යුහයේ විවිධාංගීකරණයන් උදෙසා හෝ අනාගත අභියෝගයන්ට මුහුණ දීම සඳහා නව නිෂ්පාදනයන් සමඟ සූදානම් වීමට හෝ කිසිදු පියවරක් නොගැණින. මෙම කාලය මුළුල්ලේ සංවර්ධන ප්‍රතිපත්තියෙහි වැඩි අවධානයක් යොමු කරන ආනයන ආදේශනය නොහොත් දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය කෘෂිකර්මය සහ කර්මාන්ත සංවර්ධනය කෙරෙහිය. ඒ දෙකෙහි ව්‍යාපෘතියක් මගින් අපනයන වෙළඳාමේ අහිතකර උපනතීන් මධ්‍යයේ වුවද දේශීය ආර්ථිකයේ සතුටුදායක වර්ධන තත්ත්වයන් පවත්වාගෙන යා හැකි යැයි එවක බලාපොරොත්තුව විය. 1960 ගණන්වල අග භාගය වනවිට ආනයන ආදේශන සංවර්ධන උපායය බිඳ වැටෙන ඉමට ළඟා වී තිබින. මුලදී ඇතිකරගත් බලාපොරොත්තු සුන් කරමින් අලුතින් ස්ථාපිත කරන ලද කර්මාන්ත අංශය ආර්ථිකය වඩාත් සම්ප්‍රදායික අපනයන මත යැපීමට සලස්වන ලදී. මෙම කර්මාන්ත බොහෝ සෙයින් ආනයනික යන්ත්‍ර සූත්‍ර සහ අමුද්‍රව්‍ය මත පදනම් වූ අතර ඒවායේ එකතු කළ අගය හා තථ්‍ය විදේශීය විනිමය ඉපැයුම් සැළකිය නොයුතු තරම් විය. තත්ත්වය මෙසේ තිබියදී සම්ප්‍රදායික

යක්. ගතවූ වසර කීපය තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන පිරිවැය නොනැවතී ඉහළ නැග තිබීමෙන් භාණ්ඩයේ මිල ඉහළ යැමට පමණක් නොව නිෂ්පාදකයන්ගේ හා කර්මාන්ත කරුවන්ගේ ලාභ තීරුද පටු වීමට හේතුවී තිබේ. ගැටළුව තවදුරටත් උග්‍රවී තිබෙනුයේ බොහෝ නිෂ්පාදනවල ගුණාත්මක අගය සීග්‍රලෙස පිරිහීම නිසාය. මීට අමතරව, නව නිෂ්පාදන හෝ නව වෙළඳපොලවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකියයුතු ප්‍රගතියක් අත්කර ගැනීමට පොහොසත් වී නැත.

මෙම තත්වයට හේතුන්, අසතුටුදායක විනිමය අනුපාත බදු, ගාස්තු හා විෂම පිස්කල් ප්‍රතිපත්ති, ඉහළ පොලී අනුපාත, ණය ලබාගැනීමේ අපහසුකම් ආදී ලාභදායිතාවයට බලපාන සාධකයන්ගේ සිට, වෙහෙසකර ක්‍රියාපරිපාටි හා වෙළඳ පරිචයන්, දුබල කළමනාකාරනය, ව්‍යවසායකත්වය හීනවීම ශිල්පිය හා අලෙවිකරණ දැනුම ප්‍රමාණවත් නොවීම, වෙළඳපොළ තොරතුරු හා වෙළඳපොල ප්‍රවේශය ප්‍රමාණවත් නොවීම සහ අපනයනයට අවශ්‍ය සංවිධානය හා ආයතනික සහයෝගය දුර්වලවීම යන සාධකයන් දක්වා දිවේ. මීටත් අමතරව අර්ථිකයේ අක්‍රියශීලී පිළිවෙල විසින්, පවත්නා කළමනාකරණ දැනුම් සම්භාරය සහ ව්‍යවසායකත්වය අපනයනය හැර වෙනත් ක්ෂේත්‍රයන්ට ඇදීගොස් තිබේ.

ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ නිපදවන්නා, තමා සමඟ තරඟ කරන වෙනත් රටවල අපනයනකරුවන් හා සසඳනවිට එන්ට එන්ටම සිය නිෂ්පාදන වියදම ඉහළ නගින බැවින්, බලශක්ති පිරිවැය වැඩිවීම. ව්‍යාපාර පිරිවැටුම් බදු හා ඉහළ නැවගාස්තු, ඉහළ උද්ධමන වේගය නිසා පිරිවැය කෙරෙහි ඇතිවන සමස්ත බලපෑම හේතුවෙන්, තම නිපැයුමේ තරඟකාරිත්වය හීන වීමට මුහුණ පා සිටී. ජාත්‍යන්තර වෙළඳපොලෙහි තමන්ගේ තත්ත්වය ශක්තිමත් කරගෙන සිටින ආසියානු අසල්වැසියන්ට වඩා දශකයකින් පමණ ප්‍රමාද වී, ශ්‍රී ලංකාව තම අපනයන සංවර්ධන වැඩසටහන දියත් කළබව සලකන විට, අලුත් ශ්‍රී ලංකා අපනයනකරුවාට ආකර්ෂණීය හැඳිනුම් මිලක් වෙළඳපොළ සංවර්ධනය කළයුතු මුල් අවස්ථාවේදීම දීමත්, එම විටම අවම ලාභ තීරුවක් උපයා ගැනීමත් ඔහුට දැරීමට සිදුවන ඉහළ පිරිවැය නිසා අතිශයින් දුෂ්කර වේ.

සාමාන්‍යයෙන් අපනයන සංවර්ධනය සඳහා තවමත් ශ්‍රී ලංකාවේ ආර්ථික පරිසරය





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපනයන ආදායම් දිගින් දිගටම එකම මට්ටමක රැඳී තිබුණු අතර දේශීය කෘෂි කාර්මික ව්‍යාප්තිය තුළින් ලද ආනයන ඉතුරුම්ද ඉතා සුළු විය. මේවායේ තදාසන්න ප්‍රතිඵලය වූයේ ගෙවුම් ශේෂයේ හිඟය දිගින් දිගටම පිරිහීමය. මෙම තත්ත්වය හේතුකොට ගෙන ආර්ථිකයේ වර්ධන ගම්‍යතාව කෙරෙහි අහිතකර බලපෑම් සහිත ආනයන සීමාකරණයන් අනපේක්ෂිත පරිදි පැනවීමට සිදුවිය.

මෙම සිදුවීම් මාලාව, 1960 ගණන්වල මැද භාගයේ සිට, එවකට පැවැති ආනයන ආදේශන ප්‍රතිපත්ති රාමුව ඇතුළත අපනයන විවිධාංගීකරණයක් ඇති කරන අන්දමේ ප්‍රතිපත්ති සංශෝධනයන් කිහිපයක්ම සිදුකිරීම කෙරෙහි නව අවධාරණයක් යොමු කිරීමට හේතුවිය

එවැනි ප්‍රතිපත්තිමය පියවරවලට අණායන තීරු බදු ප්‍රතිදාන ක්‍රමයන් (එනම් අපනයන නිෂ්පාදන උදෙසා ආනයනය කරන ලද යෙදවුම් සඳහා නිශ්චිත තීරුබදු කොටස ආපසු ගෙවීම) 1964 සිට ඇති කිරීමද, පාරිතෝෂික වවුචර ක්‍රමයන් (එනම් තෝරාගත් සම්ප්‍රදායික නොවන අපනයන සඳහා ආනයන හිමිකම් ක්‍රමයන්) 1960දී ද හඳුන්වා දෙන ලද අතර, 1967 දී රුපියල් සියයට 20 කින් අවප්‍රමාණ කරන ලදී. 1968 දී විදේශීය විනිමය හිමිකම් සහතික ක්‍රමය (විවිහිස) (එනම් - සියළු සම්ප්‍රදායික නොවන අපනයන වෙනුවෙන් අතිරේක විනිමය අනුපාතයක් ලබාදීමේ ද්වි අනුපාත විනිමය ක්‍රමය) හඳුන්වාදෙන ලදී.

1970 මැයි මාසයේදී දේශපාලන බලය වෙනතකට යොමුවූයේ වුවද අපනයන සම්බන්ධයෙන් වූ අවධාරණය 1970 ගණන් පුරාම පැවැත්තේය. ඇත්ත වශයෙන්ම 1973 දී ගෙවුම් ශේෂය කෙරෙහි බලපෑම් තීව්‍ර කරමින් බණිජතෙල් මිල ඉහළයාම සහ 1960 ගණන්වල දිගින් දිගටම සිදුවූ විදේශීය ණය ගැනීම තුළින් වර්ධනය වූ ණය සේවා ගෙවීම් බරද හේතුකොටගෙන අපනයන සහ විදේශ විනිමය ආදායම් දියුණු කිරීමේ 1970 ගණන්වල තිබූ අවශ්‍යතාවේ හදිසිය 1960 ගණන්වලදී තිබූ අවශ්‍යතාවට වඩා බෙහෙවින් වැඩිවිය. කාර්මික නිෂ්පාදනය මත පදනම් වූ නව අපනයන අංශයන් පිහිටුවීම සහ සංවර්ධන කිරීමත, සුළු කෘෂිකාර්මික අපනයන සංවර්ධනය කිරීමත් 1972 - 1977 පස් අවුරුදු සැලැස්මේ ප්‍රධාන මූලාංග දෙකක් විය. මෙම අරමුණු සපුරා ගැනීම සඳහා පියවර කිහිපයක් ගැණින. අපනයන සංවර්ධනය මෙහෙය වීමටත්, සම්බන්ධීකරණය කිරීමටත්, මධ්‍යම ආයතනයන් ලෙස ක්‍රියාකාරීවීම සඳහා 1972 දී අපනයන සංවර්ධන මහ ලේකම් කාර්යාලයන් පිහිටුවනු ලැබිණ. මැණික් අපනයනය දියුණු කිරීම සහ නීති විරෝධී මැණික් අපනයනය සංස්ථාපිත මාර්ග ඔස්සේ ගණුදෙනු කරවීමේ අරමු-ණින් යුතුව 1971 දී රාජ්‍ය මැණික් සංස්ථාව පිහිටුවන ලදී.

අළුතින් පිහිටුවනු ලැබූ සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව යටතේ තෝරාගත් සුළු අපනයන බෝග සඳහා නැවත වගාකිරීමේ සහ අලුතින් වගාකිරීමේ ආධාර සලාක ක්‍රම හඳුන්වාදෙන ලදී. මෙම ආයතනික විධිවිධානයන් හැරුණුවිට නව අපනයන දිරිගැන්වීම් ක්‍රමයන් - පරිවර්තන රුපියල් ගිණුම් ක්‍රමයන් (එනම් සම්ප්‍රදායික නොවන ද්‍රව්‍ය අපනයන කරුවන්ට තමන්ගේ අපනයන ආදායම්වලින් එක්තරා ප්‍රතිශතයක් නම් කරන ලද බැංකු ගිණුමකට බැරකළවිට එහි ශේෂය මත සීමා බාධකවලට යටත්වූ ආනයන භාණ්ඩ වුවද ගෙන්වා ගැනීමට හිමිකම් ලැබෙන ක්‍රමයක්) 1971 දී ආරම්භ කරන ලදී. විටින් විට අනුපාතිකය වැඩි කරන අන්දමේ සංශෝධනයන් සහිතව විවිහිස ක්‍රමය ක්‍රියාත්මක විනි. අනුමත අපනයන ව්‍යාපාරවල අපනයන ලාභ අවුරුදු 8 ක් දක්වා බද්දෙන් නිදහස් කිරීම ද ඇතුළු බදු සහන රාශියක්ද විය.

අපනයන විවිධාංගීකරණය කිරීමේ වැඩ පිළිවෙලට කැප වූ රජයේ ප්‍රතිපත්තිය සමග අති'නත ගනිමින් 1972 දී නිකුත් කළ විදේශීය ආයෝජනය පිළිබඳ ධවල පත්‍රිකාව මගින් අපනයන - ආනත සෘජු විදේශීය ආයෝජන සඳහා වරණීය සැලකිලි ප්‍රදානය කරනු ලැබිණ. 1970 ගණන්වල විදේශීය ආයෝජන ප්‍රතිපත්තියේ තවත් වැදගත් ලක්ෂණයක් වූයේ රාජ්‍ය සංස්ථා සහ විදේශීය ව්‍යාපාරික ආයතනවල ප්‍රාග්ධන සාභාගිත්වයෙන් අපනයන ආනත හවුල් ව්‍යාපාර පිහිටුවීමට උනන්දු වීමය. ඉදිරි පියවර ගැනීම සම්බන්ධයෙන් පසු විපරමක් නොකෙරුණුද නිදහස් වෙළඳ කලාපයන්ද පිහිටුවීමේ අදහසක්ද පස් අවුරුදු සැලැස්මේ අපනයන සංවර්ධන යෝජනා අතර විය.

**1977 සිට ප්‍රතිපත්ති ප්‍රතිසංශෝධන**

1960 ගණන්වල අග භාගයේ සිට අපනයන සංවර්ධනය උදෙසාගත් වෑයමේ පැහැදිලි ප්‍රතිඵල පෙනුනේ සම්ප්‍රදායික නොවන අපනයන අංශය සම්බන්ධයෙනි. (කාණ්ඩ අංක 3 බලන්න) කෙසේ වුවත් දිනෙන් දින ඉහළගිය ආනයන වියදමුත්, සාම්ප්‍රදායික අපනයන අංශයේ පසු බෑමත් විසින් තියුණු වූ ගෙවුම් ශේෂ හිඟයේ අසමතුලිතතාවේ විශාලත්වය සමඟ සසඳන කළ අපනයන අංශයේ ලද ප්‍රවර්ධන වේග අනුපාතිකය ඉතා පහළ මට්ටමක පැවැත්තේය. මේසේ හෙයින් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය කෙරෙන් අහිතකර ප්‍රතිඵල සහිතව වුවද මෙම කාලච්-ඡේදය මුළුල්ලේම ආනයන සීමාකරණ සීමා බන්ධනයන් දිගින් දිගටම ක්‍රියාත්මක විනා. 1977 මැයි මස බලයට පත්වූ ආණ්ඩුව ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට සීමාකාරී වෙළඳ ප්‍රතිපත්තිවල සුළු වෙනස්කම් කිරීමෙන් කලක් පවත්නා විසඳුමක් ලද නොහැකි බවත් විසඳුමක් ඇත්තේ පිටතට ඇරුණු විවෘත ප්‍රතිපත්යක් කරා යොමුවුණු මූලික වෙනස්කමක් තුළ බවත් ප්‍රත්‍යක්ෂ කරගෙන තිබින. ආර්ථික වර්-ධනය සහ සංවර්ධන වැඩිදියුණු කරවීම උදෙසා වෙළෙඳපොළ නිදහස් ක්‍රියාකාරීත්වය ප්‍රබල කරවීමත්, ආර්ථිකය ජාත්‍යන්තර වෙළඳ ක්‍රමයට සම්බන්ධ කරවීමත් අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසි ලෙස සලකනු ලැබිණ. 1977 නොවැම්බරයේදී ඉදිරිපත් කළ අයවැය පෙරමනු * ප්‍රාකාශනය මගින් මෙම චින්තනය උද්දීපනය කරන අන්දමේ දැඩි ප්‍රතිපත්තිමය ප්‍රතිශෝධන ප්‍රකාශයට පත් කරන ලද අතර පසුවකදි තවදුරටත් වෙනස්කම් සිදු කරන ලදී.

* Budget

සංවර්ධනය වෙමින් පවත්නා වෙනත් රටවල අත්දැකීම් වලින් ස්ථුට වන්නේ, සතුටුදයක අපනයන ව්‍යාප්තියන් කරා ළඟා වීම බාහ්‍යආනත සංවර්ධන උපායයක ශක්‍යතාව තීරණය කරනු ලබන ප්‍රධාන සාධකය වන බවය. කිසි යම් ඉමකදී විදේශ විනිමය ලැබීම් වර්ධන අනුපාතය ආනයන ඉල්ලුම් වර්ධන අනුපාතයට වඩා ප්‍රමාණවත් අනුපාතයකින් වර්ධනය නොවන්නේ නම්, විදේශ විනිමය වැය මට්ටම විදේශ විනිමය ලැබීම් ප්‍රමාණය තුළ රඳවා ගැනීම උදෙසා ප්‍රමාණාත්මක සීමා බාධක පැනවීමට සිදුවීම නොවැලැක් විය හැකිවනු ඇත. පෞද්ගලික විදේශ ප්‍රාග්ධන ආගමනය සහ විදේශාධාර මගින් වෙළඳ ශේෂ හිඟය පියවීමට හැකි අතර ඒවායේ වර්ධන අනුපාතය අපනයන ඉපැයුම් හි ක්‍රියාකාරිත්වය සමඟ නුදුරු සම්බන්ධකමක් සහිතය. මේ අනුව නව ආර්ථික ප්‍රතිසංස්කරණ යටතේ සමස්ථ සංවර්ධන වැඩසටහනේ ඉහළම ප්‍රමුඛතාව අපනයන සංවර්ධනයට ලබාදෙන ලදී.

ප්‍රතිපත්ති සම්මිශ්‍රණයේ ප්‍රධාන අංගයන් වූ ආනයන භාණ්ඩ බොහෝවක ප්‍රමාණාත්මක පාලනය ඉවත් කිරීම (නිදහස් වෙළඳ කරණය), විනිමය ගෙවීම් වර්ග සමූහයක සීමාකිරීම් බොහෝ දුරට ලිහිල් කිරීම ද්වි අනුපාත විනිමය ක්‍රමය වෙනුවට ඒකීය පාවෙන විනිමය අනුපාතිකයන් ඇති කිරීම



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හා දේශීය ආර්ථිකය මත පනවා තිබූ තහංචි සමූහයක් ඉවත් කිරීම මගින් පෞද්ගලික අංශයෙන් සහභාගිත්වයෙන් යුතුව අපනයන ව්‍යාප්ත කිරීමට හිතකර වාතාවරණයක් ඇති කිරීමට අරමුණු කරන ලදී. නිදසුන් වශයෙන් ආනයන පාලන ඉවත් කිරීම මගින් තරඟකාරී මිල ගණන් මත අපනයන නිෂ්පාදන සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ අමුද්‍රව්‍ය යෙදවුම් ආනයනය කිරීමට ඉඩ සලසනු ලැබිණ. නිදහස් වෙළඳපොළ තරඟකාරී වෙළඳාම ඇසුරින් දේශීය නිෂ්පාදකයින් තුළ අනර්ඝත්වය පිළිබඳ හැඟීම දියුණු කිරීම මගින් විදේශීය වෙළඳපොළ සමඟ තරඟයට මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය වනු ඇත. ව්‍යාපාරික අවශ්‍යතා උදෙසා විදේශ සංචාරක පාලන ලිහිල් කිරීම මගින් විදේශ වෙළඳපොළ පිළිබඳ පර්යේෂණ සහ අලෙවිකරණය දියුණුවනු ඇත.

විනිමය අනුපාතිකය සංශෝධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ රුපියලට තාත්වික විදේශ වටිනාකමක් ලබාදීමෙන් අපනයන වල මිළ තරඟකාරිත්වය වර්ධනය කිරීම සහ ආරක්ෂාකිරීම බලාපොරොත්තු විය. කෙසේ වුවත් ප්‍රාථමික නිෂ්පාදන කිහිපයක් හැරුණු විට වෙනත් අපනයන සම්ප්‍රදයයන් ගොඩනැගී නොතිබූ සහ අත්තයෙන් උරුම වූ දැඩි ආනයන ආදේශන නැඹුරුවක් සහිත රටක පොදු ආර්ථිකයේ වාතාවරණය දියුණු වීම පමණක් අපේක්ෂිත අපනයන තල්ලුවක් ඇතිකර වීමට සමත් නොවනු ඇත. මෙම හේතූන් සැලකිල්ලට ගනිමින් අපනයන සංවර්ධනයෙහි ලා කෙලින්ම බලපැවැත්වෙන ප්‍රතිපත්ති සමූහයක්, ප්‍රතිපත්ති සංශෝධනයේ අත්‍යාවශ්‍ය අංශයක් ලෙස හඳුන්වා දෙනු ලැබින. මෙම පියවර සැකෙවින් පහත සඳහන්වේ.

**(අ) ආයතනික සම්පත් මාර්ග**

අපනයන සංවර්ධනයෙහි ලා ඉහළම දේශපාලන මට්ටමේ කැපවීමක් ලැබෙන බවට සහතික වියහැකි අන්දමේ ප්‍රබල ආයතනික පසුබිමක් නිර්මාණය කරනු සඳහා 1979 දී ජාතික රාජ්‍ය සභාව විසින් අංක 40 දරණ අපනයන සංවර්ධන පනත සම්මත කරන ලදී. අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය යනුවෙන් ප්‍රධාන ආයතන දෙකක් පිහිටුවීම සඳහා මෙම පනතින් ප්‍රතිපාදන යෙදී තිබින.

ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩලයට ජාතික අපනයන සංවර්ධන ප්‍රයත්නය උදෙසා මග පෙන්වීමේ සහ විධාන දීමේ කාර්යය පැවරින. අපනයන සංවර්ධන මහ ලේකම් කාර්යාලය වෙනුවට පිහිටුවනු ලැබූ අපනයන සංවර්ධන මණ්ඩලය අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩලයේ විධායක හස්තය' විය. අපනයන සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳවත් අපනයන සංවර්ධන වැඩ සටහන් සම්පාදනය කිරීම සහ ඒවායේ මෙහෙයුම් අදියරේදී අධීක්ෂණය කිරීමත්, අපනයන සංවර්ධනයේ නොයෙකුත් අංශ සම්බන්ධයෙන් වගකිව යුතු රජයේ ආයතන අතර සම්බන්ධීකරණය කිරීමත් මෙම මණ්ඩලයේ කාර්යයන් වලට ඇතුළත් විය.

**(ආ) අපනයන - ආනත විදේශීය ආයෝජන දියුණු කෙරෙන පියවර**

අපනයන මත රඳාපවත්නා සංවර්ධන උපායයක සාර්ථක භාවය තීරණාත්මක වශයෙන්, දියුණු රටවල වෙළඳපොළට අවතීර්ණවීමට දේශීය කර්මාන්තවලට ඇති හැකියාව මත පදනම්වෙයි. විදේශීය හවුල් ව්‍යාපාර ඇසුරින් ලබාගත හැකි නිෂ්පාදන විශේෂඥතාව සහ අලෙවිකරණය පිළිබඳ නිපුණත්වය මේ සම්බන්ධයෙන් වැදගත් මෙහෙයක් ඉටුකරාවි යයි විශ්වාස කෙරින. මෙම විශ්වාසය මත පිහිටා විදේශ ආයෝජනයට හිතකර වාතාවරණයන් ගොඩනැගීමට පියවර කිහිපයක් ගනු ලැබින. මහ කොළඹ ආර්ථික කොමිසම 1978 දී පිහිටුවනු ලදී. ආයෝජන සංවර්ධන කලාප පිහිටුවා ක්‍රියාත්මක කරවීම, අපනයන ආනත ව්‍යාපෘතිවලට අදල විදේශ ආයෝජන සම්බන්ධයෙන් සම්ප්‍රදයික අකාල්ප ලිහිල් කිරීම, ආයෝජන ආරක්ෂණ ගිවිසුම්වලට එළඹීම සහ ප්‍රධාන ආයෝජන රටවල් සමඟ ද්විත්ව බදු ඝහන ගිවිසුම් සහ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ 157 වන වගන්තිය අනුව එවැනි ගිවිසුම්වල බලය සහතික කරලීම සහ ආයෝජන - උනන්දුව වර්ධනය කරන අන්දමේ ප්‍රචාරණ වැඩ පිළිවෙලත් විදේශයන්හිදී ක්‍රියාත්මක කිරීම මහ කොළඹ ආර්ථික කොමිසමට පැවරුණු කාර්ය භාරයන් අතර විය.

**(ඇ) අපනයනකරුවන්ට බදු සහන**

මුලදී සඳහන් කරන ලද පරිදි සම්ප්‍රදයික නොවන අපනයන ක්ෂේත්‍රයේ නිරත සමාගම්වලට අට අවුරුදු බදු සහනයන් 1972 දී හඳුන්වාදී තිබිණ. කෙසේ වුවත් විස්තෘත පදනම් සහිත සමාගම්වලට පමණක් මෙම සහනය ලබාදීමට ගත් තීරණය හේතුකොටගෙන මෙම සහනය 1976 සිට අක්‍රියව පැවැතිනි. 1978 නොවැම්බර්යේදී හඳුන්වා දෙන ලද බදු ප්‍රතිසංස්කරණවල මූලික අංගයක් ලෙස 1978 නොවැ: 15 දින හෝ ඊට පසුව, සම්ප්‍රදයික නොවන අපනයන සඳහා පිහිටුවුනු ලැබූ සියළුම සමාගම්වලට අවුරුදු පහක නව බදු විරාමයක් සඳහා හිමිකම් කීමට සුදුසුකම් ලබාදෙන ලදී. 1983 අයවැය පෙරමනුවෙන් අවුරුදු පහේ බදු විරාමය අපනයන අංශය සම්බන්ධයෙන් පමණක් 1983. 03. 31 දිනට පසුවත් බලපැවැත්වෙන බව ප්‍රකාශයට පත්කරන ලදී. (මෙම දිනය දක්වා සංචාරක, ආනයන ආදේශන නිෂ්පාදන සහ ඉදිකිරීමේ කර්මාන්ත වැනි ව්‍යාපාරවලටද මීට සමාන හෝ ඊටත් වැඩි වාසි සහගත බදු සහන ලැබී තිබිණ) 1984 අයවැය පෙරමණුවෙන් මෙම සහනය තනි පුද්ගල සහ හවුල් ව්‍යාපාර වලටද ව්‍යාප්ත කරනු ලැබිණ. (සමාගම් වලට අතිරේකව) 1978/1979 බදු වර්ෂයේ සිට සම්ප්‍රදයික නොවන අපනයන සංවර්ධනය හා අදලව ප්‍රචාරක වැය, අලෙවි සංවර්ධන වැය සහ ගමන් වියදම්, බදු ගෙවිය යුතු ආදයම ගණනය කිරීමේදී අඩු කිරීම ක්‍රියාත්මක විය. 1982 අප්‍රේල් සිට ක්‍රියාත්මක වූ පිරිවැය බදු ප්‍රතිදන ක්‍රමය යටතේ අපනයන නිෂ්පාදනය සඳහා ගෙන්වන භාණ්ඩ සහ ද්‍රව්‍ය ආනයන පිරිවැය බද්දෙන් නිදහස් කරන ලදී. මෙම සහනයන්ට අමතරව සම්ප්‍රදයික නොවන කෘෂි අපනයන නිෂ්පාදන සඳහා අපනයන බදු සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම හෝ විශාල වශයෙන් අඩු කිරීමට හෝ පසුගිය හය මස මුළුල්ලේ පියවර ගැනුනි.

**(ඈ) කෝරාගත් නිෂ්පාදන සඳහා විශේෂ අපනයන දිරිගැන්වීම් සහ වෙනත් සහාය**

නිෂ්පාදන සංවර්ධන සහ අපනයන අලෙවිකරණය සම්බන්ධයෙන් අපනයන සංවර්ධන මණ්ඩලයෙන් සැපයෙන විවිධ මූල්‍යමය දිරිගැන්වීම් හා ආධාර, මහ බැංකුවෙන් සැපයෙන අපනයන මූල්‍ය කරන පහසුකම් සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවෙන් සැපයෙන විවිධ රක්ෂණ ක්‍රම මෙම ගණයට අයත්වේ. (කොටුව බලන්න)

**සමස්ථ අපනයන උපනතිය**

1960 – 83 අතරතුර කාලච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ සමස්ථ අපනයන ක්‍රියාකාරිත්වයට අදල දත්තයන් වගුව 1 හි දක්වේ. 1973 දක්වා කාලච්ඡේදය මුළුල්ලේ 1964 සහ 1665 හැරුණුවිට සියළුම වසර වල අපනයන ඉපැයුම් (ප්‍රවර්ථන විශේෂ ගැනුම් හිමිකම්වලින්) 1960 මට්ටමේ වඩා අඩුවිය. (දෙවන තීරුව) එතැන් සිට, ලෝක වෙළඳ භාණ්ඩ උත්පාතය ආරම්භ වීමත් සමගම අනුලෝම උපනතියන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාර්තාගත වෙයි. කෙසේ වුවත් මෙම උත්පාතය අවසන්වීමේ සිට වර්ධන ගමාතාවේ අඩුවීමක් දක්නා ලැබේ. නිදසුන් වශයෙන් 1972 සිට 1977 සියයට 18.5 සමග සසඳන කළ 1978 – 1983 සාමාන්‍ය වාර්ෂික සමුච්චිත වර්ධන සියයට 8.2 කි. ප්‍රවර්ථන සාධක අනුව වර්ධනය විශ්ලේෂණය කිරීම කවර අන්දමින් වුවද නොමග යවන සුළු වන්නේ මෑත අවුරුදු වල වටිනාකම් වැඩියෙන් වැඩි කොටසෙහි ලෝක උද්ධමනයද පිළිබිඹු වන හෙයිනි. හතර වන තීරුවේ ස්ථාවර අපනයන හැසිරීම කිසියම්අයුරක අභව්‍ය රටාවක් පෙන්නුම් කරයි. 1960 ගණන්වල මැද භාගයේ සිට අවුරුදු කිහිපයකදී සුළු වර්ධනයක් හැරෙන්නට මූර්ත අපනයන දර්ශකය අවගමනයක් පෙන්නුම් කරයි.

මේ අනුව අපගේ නිගමනය වන්නේ සමස්ථ අපනයන ක්‍රියාකාරීත්වයෙහි අඛණ්ඩ සීග්‍ර වර්ධනයක් නොවූ බවය.

රටේ බාහිර ගෙවුම් තත්ත්වය පිළිබඳ අංශයෙන් බලනවිට අපනයන ඉපැයීම් (මූර්ත හෝ වර්තන) මට්ටම වඩා වැදගත් වන්නේ අපනයන ඉපැයීම්වල ආනයන ක්‍රය ශක්තියයි. වගුවේ අටවැනි තීරුවේ දී ඇති දර්ශකයෙන් ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයුම්වල ආනයන ක්‍රය * ශක්තියෙහි හැසිරීම පෙන්නුම් කරයි. අධ්‍යයනයට භාජනය වී ඇති කාලය තුළ වසර බොහොම යකදී දර්ශනය අවගමනයක් කරා යොමු වී ඇති අතර මෑත වසරවලදී වාර්ෂික අවගමන අනුපාතිකය සීග්‍රගාමී වී ඇත. 1983 දී ආනයන ක්‍රය ශක්තිය 1960 ගණන්වල ප්‍රමාණයෙන් සියයට 30 ක් පමණක් විය. ආනයන ක්‍රය ශක්තිය තීරණය වන්නේ අපනයන පරිමාව යන වෙළඳ අනුපාතය මගින් පහත වැටෙමින් තිබූ හෝ මන්දගාමී අපනයන මිල තත්ත්වයන් සහිත අවධියක ආනයන මිල ඉහළයාම (1972 තෙල් අර්බුදය එළඹි තැන් සිට) අධ්‍යයනයට භාජනය වන කාලච්ඡේදය මුළුල්ලේ වෙළඳ අනුපාතය තියුණු ලෙස පහත වැටීමට හේතුවිය. අනෙක් අතට අපනයන ධාරිතාව එකතැන රැඳුනේ වේ. මේ සියළු හැසිරීම්වල සමස්ථ ප්‍රතිඵලය වූයේ ආර්ථිකයේ ආනයන ක්‍රය ශක්තිය තියුණු බාදනයකට ලක්වීමය. ශ්‍රී ලංකාවේ ආනයන මිළ ගණන් සම්පූර්ණයෙන්ම පාහෙ ඇයගේ පාලනයෙන් තොර බවත්,

අපනයන මිල ගණන් කෙසේවත් පාලනය කිරීමට ඇයට නොහැකි

වගුව 1

## ශ්‍රී ලංකාවේ සමස්ථ අපනයන ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික දත්ත - 1960 – 83

| වර්ෂය | ප්‍රවර්ථන වි. ගැ. නි. වලින් අපනයන වටිනාකම '000 වි. ගැ. නි. | දර්ශකය | අපනයන ධාරිතාව දර්ශකය | අපනයන ඒකක වටිනාකම 1 දර්ශකය | ආනයන ඒකක වටිනාකම දර්ශකය | වෙළඳ අනුපාත දර්ශකය | අපනයනවල කය ශක්තිය (ආ) |
|---|---|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) |
| 1960 | 384,712 | 100 | 100 | 100 | 100 | 100 | 100 |
| 1961 | 368,923 | 95 | 103 | 94 | 100 | 94 | 95 |
| 1962 | 379,672 | 99 | 141 | 94 | 100 | 94 | 99 |
| 1963 | 363,503 | 94 | 107 | 94 | 111 | 85 | 85 |
| 1964 | 393,952 | 102 | 116 | 94 | 133 | 71 | 77 |
| 1965 | 409,454 | 106 | 121 | 94 | 122 | 77 | 87 |
| 1966 | 357,143 | 93 | 110 | 88 | 122 | 72 | 76 |
| 1967 | 355,042 | 92 | 114 | 81 | 131 | 62 | 70 |
| 1968 | 342,017 | 89 | 117 | 80 | 124 | 65 | 72 |
| 1969 | 322,017 | 84 | 112 | 80 | 133 | 60 | 63 |
| 1970 | 341,681 | 89 | 116 | 80 | 142 | 56 | 62 |
| 1971 | 327,227 | 85 | 113 | 80 | 154 | 53 | 56 |
| 1972 | 296.313 | 77 | 111 | 70 | 140 | 50 | 55 |
| 1973 | 342,988 | 89 | 112 | 73 | 166 | 44 | 54 |
| 1974 | 432,370 | 112 | 97 | 109 | 278 | 39 | 40 |
| 1975 | 466,047 | 122 | 116 | 97 | 308 | 31 | 39 |
| 1976 | 494,856 | 129 | 111 | 98 | 240 | 41 | 54 |
| 1977 | 637,021 | 166 | 102 | 148 | 274 | 54 | 61 |
| 1978 | 674,478 | 175 | 109 | 143 | 270 | 53 | 65 |
| 1979 | 758,697 | 197 | 110 | 153 | 402 | 38 | 49 |
| 1980 | 802,649 | 209 | 108 | 162 | 528 | 31 | 40 |
| 1981 | 891,001 | 232 | 111 | 159 | 657 | 24 | 35 |
| 1982 | 919,234 | 239 | 122 | 144 | 704 | 20 | 34 |
| 1983 | 997,456 | 259 | 118 | 199 | 854 | 23 | 30 |

සටහන : ඒකක වටිනාකම් දර්ශනයන් වි. ගැ. නි. වලින් දන්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ සඳහන් වාර්ෂික සාමාන්‍ය වි. ගැ. නි. – රුපියල්හි විනිමය අනුපාතිකය භාවිතා කරමින් රුපියල් දර්ශක වි. ගැ. නි. වලට පරිවර්තනය කරන ලදී. ජන්ම මූලාශ්‍රයේ 1978 පදනම මත ගොඩනගා තිබූ සියළුම දර්ශක 1960 පදනමට පරිවර්තනය කරන ලදී.

( අ ) ආනයන ඒකක වටිනාකම් දර්ශකයට අපනයන ඒකක වටිනාකම් දර්ශකයේ අනුපාතිකය [ (5)/(6)×100]

( ආ ) ආනයන ඒකක වටිනාකමට අපනයන වටිනාකමේ අනුපාතිකය [ (3)/(6)×100]

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු වාර්තා (අපනයන වටිනාකම් සඳහා)

ආර්ථික විවර්ශන – ශ්‍රී ලංකා මහ බැංකුව (සියලු වෙළඳ දර්ශන සඳහා)





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බවත් රහසක් නොවේ. එසේ වුවද දීර්ඝ කාලීනව අපනයන පරිමාව සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමක පාලනයක් ඇතිකිරීමට ඇයට හැකිය. එබැවින්, ආනයන ක්‍රය ශක්තිය පහළ වැටීම සම්බන්ධයෙන් බාහිර – ලෝක වෙළඳපොල බලවේගයන් වෙතම වරද පැටවීම තර්කානුකූල නොවේ. අපනයන පරිමාව පිළිබඳ මෙම අහිතකර හැසිරීම සම්බන්ධව වගකීමෙන් සැලෙහන කොටසක් අනුගමනය කරන ලද අපනයන ප්‍රතිපත්තියේ ස්වභාවය මත පැවැරිය යුතුය. ආනයන ක්‍රය ශක්තියේ බාදනයෙහි අනිවාර්ය ප්‍රතිඵලය නම් මුළු ආනයන වැය සඳහා අපනයන ඉපැයීම්වලින් ලද දායකත්වය ප්‍රතිශතයේ අඛණ්ඩ පහත වැටීමය. 1970 – 77 ගණන්වලදී රටේ ආනයන වැය ශීර්ෂයෙන් සියයට 90 ක්ම දායකත්වය අපනයන භාණ්ඩවල සාමාන්‍ය ඉපැයීම්වලින් උසුලනු ලැබිණ. මෙම කාලච්ඡේදය තුළ ක්‍රියාත්මක වූ දැඩි ආනයන පාලනයන් සැලකිල්ලට ගත්විට මෙම ඉහළ ප්‍රතිශතය තරමක් නොමග යවන සුළුය. 1977 නොවැ: යේදී ආනයන වෙළඳාමේ සීමා බන්ධන ඉවත් කිරීමෙන් පසු රටේ ආනයන ඉල්ලුම සමග සසඳන කල අපනයන ව්‍යාප්තියෙන් අප්‍රමාණික භාවය ඉතා පැහැදිලි වන්නට විය. නිදසුන් වශයෙන් 1978 දී ආනයනවලින් සියයට 85 ක් පමණ ගෙවුණේ අපනයන ඉපැයුම්වලිනි. ඉන්පසු මෙම ප්‍රතිශතය දිගින් දිගටම පහත වැටුණු අතර එය 1983 දී සියයට 56 ක් විය. ශේෂිත පරතරයෙන් බහුතරය විදේශීය මූල්‍ය කරණ මාර්ග මගින් පියවාගනු ලැබූ අතර එවැනි පියවර 'ණය සේවා ගෙවීම්' (ණය වාරික සහ පොලී ගෙවීම) හේතුකොටගෙන නැවත වරක් ආර්ථිකයේ අනාගත ආනයන හැකියාව කෙරෙහි අනිවාර්ය සෘණ පලපෑමක් ඇති කරනු ඇත. 'ණය සේවා අනුපාතිකය' (ණය සහ පොලී ආපසු ගෙවීම මුළු අපනයන ඉපැයුම්වල ප්‍රතිශතයක් වශයෙන්) 1980 දී 12. 4 සිට 1982 – 83 අතරතුර ලබාගත් විදේශ මූල්‍ය පහසුකම්වලින් වැඩි කොටස (එනම් සාමාන්‍යයෙන් සියයට 85 ක් පමණ) අවුරුදු 3–5 දක්වා කාලයකින් ආපසු ගෙවීම් ආරම්භ විය යුතු දිගු කාලීන ණය විය. (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 1983 පිටුව 92)

මේ නිසා අපනයන පෙරමුණේ විශාල දියුණුවක් සිදු නොවන්නේ නම් ණය සේවා අනුපාතිකය සීග්‍ර ලෙස ඉහළ යනු ඇත. එබැවින් විදේශ ණය ලබා ගැනීමට ඇති අවකාශ සම්බන්ධයෙන් පවතින අනිවාර්ය ආයතනික සීමාවන් සහ ණය සේවා බර සැලකිල්ලට ගත්විට අපනයන සීග්‍රයෙන් දියුණු නොකළහොත් සාපේක්ෂව නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන අතරේ සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමට ශ්‍රී ලංකාවට බලාපොරොත්තු තැබිය නොහැක. (අයවැය කථාව 1983 පිටු 35)

* මෑත වසරවල රුපියලෙහි බාහිර අගය වැඩි උච්චාවචනයන්ට භාජනය වූ බැවින්, රුපියලේ අගයෙන් ප්‍රකාශවන අපනයන සංඛ්‍යා දත්ත අපගේ විග්‍රහය සඳහා සුදුසු නොවේ. එබැවින් මෙම දත්ත ස්ථාවර විදේශ මුදල් වර්ගයකට පරිවර්තනය කිරීම අවශ්‍යය. මේ සඳහා අපයකුට තෝරාගත හැකි ස්ථාවරම විදේශ මුදල් වර්ගය නම් 'විශේෂ ගැනුම් හිමිකම්ය.

* ආනයන ක්‍රය ශක්තිය =

අපනයන වටිනාකම / ආනයන මිල

= අපනයන ධාරිතාව X අපනයන මිල / ආනයන මිල

= (මෙහි අපනයන මිල / ආනයන මිල යනු වෙළඳ අනුපාතයයි)

= අපනයන ධාරිතාව × වෙළඳ අනුපාතය

## ලෝක වෙළඳාමේ ශ්‍රී ලංකාව සතු කොටස

සමස්ත ලෝක තත්වයෙහි ලා සලකන කල පෙනියන පැහැදිලි ලක්ෂණයක් නම් ලෝක අපනයනයන් මෙන්ම ඛණිජ තෙල් නිෂ්පාදනය නොකරන සංවර්ධනය වෙමින් පවත්නා රටවල මුළු අපනයනයන්හි ශ්‍රී ලංකාවේ අපනයනවලට හිමි පංගුව දිගින් දිගටම අඩුවෙමින් පැවතීමයි. ලෝක අපනයන (ඩොලර් මිල අනුව) 1960 සහ 1970 අතරතුර සියයට 146න්ද 1970 සහ 1981 අතරතුරු සියයට 475 කින්ද වැඩියාම සිදුවූවද ශ්‍රී ලංකාවේ අපනයන සම්බන්ධයෙන් 1960 සහ 1970 අතරතුර සියයට 17 ක සෘණ වර්ධනයක්ද 1970 – 81 අතරතුර එතරම් සතුටුදයක නොවන සියයට 210 ක වර්ධනයක්ද වාර්තා වී ඇත.

මෙම ප්‍රතිඵල අනුව ලෝක අපනයනයන්හි ශ්‍රී ලංකාවේ පංගුව 1960 තිබූ සියයට 0.355 සිට 1970 දී සියයට 0.120 දක්වාද 1981 දී සියයට 0.057 දක්වා ද පහත වැටී ඇත.

1970 – 1981 අතරතුර කාලයේ ලෝක අපනයන සියයට 475 කින් වර්ධනය වූ අතර ඛණිජ තෙල් නිෂ්පාදනය නොකරන සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සියයට 553 කින් වර්ධනය විය. මේ අනුව දෙවනුව සඳහන් කළ වර්ගයේ රටවල් අපනයන පංගුව 1971 දී සියයට 15 කින් ද 1981 දී සියයට 18 කින්ද වර්ධනය විය. ඉතා පැහැදිලිව පෙනෙන ලක්ෂණය නම් ශ්‍රී ලංකාවට දිගින් දිගටම කණ්ඩාමක් වශයෙන් ගත්කළ ඛණිජ තෙල් නිෂ්පාදනය නොකරන සංවර්ධන වෙමින් පවත්නා රටවල්වලට පසු පසින් සිටීමය. නිදසුන් වශයෙන් මෙම කණ්ඩායමේ මුළු අපනයනවල ඇයගේ පංගුව 1950 තිබූ සියයට 1.864 සිට 1970 දී 0.735 දක්වා ද 1981 දී 0.328 දක්වා ද පහත වැටුණි. ඇයගේ ප්‍රධාන අපනයන අයිතම දෙකක් වන තේ සහ රබර්වලට ඉතා වාසි සහගත වෙළඳපොල මිලක් ලැබූ 1974 – 77 කාලච්ඡේදය තුළදී වුවද ශ්‍රී ලංකාව ඇයගේ සාපේක්ෂ තත්ත්වය සම්බන්ධයෙන් සැලකියයුතු දියුණුවක් පෙන්නුම් නොකළ බව සිත තබා ගැනීම වටී.

## අපනයන වර්ධන රටාව

යට සඳහන් කරුණු ඇසුරින් එළඹිය හැකි නොඅනුමාන නිගමනය නම් ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ සමුච්චිත ක්‍රියාකාරිත්වය අධ්‍යයනයට භාජනය වන කාලච්ඡේදය තුළ එක් අතකින් ඇගේ ආනයන අවශ්‍යතාවලට කිසිසේත් නොපැහුන අතර අනිත් අතින් සමස්ත ලෝක අපනයන ක්‍රියාකාරිත්වය අනුව බලනවිට දැඩි පසුගාමී ස්වභාවයක් දක්වූ බවය. සතුටුදයක සහ අසතුටුදයක වර්ධනයන් පෙන්නුම් කළ අපනයන අයිතම කවරේදැයි හඳුනා ගැනීම සහ නිරීක්ෂණයට භාජනය වූ සමස්ථ රටාවට මෙම එක් එක් අයිතම කවර නම් දායකත්වයක් දරණ ලද දැයි අවබෝධ කර ගැනීම සඳහා අපි දැන් අපනයන ව්‍යුහය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක යෙදෙමු.

විශ්ලේෂණය සඳහා අවශ්‍ය දත්තයන් යන් වගු 3 සහ 4 හි සම්පිණ්ඩනය කෙරේ. මෙම වගු ගොඩනැගීමේදී 1965 – 81 දක්වා සමස්ථ කාලච්ඡේදය, අපනයන රටාව කෙරෙහි බලපැවැත්වූ මෑත කාලීන ප්‍රතිපත්තිමය වෙනස්කම්වල බලපෑම උද්දීපනයවන අයුරින් උපකාලච්ඡේද තුනකට බෙදා ඇත. වගු 3 ප්‍රවර්ථන 'විශේෂ ගැනුම් හිමිකම්' අගය මත පදනම් වී ඇත. විවිධ වෙළඳ භාණ්ඩ හරහා දිවෙන ලෝක උද්ධමනයේ බලපෑම හේතුවෙන් ප්‍රවර්ථන වටිනාකම් සංඛ්‍යාමත පදනම්වූ විග්‍රහයකින් විකෘති අර්ථකතනයක් ඇතිකරලීමට මග පැදීමේ අවදානම ඇත. එබැවින් ප්‍රවර්තන මිල වර්ධන අනුපාත, අංක 4 වගුවෙහි දී ඇති ස්ථාවල මිල (මූර්ත) වර්ධන අනුපාත මගින් ඌන පූර්ණය කරනු ලැබේ.

## වගුව 2

### ලෝක තත්ත්වයෙහි ලා ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාකාරිත්වය

| වර්ෂය | භාණ්ඩ අපනයනය (ඇ. ඩො. '000) | | | ශ්‍රී ලංකාවේ පංගුව | | ලෝක අපනයනයන්හි |
|---|---|---|---|---|---|---|
| | ලෝකය | තෙල් නොනිපදවන සංවර්ධනය වන රටවල් | ශ්‍රී ලංකාව | ලෝක අපනයනය තුළ | තෙල් නොනිපදවන සංවර්ධනය වන රටවල් | තෙල් නොනිපදවන රටවල කොටස* |
| 1950 | 57,420 | 17,591 | 328 | 0.566 | 1.864 | 30.371 |
| 1955 | 85,520 | 21,380 | 407 | 0.476 | 1.903 | 25.000 |
| 1960 | 115,520 | 24,676 | 111 | 0.355 | 1.665 | 21.356 |
| 1965 | 168,000 | 32,027 | 409 | 0.243 | 1 277 | 19.063 |
| 1966 | 184,600 | 34,720 | 357 | 0.193 | 1.028 | 18,808 |
| 1967 | 197,700 | 35,239 | 348 | 0.176 | 0.987 | 11,824 |
| 1968 | 216,200 | 37,686 | 342 | 0.158 | 0.907 | 17.432 |
| 1969 | 247,800 | 42,275 | 322 | 0.129 | 0.761 | 17.060 |
| 1970 | 284,800 | 46,519 | 342 | 0.120 | 0.735 | 16.334 |
| 1971 | 319,700 | 48,777 | 344 | 0.107 | 0.705 | 16.257 |
| 1972 | 378.800 | 58,244 | 337 | 0.088 | 0.578 | 15.376 |
| 1973 | 527,400 | 84,672 | 410 | 0.077 | 0.484 | 16.055 |
| 1974 | 779,700 | 121,479 | 527 | 0.067 | 0.433 | 15.580 |
| 1975 | 804,600 | 118,568 | 566 | 0.070 | 0.477 | 14.736 |
| 1976 | 916,700 | 139,478 | 570 | 0.062 | 0.408 | 15.215 |
| 1977 | 1041,500 | 164,7272 | 753 | 0.072 | 0.457 | 15.816 |
| 1978 | 1199,800 | 188,084 | 845 | 0.070 | 0.449 | 15.676 |
| 1979 | 1524,100 | 245,095 | 981 | 0.064 | 0.400 | 16.081 |
| 1980 | 1868,300 | 312,021 | 1,074 | 0.057 | 0.344 | 16.701 |
| 1981 | 1837,200 | 323,832 | 1,065 | 0.057 | 0.328 | 17.626 |

* තෙ. නොනි. සං. රටවල් – තෙල් නොනිපදවන සංවර්ධනය වන රටවල්.

මූලාශ්‍රය : ජා. මූ. අ. ජාත්‍යන්තර මූල්‍ය සංඛ්‍යාලේඛන, ජාත්‍යන්තර වෙළඳාම පිලිබඳ අතිරේකය – 1982

පොල් අතුරු නිෂ්පාදන, කුළුබඩු සහ අත්‍යවශ්‍ය තෙල් හා දිගු අපනයන ඉතිහාස යක් ඇති පාරිභෝගික ද්‍රව්‍ය, වැනි දේවල් වලට හිමිවූයේ ඒවා අයත්වන සමස්ත කාණ්ඩයට හිමි සාමාන්‍ය වර්ධන අනුපාතික යට වඩා මදක් අඩු අනුපාතිකයි. මේ හැම කාණ්ඩයක්ම මූර්ත ඉපැයුම් වර්ධන අනුපාතිකයන් උප කාලපරිච්ඡේද තුනේදීම ධන අගයෙන් යුක්තවිය. කෙසේ වුවද වර්ධන අනුපාතිකයක් නොකඩවාම වැඩි දියුණු වූයේ "වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන" සම්බන්ධයෙන් පමණකි. පොල් අතුරු නිෂ්පාදන සහ කුළුබඩු සඳහා 1978-82 අතර කාලයේ වර්ධන අනුපාතිකය 1970 - 77 අතර කාලයේ එම වර්ධන අනුපාතිකයට වඩා අඩුවිය.

ඛණිජ නිෂ්පාදන අපනයනද මෑත අවුරුදු කිහිපය තුළදී බෙහෙවින් අසතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කර ඇත. මෙම වර්ගයට අයත් භාණ්ඩ අපනයනයෙන් ලැබූ වි. ගැ. හි. ආදායම 1970 - 77 අතර කාලයේ සියයට 65.7 ක සාමාන්‍ය වර්ධන අනුපාතිකයක් පෙන්නුම් කළේය. 1978 82 අතර කාලයේදී මෙම අනුපාතය සියයට 2.8 දක්වා පහල වැටුණේය. එම කාල පරිච්ඡේද දෙක සඳහා මූර්ත වර්ධන අනුපාතික පිලිවෙලින් සියයට 53.1 සහ සියයට -20.5 විය. මෙම අසතුටුදායක තත්ත්වයට බෙහෙවින්ම බලපෑවේ මැණික් අපනයනයෙන් ලැබූ ආදායම ප්‍රබල ලෙස පහල වැටීමයි. මැණික් අපනයන ආදායම ශ්‍රී ලංකාවේ ඛණිජ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් ලබන ආදායමෙන් සියයට 80ක් පමණ වෙයි. 1970 - 77 අතර කාලයේදී සියයට 62. 1 ක වර්ධන අනුපාතිකයක් තිබුණු මෙම ද්‍රව්‍යයෙහි අපනයන ආදායම (වර්තන මිල අනුව) 1978 - 82 අතර කාලයේදී සියයට 22.5 දක්වා පහත වැටුණි.

සාම්ප්‍රදයික නොවන ප්‍රාථමික භාණ්ඩ අපනයනය සමඟ සසඳන විට කාර්මික භාණ්ඩ අපනයනය 1970 ගණන්වල මුල් භාගයේ සිටම සෑහෙන තරම් ඉහළ මට්ටමක වර්ධන අනුපාතිකයක් දක්වා ඇත. 1970 – 77 අතර කාලයේදී වි. ගැ. හි. දස ලක්ෂ 40 ක වාර්ෂික සාමාන්‍ය අගයක් පැවති මෙම අපනයන 1978 – 82 අතර කාලයේදී වි. ගැ. හි. දස ලක්ෂ 233.5 දක්වා ඉහළ ගියේය. එම කාලපරිච්ඡේද දෙකේ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය පිළිවෙලින් සියයට 78.2 සහ සියයට 32.21 ක් විය. සිදුවී ඇති මෙම වෙනසට තුඩු දී ඇති එක් හේතුවක් වී ඇත්තේ 1972 සිට ගුවන්යානවලට ඉන්ධන සැපයීමෙන් ලැබූ අපනයන ඉපැයීම්, භාණ්ඩ අපනයන ලෙස නැවත වර්ග කිරීමයි. ඊට පෙර එම ඉපයීම් වර්ග කරන ලද්දේ සේවා ඉපයීම් යටතේය. මේ නිසා අපනයන ඉපයීම් සමස්ථයක් වශයෙන් ගත්විට වැරදි අවබෝධයක් ඇතිවිය හැකිය. එම වසරෙහි සිට 1981 දක්වාම නිමි භාණ්ඩ අපනයනයෙන් සියයට 50 සිට 70 දක්වා ප්‍රමාණයක් ආවරණය වූයේ ගුවන්යානා තෙල් අලෙවියෙනි. (1,981 න් පසු ඇඟලුම් නිෂ්පාදන ප්‍රමුඛස්ථානයට පත් වී ඇත.) එහෙයින් නිෂ්පාදන භාණ්ඩ අපනයනය පුළුල් වූ අයුරු නිසි ලෙස විශ්ලේෂණය කිරීමේදී ගුවන්යානා තෙල් අලෙවිය මුළු අපනයන ආදායමෙන් බැහැර කොට සැලකීම වඩාත් යෝග්‍යය. මෙසේ සංශෝධනය කළවිට 1970 – 77 සහ 1978 82 යන කාලපරිච්ඡේද දෙක සඳහා සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතික පිලිවෙලින් සියයට 51.7 සහ සියයට 53.4ක් වෙයි. නිරපේක්ෂ වශයෙන් 1970 – 77



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සලසා දී ඇති අපනයන දිරිගැන්වීම් හා වෙනත් ආධාර

1980 දී එය ආරම්භ කළ දවස්වාසේ සිට ඉකුත් සිව වසර තුළ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද දේශීය අපනයන කර්මාන්තවලට ආධාරයක් වශයෙන් පුළුල් ප්‍රතිපත්ති ගොනුවක් සකස් කොට ක්‍රියාවට නංවා ඇත. විශේෂිත අපනයන දිරිදීමනා මෙන්ම අපනයනිකයන් විසින් මුහුණ පාන්නාවූ අනෙකුත් අදාල ගැටළු සහ සැපයීම් බාධක ඉවත් කිරීම ඉලක්ක කොට ගත් විවිධ පියවර මෙකී සාමූහික ප්‍රතිපත්ති ක්‍රියාදාමයට ඇතුළත් ව තිබේ.

## 1. අපනයන දිරි දීමනා :

### (අ) ආනයන තීරුබදු ප්‍රතිධානය

සීමිත දේශීය සම්පත් පදනමක් ඇති රටක කාර්මික නිෂ්පාදන අපනයන ප්‍රසාරනය කිරීම සඳහා පැවැතියා වූ පූර්ව අවශ්‍යතාවයන්ගෙන් එකක් වනුයේ 'ලෝක වෙළඳපල මිල ගණන්වලට' ආනයනික අමු ද්‍රව්‍ය මිලයට ගැනීමෙහි ලා අවකාශ තිබීමයි. දනට මෙම පූර්ව අවශ්‍යතාවය සිරිමසනු වස් අ. සං. ම. විසින් ප්‍රතිසත්තිමය ක්‍රියාමාර්ග දෙකක් යොදා ගනු ලැබ ඇත. ''බන්ධිත නිෂ්පාදන ක්‍රමය'' (ශිවිසුම්ගත නිෂ්පාදන ක්‍රමය) සහ තීරු බදු ප්‍රතිධානය මෙම ක්‍රියාමාර්ග දෙකයි.

ආනයන තීරු බදු ප්‍රතිධානය (Import Duty Rebate)

බන්ධිත නිෂ්පාදන (Manufacture-in-bond)

ආනයන තීරු බදු ප්‍රතිධානය යන්නෙන් අදහස් කෙරෙනුයේ ආනයනික අමු ද්‍රව්‍ය භාවිතයට ගනිමින් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අපනයනය කරනු ලැබීමෙන් පසු ආනයනික අමු ද්‍රව්‍ය මත මුලදී ගෙවන ලද ආනයන බදු ප්‍රතිපූරණය කිරීමයි. මෙම අපනයන දිරිගැන්වීම් ක්‍රමය ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ හඳුන්වා දෙනු ලැබුවේ 1964 ජූනි මස 01 වැනිදය. මෙකී ආරම්භක ක්‍රමය මුල්වරට ක්‍රියාත්මක කරනු ලැබුවේ රේගු දෙපාර්තමේන්තුව විසින් වන අතර එකිලා යොදා ගන්නා ලද ආකූල - පීඩාකාරී පරිපාලන ක්‍රියාපටිපාටිය නිසා එම ක්‍රමය අක්‍රිය තත්ත්වයට පත්විය. මේ නිසා ප්‍රතිශෝධිත ක්‍රමයක් කර්මාන්ත අමාත්‍යාංශයේ මෙහෙයීමෙන් 1969 දෙසැම්බර් මාසයේදී ක්‍රියාත්මක කරන ලදී. එම ප්‍රතිශෝධනයත් සමගම මෙම ක්‍රමය අපනයන දිරිගැන්වීම් මාර්ගයක් වශයෙන් ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයෙහි වැදගත් තැනක් ගත්තේය. කෙසේ වුවද, ලේඛනමය අවශ්‍යතාවයන් තවදුරටත් ආකූල - පීඩාකාරී තත්ත්වයෙන් පැවැති අතර, තීරුබදු ප්‍රතිධාන අනුපාත නිශ්චය කිරීම සහ ඉල්ලුම්පත් අනුමත කිරීම සම්බන්ධයෙන් සෑහෙන ප්‍රමාදයන් ඇතිවිය. 1980 දී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානය මාර්ගයෙන් (ITC) මාර්ගෝපදේශකත්වය යටතේ මෙම ක්‍රමය ප්‍රතිශෝධනය කොට වඩා හොඳින් සකස් කරන ලදුව එය ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපත්ති හා ක්‍රම සම්පාදන අංශයේ පරිපාලනයට යටත් කෙරිනි.

මෙම ප්‍රතිශෝධිත ක්‍රමය කාර්යක්ෂමතාවය හා ඉල්ලුම්පත් තෝරා බේරා ගැනීමේ කඩිනම් බව අතින් සැලකියයුතු දියුණුවක් පෙන්නුම් කෙරෙන අතර, ඒ යටතේ තීරුබදු ආපසු ගෙවීම වාණිජ බැංකු පද්ධතිය පදනම් කොට ගෙන සිදුවෙයි. නව ක්‍රියා පටිපාටිය යටතේ ආනයනික යෙදවුම් සඳහා තීරු ගාස්තු ගෙවීම නියමිත වාණිජ බැංකු විසින් අපනයනිකයින් වෙනුවෙන් බැංකු සහතික රේගු දෙපාර්තමේන්තුවට නිකුත් කරනු ලැබේ. එබඳු බැංකු සහතික පත් හේතුකොට ගෙන බදු සහන ඉල්ලුම් බේරුම් කරන තුරු අපනයනිකයා විසින් තීරු ගාස්තු ගෙවීම වලකාලයි.

ආරම්භයේදී (එනම් 1984) අපනයන තීරුබදු ප්‍රාග්ධන යෝජනා ක්‍රමය යටතේ සහන ලැබීමට හිමිකම් ඇත්තා වූ කාර්මික නිෂ්පාදන ගණන 33 ක් විය. එසේ වුවද, අත් ආනයනික යෙදවුම් ප්‍රයෝජනයට ගනු ලබන සෑම අපනයන නිෂ්පාදනයක්ම පාහේ මෙම තීරු ගාස්තු සහනවලට හිමිකම් ලබයි. මෙම ක්‍රමය සම්බන්ධයෙන් සිදුකර ඇති අලුත්ම වෙනස නම්, නිදහස් වෙළෙඳ කලාපයේ නිෂ්පාදකයින්ට දේශීය නිෂ්පාදකයින් විසින් අලෙවි කරනු ලබන භාණ්ඩ අදාලව ආනයන තීරු බදු ප්‍රතිධාන සලසාදීමයි. (මෙම වරප්‍රසාදය ලැබෙන්නේ අලෙවියෙන් ලබන මුදල විදේශ මුදලින් ලබාගතහොත් පමණි)

යෝජනා ක්‍රමයෙහි කාර්යක්ෂමතාවය සහ නිෂ්පාදිත අපනයන භාණ්ඩවල ව්‍යාප්තිය පෙන්නුම් කරමින් මෙම ක්‍රමය යටතේ සිදුකළ වාර්ෂික ගෙවීම් ප්‍රමාණය මෑත වර්ෂවල සීඝ්‍ර වැඩිවීමක් සටහන් කොට ඇත. 1983 දී මුළු ගෙවීම් ප්‍රමාණය රු. මිලියන 836 ක් විය. එය සංසන්දනාත්මකව ගත් කල 1982 දී රු. මිලියන 783 ක් වූ අතර, 1981 දී රු. මිලියන 500 ක් විය. 1983 දී කරනු ලැබූ ගෙවීම්වලින් සියයට 48 ක් නිමකළ ඇඳුම් අපනයනය සඳහා විය. ගත් බෑග් සහ තේ පැකට් (සියයට 47) මුහුදු ආහාර (සියයට 1.5) ටින් කළ පලතුරු යුෂ (සියයට 1)'ක් වශයෙන් විය.

### (ආ) බන්ධිත නිෂ්පාදන ක්‍රමය

අපනයන සංවර්ධන මණ්ඩලයේ නිර්දේශය මත රේගු දෙපාර්තමේන්තුව විසින් 1982 දී මෙම ක්‍රමය හඳුන්වා දෙන ලදී. මෙහි අරමුණ වූයේ නිමකළ භාණ්ඩයේ කොටසක් වශයෙන් සියයට සියයක් ප්‍රති අපනයනය සඳහා වන අමු ද්‍රව්‍ය, අමතර කොටස්, ඇසුරුම් කිරීමේ සහ ප්‍රවාහක අමුද්‍රව්‍ය, අපනයනිකයන් විසින් තීරු ගාස්තුවලින් නිදහස්ව ආනයනය කරනු ලැබීමට ඉඩ සලසාදීමයි. ආරම්භක දෙවසරේදී, තේ, බෑග්, පෙල්ලම් බඩු හා ක්‍රීඩා භාණ්ඩ වැනි දෑ අපනයනය කළ අපනයනිකයන් ස්වල්ප දෙනෙකු (1983 වසර අවසානට අපනයිකයින් 44 ක් පමණක් වූ සංඛ්‍යාවක්) විසින් මෙම ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන ලදී. 1984 වසර සිට මෙම ක්‍රමය අත්හදා බැලීමේ පදනමක් මත ඔසා නිම කළ ඇඳුම් අපනයනයන් සඳහා ව්‍යාප්ත කරන ලදී.

බන්ධිත නිෂ්පාදන ක්‍රමය ශිවිසුම්ගත ගුදම් ක්‍රමයෙන් ව්‍යුත්පන්න වූවකි. ශිවිසුම්ගත ගුදම් ක්‍රමය යටතේ ආනයනය කරනු ලැබූ ද්‍රව්‍ය ගබඩා කර තිබෙන ගබඩාවේ යතුර රේගු බලධාරීන් වෙත තැබිය යුතු අතර, ගබඩාවෙන් භාණ්ඩ ඉවත් කරගන්නා විට රේගු නිලධාරීන් එහි සිටිය යුතුය. හමුත්, ශිවිසුම්ගත නිෂ්පාදන භාණ්ඩ ක්‍රමය යටතේ ශිවිසුම්ගත භාණ්ඩ තබා තිබෙන්නා වූ ගබඩාවේ පූර්ණ භාරකාරත්වය අපනයනිකයා සතුවන අතර රේගුව විසින් එම භාණ්ඩ පාලනය කරනුයේ චාරික භාණ්ඩ ලේඛනය මගිනි.

### (ඇ) අපනයන දීමනා

නිර්දිෂ්ට අපනයන භාණ්ඩ සඳහා ආදායම් බද්දෙන් නිදහස් මුදල් ආධාර දීමනා ක්‍රමයක් අ. සං. ම. විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එහි අරමුණ වනුයේ, අපනයන වෙළෙඳ පොල ඇසු

පර්යේෂණ කටයුතු, භාණ්ඩ නිරූපණ සහ ප්‍රවර්ධන වශයෙන් ආරම්භයේ දැරිය යුතුවන වියදම්වලින් අඩු තරමින් කොටසක්වත් දැරීමට අපනයනිකයාට උපකාර කිරීමයි. මෙහිලා ආරම්භක ක්‍රමය 1981 ජූනි මාසයේදී 'අපනයන වර්ධන ආධාර ක්‍රමය' (EEGS) යනුවෙන් හඳුන්වා දෙන ලදී. 1983 සැප්තැම්බර් මාසයේදී මෙම ක්‍රමය ප්‍රතිසංස්කරණයට ලක්කොට අපනයන සංවර්ධන ආධාර ක්‍රමය (EDGS) යන නව ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

තොග තේ, තේ පැකට් (ග්‍රෑම් 500 ට වැඩි) රබර් කිරි, පොල්තෙල්, කප්පු පොල් (තොග වශයෙන්), කොප්පරා, මැණික්, මිනිරන්, ඛනිජ වැලි, සැකසූම් නොකළ තුඹ බඩු, කොකෝ, කෝපි සහ යලාණ වශයෙන් නිපදවන ඇහැලුම් හැරුණු විට සෙසු සියලුම වාණිජමය අපනයනයන් මෙම ක්‍රමය යටතේ ආධාර ලැබීමට හිමිකම් ලබයි. යම්කිසි අපනයනිකයෙකු විසින් ආධාරයක් ලැබීමට ඇති හිමිකම නිශ්චය කරනු ලබන්නේ තරුණ දෙකක් පදනම්කොට ගෙනය. ඉන් පළමු වැන්න එනම් 'ශුද්ධ විදේශ විනිමය අන්තර්ගතය' (අපනයනවල නැව්ගත වටිනාකමින් ආනයනික යෙදවුම් භාණ්ඩවල පි. ර. ගැ. වටිනාකම අඩුකොට ලැබෙන අගය) අපනයන ඉපැයීම්වලින් සියයට 70 ට වැඩි විය යුතු වීමයි. දෙවැන්න, ආධාරය පිරිනමනු ලබන්නා වූ වසරේ අපනයන ඉපැයුම් (පි. ගැ. හි වලින්) ඊට කලින් තෙවසරේ සාමාන්‍ය අපනයන ඉපැයුමට වඩා වැඩි විය යුතුය. මෙසේ ආධාර ලැබීමට සුදුසු සුදුසුකම් බව නිශ්චය කළ පසුව, දෙනු ලබන ආධාර මුදලේ ප්‍රමාණය මුළු අපනයන ඉපැයුම්වල ප්‍රතිශතයක් වශයෙන් ගණනය කරනු ලැබේ. 'ශුද්ධ විදේශ විනිමය අන්තර්ගතය' මත රඳා පවතින ආධාරවලට හිමිකම් ඇත්තා වූ එක් එක් වෙළෙඳ භාණ්ඩයට අදාළ වන්නා වූ විකල්ප ආධාර අනුපාත තුනක් වේ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| නැවගත වටිනාකමෙහි ශුද්ධ විදේශ විනිමය ඉපැයුම් ප්‍රතිශතය | ආධාර අනුපාතය % |
| --- | --- |
| අ. 20 සිට 30 | 2 |
| ආ. 30 සිට 60 | 3 |
| ඇ. 60 සහ ඉහළට | 4 |

දනට මුළු ආධාර ප්‍රමාණයම මුදලින් ගෙවනු ලැබේ. 1985 ජෙවිම් වයශර් සිට (ආධාර දීමේ වසර 1984) මුළු ආධාර මුදලින් සියයට 25 ක් පමණක් මුදලින් ගෙවනු ලබනු ඇති අතර ඉතිරි මුදල මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සංවර්ධන සහතික මගින් ගෙවනු ඇත. මෙම සහතික (පොලී රහිතව) පස් අවුරුදු කාල සීමාවකට වලංගු වනු ඇත. ඒවා අ. සං. ම. විසින් අනුමත කරන ලද අපනයන මූලික ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට මුදල් කරගත හැකිය. ආධාර ක්‍රමය යටතේ මුළු ගෙවීම් ප්‍රමාණය 1983 දී රු. මිලියන 129.8 ක් වූ අතර සංසන්දනාත්මකව එය 1982 දී රු. මිලියන 126.9 ක් විය.

## (ඇ) ජනාධිපති අපනයන සම්මාන

ජනාධිපති අපනයන සම්මාන 1981 දී හඳුන්වා දෙන ලදී. ජාතික අපනයන ව්‍යාපෘති ප්‍රයත්නයට අපනයනිකයින් විසින් කරනු ලැබූ දායකත්වයට ජාතික මට්ටමින් උපහාර දැක්වීමේ මාර්ගයක් වශයෙන් මෙම ක්‍රමය ආරම්භ කරන ලදී. සෑම වසරකම තෝරාගත් නිෂ්පාදක ක්ෂේත්‍රවල වඩාත් හැපී පෙනෙන අපනයන කාර්යාවලියක් ඉටුකරන අපනයනිකයින්ට සම්මාන පුදකරන අතර ඔවුන් තෝරාගනු ලබන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාම ලත් විනිශ්චයකාරවරයකුගේ සභාපතිත්වයෙන් සමන්විත වන, අපනයන සංවර්ධන මණ්ඩලය හා ලංකා වෙළඳ මණ්ඩලය මගින් පත් කරනු ලබන, කමිටුවක් විසින් නියමය කරනු ලබන මිනුම් දණ්ඩක් පදනම් කොට ගෙනය. සෑම සම්මානයකටම මුදලින් රු. 1,00,000/- ක ත්‍යාගයක් හිමි වන අතර පිරිනමනු ලබන සම්මාන සංඛ්‍යාව වසරින් වසර වෙනස් වේ. (නිදසුනක් වශයෙන් 1981 දී සම්මාන තුනක් පිරිනමන ලද අතර 1983 දී පිරිනමනු ලැබූ සම්මාන සංඛ්‍යාව 9 කි)

## 2. වෙනත් පියවර :

### (අ) අපනයනිකයින්ගේ සාකච්ඡා සමුළුව :

අපනයනිකයින්ගේ සාකච්ඡා සමුළුව අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන මාසික රැස්වීමකි. වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ඇමතිවරයාගේ සභාපතිත්වයෙන් පැවැත්වෙන මෙම සාකච්ඡා මණ්ඩපයට අපනයනිකයෝ හා අදාල රජයේ දෙපාර්තමේන්තුවල සහ වාණිජ බැංකුවල නිලධාරීහු සහභාගිවෙති. අපනයන කටයුතුවලට අදාල නිශ්චිත ප්‍රශ්ණ සාකච්ඡා කිරීම සඳහා පොදු වේදිකාවක් වශයෙන් මෙම සාකච්ඡා මණ්ඩපය සැලකිය හැකිය. ඉකුත් සිව් වසර තුළ මෙම සාකච්ඡා මණ්ඩපය විසින් අපනයන කාර්ය පත්, පිරිවැටුම් බදු ප්‍රමාණයන්, නැව් ගාස්තු ප්‍රමාණයන්, ආනයන තීරු ගාස්තු සහන ආදිය සම්බන්ධිත ණය පහසුකම්, අදල ප්‍රශ්ණ රාශියක් සාර්ථකව විසඳාලීමට කටයුතු කරන ලදී.

### (ආ) වෙළඳ ගණුදෙනු පහසු කිරීම :

අපනයනිකයින් (ප්‍රධාන වශයෙන් නවකයින්) මුහුණපාන්නාවූ ප්‍රධාන ගැටළුවක් වනුයේ අපනයන ක්‍රියාපරිපාටි හා අපනයන ලේඛණකරණය අදල විවිධ සංකීර්ණතාවයන්ය. මේ සම්බන්ධයෙන් ප්‍රතිශෝධනයන් හා වැඩිදියුණු කිරීම සිදු කිරීම සඳහා විශේෂ උපදේශක කමිටුවක් පෞද්ගලික අංශයේ මෙන්ම අදල රාජ්‍ය ආයතනවලද සහභාගිත්වය ඇතිව අපනයන සංවර්ධන මණ්ඩලයේ මෙහෙයීමෙන් පිහිටුවනු ලැබ ඇත.

### (ඇ) ජාතික භාණ්ඩ ඇසිරීමේ මධ්‍යස්ථානය :

තරඟකාරී වෙළඳපොලවලට ප්‍රවිශ්ෂ වීමෙහි ලා ශ්‍රී ලාංකික අපනයනිකයින්ට මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රධානතම බාධකය භාණ්ඩ ඇසුරුම් ක්‍රමවල පහත් ගුණාත්මක තත්ත්වයයි. මෙම ගැටළුව වටහාගත් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 1983 දී ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (C I S I R) ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානය (N E R D C) ලංකා ප්‍රමිති කාර්යාංශය (B C S) සහ ඇසිරීම පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (S L I P) යන ආයතනවල සහභාගිත්වය ඇතිව ජාතික භාණ්ඩ ඇසිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානයේ කර්තව්‍යය වනුයේ භාණ්ඩ ඇසුරුම් ක්ෂේත්‍රයේ පරියේෂණ කටයුතු, සැලසුම් සංවර්ධන පුහුණුව, ව්‍යුහමය සැලසුම් සම්පාදනය හා රසායනාගාර පහසුකම් සැපයීමයි.

### (ඈ) නිෂ්පාදන සහනාධාර :

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අපනයන සංවර්ධන ප්‍රතිපත්ති පියවර අතරට විශේෂිත පිරිවැය අවාසිවලට මුහුණ පා සිටින අපනයනිකයින්ට හානිපූරක නිෂ්පාදන සහනාධාර සපයාදීම ද ඇතුළත් වෙයි. නිදසුනක් වශයෙන් 1982 දී දේශීය වශයෙන් ලබාගත හැකි සෙන්ට්‍රි-ෆියුජ් රබර් කිරිවල අධික පිරිවැය දරිය හැකි වනු පිණිස යෙදවුම් පිරිවැය සහනාධාර ක්‍රමයක් රබර් භාණ්ඩ නිෂ්පාදකයින් සඳහා මණ්ඩලය විසින් ඇති කරන ලදී. අපගේ එළවළු අපනයනිකයින්ගේ ප්‍රවාහන පිරිවැයවලට සහනාධාරයක් වශයෙන් ද ක්‍රමයක් ක්‍රියාත්මක වෙයි.

### (ඉ) අපනයන නිෂ්පාදන ග්‍රාම වැඩ සටහන :

අපනයන සංවර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම යන ද්විත්ව පරමාර්ථ සාධනය අරමුණු කොටගෙන ග්‍රාමීය මට්ටමින් අපනයන සංවර්ධන ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ අත්හදාබැලීමක් වශයෙන් අපනයන නිෂ්පාදන ග්‍රාම වැඩ සටහන දියත් කර ඇත. මේ යටතේ ප්‍රථම අපනයන සම්පාදක ග්‍රාමය 1984. 07. 11. දින තේ සඳහා බටපොතු ඇසුරුම් නිෂ්පාදනය පෙරටු කොට ගෙන දඹදෙණිය ආසනයේ පජ්ජගම දී පිහිටු වන ලදී. 1984 ජුලි මස අවසානයේ දී අපනයන නිෂ්පාදන ග්‍රාමයන් 21 ක් පිහිටුවා ඇත. ඒ මෙසේය. දඹදෙණිය (තේ සඳහා බටපොතු ඇසුරුම්) යටිනුවර (කුළුබඩු), නව හොරණ (ලී අත්කම්), කටාන (මල්); වාවකවෙට්ටි (තල් නිෂ්පාදන), පුගලාලි - පේදුරුතුඩුව (තල් නිෂ්පාදන), කටුගම්පල (අන්නාසි, බුලත්), බත්තල්ගොඩ (කුරුඳු, කඩල), පාලකුඩා (අමුමිරිස්), කටුවාන (කොහු සහ ලනු), කලාවැව (අමුමිරිස්), වවුනියාව (කඩල), බිංගිරිය (අමුමිරිස්), රත්මලාන - අත්තිඩිය (කුඩා), සාලිය - අශෝකගම (අමුමිරිස්), බලංගොඩ (බෝංචි), ඇඹුල්පුර (ඉන්නල), දෙනිපිටිය (සුදු කොහු), ගම්පහ - අලුත්ගම (සුදු කොහු), හෝමගම (ඉලෙක්ට්‍රොනික එකලස් කර්මාන්ත). රද්දොළුව (කජු).

සෑම අපනයන සංවර්ධන ගම්මානයක්ම පාලනය කරනු ලබන්නේ ග්‍රාමීය නිෂ්පාදකයින්ගේ කොටස් ආයෝජනය සහිතව සමාගම් පනත යටතේ සංස්ථාපිත මහජන සමාගම් මගිනි. වරණීය කොටස් වශයෙන් මූලික ප්‍රාග්ධනය සැපයීම සහ මූල්‍ය, තාක්ෂණික හා වෙනත් පහසුකම් සලසාදීම යන මාර්ගවලින් අපනයන සංවර්ධන මණ්ඩල අපනයන නිෂ්පාදන ග්‍රාමවලට ආධාර දෙයි. එම ගම්මාන වෙනුවෙන් පහත සඳහන් දිරිගැනීම ක්‍රම ද හඳුන්වා දී ඇත.

i. අපනයන සමාගම්වල අලෙවිය ව්‍යාපාර පිරිවැටුම් බද්දෙන් නිදහස් කිරීම.
ii. අපනයනයෙන් ලැබෙන ලාභය සඳහා පස් වසරක බදු විරාමයක්.
iii. අ. සං. ම. විසින් අපනයන අලෙවිය මත සියයට 2 ක මුදල් ආධාරයක් ගෙවනු ලැබීම.

### (ඊ) නිෂ්පාදන හා වෙළඳපොල සංවර්ධනය :

ඉකුත් තුන් අවුරුදු කාල පරිච්ඡේදය තුළ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් තෝරාගත් නිෂ්පාදන භාණ්ඩ ක්ෂේත්‍රවල නිෂ්පාදනය හා වෙළඳපොල සංවර්ධනය පිළිබඳ වැඩ සටහන් පෙළක් ක්‍රියාත්මක කොට ඇත. මෙහිලා තාක්ෂණික සහාය සහ මූල්‍ය අධාර ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය (I T C) සහ ජාත්‍යන්තර සංවර්ධන අධිකාරිය (I D A) වැනි ජාත්‍යන්තර සංවිධානවල සහාය ලබාගෙන ඇත. මෙකී වැඩ සටහන් යටතේ තෝරාගත් නිෂ්පාදකයින්ට සපයාදී ඇති ප්‍රධාන සේවාවන් වනුයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා පුහුණු කිරීමේ පහසුකම්, භාණ්ඩ නිර්මාණය කිරීමෙහි ලා තාක්ෂණික සහාය, තත්ත්ව පාලක පහසුකම්, අලෙවි තොරතුරු ලබා දීම, වෙළඳාම වර්ධනය කිරීමේ ව්‍යාපාර සඳහා මූල්‍ය හා සංවිධාන පහසුකම් ද වේ.

### (උ) අපනයන මූල්‍ය කරණය :

තෝරාගත් අපනයනිකයින් සඳහා සහනදායී මූල්‍යන ක්‍රම දෙකක් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. (අපනයන මූල්‍ය කරණය පිළිබඳ සටහන බලන්න)



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සහ 1978 – 80 අතර සාමාන්‍ය වාර්ෂික වර්ධනය වි. ගැ. හි. දස ලක්ෂ 4.9 සිට වි. ගැ. හි. දස ලක්ෂ 126,0 දක්වා වැඩිවිය. මූර්ත වශයෙන් බණිජතෙල් නොවන කාර්මික භාණ්ඩ අපනයන ආදායම්වල සාමාන්‍යය 1978 – 82 දී සියයට 14.8 ක් වූ අතර 1970-77 අතර කාලයේදී එය සියයට 32.3 ක් විය.

බණිජතෙල් නොවන නිෂ්පාදන අපනයන අතරින් වඩාත් ප්‍රබල ලෙස වර්ධනයවී ඇත්තේ මසා නිමකළ ඇඳුම්ය. 1968 දී ඉතා අඩු මට්ටමකින් එනම්, වි.ගැ.හි. දස ලක්ෂ 0.4 කින් ඇරඹුනු මසා නිමකල ඇඳුම් අපනයන අදල කාලසීමාවන් දෙක තුළදී පිළිවෙලින් සියයට 32.6 හා සියයට 58 ක වාර්ෂික වර්ධනයක් දක්වා ඇත. මෙම අයිතමයෙහි වි. ගැ. හි. අපනයන අගය 1970 දී දස ලක්ෂ 1.3 ක් වූ අතර, 1977දී එය දස ලක්ෂ 13.4 දක්වා සහ 1982 දී දස ලක්ෂ 149.9 දක්වා ද ඉහළ ගියේය. බණිජ තෙල් නොවන අපනයන අංශයෙහි ඊළඟ ප්‍රධාන තැන හිමි වන්නේ මුහුදු ආහාර වලටය. මුහුදු ආහාර අපනයන ආදායම 1970 දී වි. ගැ. හි. දස ලක්ෂ 1.2 ක් වූ අතර 1977 දී එය දස ලක්ෂ 11.3 දක්වාත් 1982 දී දස ලක්ෂ 26.8 දක්වාත් ඉහළ නැගුනේය. කෙසේ වුවද මෑත වසරවලදී මූර්ත වර්ධන අනුපාතිකය ශූන්‍යයට ආසන්න වන අතර, (1978 – 82 කාලයේ සාමාන්‍ය වර්ධන අනුපාතිකය සියයට '0.11 ක් වේ) මෙයින් පැහැදිලි වන්නේ ප්‍රධාන වශයෙන් අපනයන ඒකක මිල වැඩිවීම නිසා අපනයන ආදායමෙහි නාමික වැඩිවීමක් සිදුවී ඇති බවය. සමස්ත වශයෙන් බලන කල 4 වන වගුවෙහි සඳහන් නිෂ්පාදිත අපනයන භාණ්ඩවල වාර්ෂික සාමාන්‍ය වර්ධන අනුපාතිකය සිත් ගන්නා සුළු බව පෙනේ. එහෙත් එක් එක් භාණ්ඩවල වාර්ෂික සංඛ්‍යා ලේඛන වෙනම සමීප ලෙස අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන්නේ වර්ධනය එතරම් සතුටුදායක නොවන බවයි. අඛණ්ඩ ලෙස වාර්ෂික වර්ධනයක් පෙන්වා ඇත්තේ නිෂ්පාදිත රබර් භාණ්ඩ, කොහු කෙඳි වලින් නිපදවූ භාණ්ඩ (ප්‍රධාන වශයෙන් කොහු සහ බුරුසු), පිඟන්භාණ්ඩ සහ පිඟන් ගඩොල් වැනි භාණ්ඩ කිහිපයක් පමණකි.

**අපනයනවල භාණ්ඩ සංයුතියෙහි වෙනස්කම්**

විවිධ භාණ්ඩ වර්ගවල වර්ධනයෙහි වෙනස්කම් හේතුකොටගෙන අපනයන සංයුතියෙහි වෙනස්වීම් හටගෙන ඇති ආකාරය මෙහිදී සාකච්ඡාවට භාජනවෙයි. මීට අදල සංඛ්‍යා තොරතුරු 5 වගුවෙහි

**වගුව 3**

**ප්‍රවර්ථන වි. ගැ. හි. මිල අනුව වාර්ෂික සාමාන්‍ය අපනයන වර්ධන අනුපාතිකය 1965 – 69, 1970 – 77 සහ 1978 – 82**

| | සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය | | |
|---|---|---|---|
| | 1965 – 69 | 1970 – 77 | 1978 – 82 |
| 1 ප්‍රාථමික නිෂ්පාදන | -5.95 | 12.43 | 0.68 |
| 1. 1 සම්ප්‍රදායික කෘෂි නිෂ්පාදන | -6.35 | 6.74 | -1.46 |
| i. තේ | -4.62 | 10.08 | -3.62 |
| ii. රබර් | 4.62 | 11.91 | 3.94 |
| iii. පොල් මද නිෂ්පාදන | 4.40 | 9.42 | 14.74 |
| 1. 2 සම්ප්‍රදායික නොවන ප්‍රාථමික නිෂ්පාදන | 0.32 | 13.81 | 16.02 |
| i. පොල් අතුරු – නිෂ්පාදන | -4.35 | 10.43 | 9.84 |
| ii. කුළුබඩු | 3.60 | 11.37 | 15.32 |
| | 9.37 | 7.32 | 65.23 |
| iii. වෙනත් කෘෂි නිෂ්පාදන | -6.21 | 65.72 | 2.78 |
| මැණික් | -53.93 | 213.65 | 11.66 |
| මිනිරන් | 5.27 | 8.55 | 12.12 |
| වෙනත් | - | 112.52 | 87.54 |
| 2. නිෂ්පාදිත භාණ්ඩ (බණිජ තෙල් නිෂ්පාදන සහිතව) | 9.77 | 78.22 | 32.22 |
| නිෂ්පාදිත භාණ්ඩ (බණිජ තෙල් නිෂ්පාදන රහිතව) | 9.17 | 51.71 | 53.42 |
| 2. 1 ආහාර පාන වර්ග සහ දුම්කොළ | 70.90 | 56.54 | 15.38 |
| 2. 2 රෙදිපිළි ඇඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | 50.20 | 65.21 | 65.64 |
| i. නිමි ඇඳුම් | 58.18 | 62.75 | 65.98 |
| ii. සම්භාණ්ඩ නිෂ්පාදන/පාවහන් | 0.23 | 0.09 | 0.02 |
| 2. 3 රසායන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | -3.17 | 26.81 | 12.78 |
| i. රසායන | -3.17 | 25.23 | 9.14 |
| ii. රබර් භාණ්ඩ | - | 28.35 | 25.32 |
| 2. 4 බණිජ තෙල් නිෂ්පාදන | - | 144.06 | 23.92 |
| 2.5 ලෝහ නොවන බණිජ නිෂ්පාදන (පිඟන් භාණ්ඩ සහ බිත්ති උළු) | -4.92 | 272.28 | 20.74 |
| 2. 6 යන්ත්‍ර සහ උපකරණ | 19.94 | 120.30 | 20.52 |
| 2. 7 වෙනත් නිෂ්පාදන | 5.15 | 39.07 | 110.53 |
| 3. මිශ්‍ර අපනයන | 0.15 | 39.17 | 31.16 |
| 4. මුළු දේශීය භාණ්ඩ අපනයනය ('000 වි. ගැ. හි.) | -5.83 | 9.84 | 7.31 |

සටහන් : අ. සකස් කළ තේ හැර (තේ බෑග් සහ ක්ෂණික තේ)
ආ. සකස් කළ තේ ඇතුළුව (තේ බෑග සහ ක්ෂණික තේ)
ඇ. දත්ත ශ්‍රේණිය ඇරඹෙන්නේ 1968 නි.
ඈ. දත්ත ශ්‍රේණිය ඇරඹෙන්නේ 1970 නි.

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු වාර්තා ඇසුරින් සම්පාදිතය· (වාර්ෂික, ප්‍රකාශන 1965 – 82)





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්වා ඇත. අධ්‍යයනයට ලක්වන මුළු කාලසීමාව තුළදී සාම්ප්‍රදයික අපනයන භාණ්ඩ තුනේම අපනයන එකතුව දිගටම පිරිහීමට ලක්විය. 1970 අග භාගයේ සිට එම පිරිහීම වඩාත් දැඩිවිය. 1982 දී මෙම ප්‍රමාණය සියයට 46 වූ අතර 1978 දී සියයට 72 ක් විය. 1960 ගණන්වලදී එය සියයට 89ක් විය. ඛණිජතෙල් නිෂ්පාදන හැර මුළු අපනයන සඳහා කොටස ගණනය කරන ලද්දේ නම් පිරිහීම බෙහෙවින් අඩු බැව් පෙනෙනු ඇත. එසේ වුවද එයද සැලකිය යුතු ප්‍රමාණයකි. නිදසුනක් වශයෙන් 1982 සඳහා සංශෝධනය කරන ලද සංඛ්‍යාව සියයට 57 ක් වන අතර 1970 – 77 අතර කාලය සඳහා සාමාන්‍යය සියයට 85 කි. 1960 ගණන්වල අග හරියේ සහ 1970 ගණන්වල මුල් හරියේදී සාම්ප්‍රදායික අපනයන භාණ්ඩවල ආදයම් පහළ වැටීමට ප්‍රධාන හේතුව වූයේ අහිතකර මිල ගණන්ය. එතැන් පටන් මෙම නිෂ්පාදනවල අපනයන පරිමාවන් වැඩි නොවී එකම ප්‍රමාණයට දිගින් දිගටම පැවැතීමත්, සාම්ප්‍රදායික නොවන අපනයන (ප්‍රධාන වශයෙන් නිෂ්පාදන භාණ්ඩ අපනයන) වර්ධන අනුපාතික ඉහළ යෑමත් සාධක ලෙසින් බලපෑවේය. මුල් සාධකයෙහි සාපේක්ෂ වැදගත්කම පැහැදිලිකර ගැනීම සඳහා ප්‍රධාන අපනයන භාණ්ඩ තුනෙහි ලෝක වෙළඳ පොළෙහි දයකත්වය 1970 – 71 වසරවල පැවැති සාමාන්‍ය මට්ටමෙහි පැවැතියේය යන උපකල්පනය යටතේ ඇස්තමේන්තු නැවත සකස් කරන ලදී. 1978 – 82 වර්ෂ සඳහා මෙම කල්පිත ඉපයුම්වල ප්‍රතිශතයෙහි වාර්ෂික සාමාන්‍යය සියයට 81 ලෙස දක්නට ලැබුණු අතර, 1960 – 65 අතර කාලයේ සාමාන්‍යයට වඩා (සියයට 89) එය අඩුවූයේ මඳ වශයෙන් පමණකි.

සාම්ප්‍රදයික නොවන ප්‍රාථමික නිෂ්පාදන අතරින් සාපේක්‍ෂ අපනයන ප්‍රතිශතයෙහි අඛණ්ඩ වර්ධනයක් දක්වා ඇත්තේ ''වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන'' නමැති කාණ්ඩය පමණකි. පොල් අතුරු නිෂ්පාදන සහ කුළුබඩුවල ප්‍රතිශතයන් මුළු කාලය තුළම සැලකිය යුතු ස්ථායි තත්ත්වයක් පෙන්වා ඇත. මැණික්වල පැවැති අසතුටුදයක වර්ධන තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපෑ හෙයින් ඛණිජ ද්‍රව්‍ය අපනයට හිමි සාපේක්‍ෂ ස්ථානය බොහෝදුරට පහතවැටී ඇත. 1982 දී සාම්ප්‍රදයික නොවන කෘෂිකාර්මික අපනයනවල ප්‍රතිශතය 18 ක් වූ අතර 1960 දශකයේ අග භාගයේදී එය 10 ක් පමණවිය.

1970 ගණන්වලට පෙර කාර්මික භාණ්ඩ අපනයනය සැලකියයුතු වැදගත් කමක් නොදක්විය. එතැන් සිට වාර්ෂිකව වර්ධනය වෙමින් මෙම භාණ්ඩ මුළු අපනයන තුළ දරන වැදගත්කම මුළු අපනයන ප්‍රමාණයෙන් සියයට 36 (ඛණිජ තෙල් නිෂ්පාදන ඉවත්කළ විට සියයට 26 ක් විය) දක්වා ඉහළ ගියේය. කාර්මික භාණ්ඩ අපනයනයෙන් ලත් ආදයම දිගින් දිගටම ඛණිජ තෙල් නිෂ්පාදන සහ නිමි ඇඳුම් මත දැඩි රැඳියාවක් දක්වා ඇත. අනෙකුත් කාර්මික භාණ්ඩවල එකතුව 1970 මැද භාගයේ සිට සියයට 3 ක්ව පැවැති අතර වාර්ෂිකව වෙනස්කම්ද සිදු විය. 1981 සිට නිමි ඇඳුම් අපනයනය, ඛණිජ තෙල් නිෂ්පාදන අභිබවා ගියේය.

**අපනයන කාර්ය සාධනය කෙරෙහි බලපාන අභ්‍යන්තර හා බාහිර සීමා කිරීම්වල සාපේක්ෂ වැදගත්කම**

ඉහත සංඛ්‍යාතමය විශ්ලේෂණය ඇසුරෙන් එක් එක් වෙළඳ භාණ්ඩ වර්ගවල වර්ධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් බෙහෙවින් අදාලවන ප්‍රශ්ණ දෙකක් පැන නගී.

1. ඇතැම් වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් දක්නට ලැබුණු 'එකතැන පල්වීම' ශ්‍රී ලංකාවට පාලනයකළ නොහැකි අයහපත් ලෝක ඉල්ලුම් තත්ත්වයන්ට අනුකූලව සිදුවන්නක්ද? නොඑසේ නම් එය සැපයුම හා සම්බන්ධ විවිධ සංශෝධක (සීමාකරණ) නිසා සිදුවූවක්ද?
2. වර්ධනයක් පෙන්නුම් කරන ලද අයිතම යන්හි කාර්ය සාධනය පවතින වෙළඳ පොල අවස්ථා සමග සතුටුදයක ලෙස සසඳනු ලැබිය හැකිද? එම අයිතමයන් අපනයනය කරන්නවුන්, ලෝක වෙළඳ පොල අවස්ථාවන්ගෙන් ප්‍රමාණවත් ප්‍රතිලාභ ලබා තිබේද?

වගුව 4

**ස්ථාවර මිල ගණන් (1980) අනුව වාර්ෂික සාමාන්‍ය අපනයන වර්ධන අනුපාතය**

| භාණ්ඩ වර්ගය | වාර්ෂික සාමාන්‍ය වර්ධන අනුපාතය% | | |
|---|---|---|---|
| | 1965–69 | 1970–77 | 1978–82 |
| සම්ප්‍රදයික ප්‍රාථමික නිෂ්පාදන | -1.14 | 1.50 | 1.88 |
| තේ | -2.24 | -0.28 | -0.29 |
| රබර් | 9.69 | 4.94 | -0.01 |
| පොල් මද නිෂ්පාදනය | -5.88 | -3.50 | 28.43 |
| සම්ප්‍රදයික නොවන ප්‍රාථමික නිෂ්පාදන | 2.00 | 7.15 | -6.22 |
| පොල් අතුරු නිෂ්පාදන | 0.53 | 3.69 | 1.36 |
| කුළු බඩු | 3,56 | 18.23 | 3.44 |
| අනිකුත් කෘෂි නිෂ්පාදන | 15.42 | 16.71 | 32.28 |
| ඛණිජ | 3.29 | 53.13 | -20.55 |
| මැණික් | 4.14 | 62.14 | -22.54 |
| වෙනත් | 5.10 | -0.68 | 8.37 |
| නිෂ්පාදිත භාණ්ඩ (ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හැර) | 45.53 | 32.34 | 14.78 |
| ආහාර පාන සහ දුම්කොල | 67.53 | 50.15 | 1.43 |
| මුහුදු (මත්ස්‍ය) ආහාර | 69.92 | 171.79 | 0.11 |
| වෙනත් | 170.00 | 156.38 | 13.94 |
| නිමි ඇඳුම් | | 32.59 | 58.08 |
| වෙනත් නිෂ්පාදිත භාණ්ඩ | 0.02 | 134.10 | 8.61 |
| මුළු අපනයන (ඛණිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන හැර) | -0.75 | 2.25 | -0.61 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු වාර්තා ඇසුරින් සම්පාදිතය. (වාර්ෂික ප්‍රකාශන 1965–82)

විධිය : ස්ථාවර මිල ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා එක් එක් භාණ්ඩ වර්ගයක ප්‍රවර්තන වටිනාකම් ශ්‍රේණි එම වර්ගයට අදලව ගොඩ නගන ලද ඒකක වටිනාකම් දර්ශකයෙන් (ප්‍රවර්ථන වර්ෂයේ බරු අනුව සකස් කළ) අවධමනය කරන ලදී. පදනම් – බරු (ලස් පියර්) දර්ශකය සමග සංසන්දනය කළ විට, ප්‍රවර්ථන – බරු (පාෂේ) දර්ශකය දෙන ලද භාණ්ඩ සම්මිශ්‍රණයක කාලයක් තුළ සිදු වූ වෙනස්කම් ගණන් ගැනීමට උපකාරී වීමේ අතිරේක වාසිය සහිතය.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙම කරුණු පැහැදිලි කරගතහැකි සරලම ක්‍රමය නම් තෝරාගත් අපනයන භාණ්ඩවල ශ්‍රී ලංකාවේ ලෝක වෙළඳ පොල පංගුවෙහි හැසිරීම් රටාව පරීක්ෂා කිරීමයි. අපනයන තත්ත්වයන් අයහපත් වීමට හේතු වූ එකම කරුණ බාහිර සාධක වල බලපෑම නම් හා පවතින වෙළඳපොල අවස්ථාවන් අපනයන කරුවන් විසින් උපරිම ලෙස ප්‍රයෝජනයටගෙන ඇත්නම්, අප රටට එම වෙළඳ භාණ්ඩය පිළිබඳ ලෝක වෙළඳපොලෙහි හිමිවන පංගුව අඩුතරමින් ස්ථාවර මට්ටමක රැඳී තිබිය යුතුය. මෙසේ සිදුවී නොමැති නම්, (එනම් පංගුව පහතවැටී ඇත්නම්) අපනයන කටයුතු අසාර්ථක වීමට හේතු වී ඇත්තේ, රටතුළ පවත්නා ප්‍රතිපත්ති වල සීමිතතා සහ සැපයුම් සංරෝධක බව තීරණය කළ හැකිය.

1976 - 82 අතර කාලය සඳහා තෝරාගත් අපනයන නිෂ්පාදන කිහිපයක ශ්‍රී ලංකාවේ ලෝක වෙළඳපොල් පංගු (ප්‍රතිශතයෙන්) 6 වන වගුවෙන් දක්වා ඇත. සාම්ප්‍රාදයික අපනයනවලින් පටන් ගෙන මෙම දත්ත පිරික්සා බලමු. තේ, රබර්, කපාපු පොල්, කොප්පරා සහ පොල් තෙල් යන වෙළඳ භාණ්ඩ පහම සම්බන්ධයෙන් ඇති වෙළඳපොල කොටස මෙම කලාය තුළදී තදබලලෙස පහතවැටී ඇත. නිදසුනක් වශයෙන් 1976 දී සියයට 34 ක්ව පැවැති තේ සඳහා වූ වෙළඳපොල කොටස 1982 දී සියයට 26 දක්වා පහතවැටී ඇත. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ඉහලම තත්ත්වයක් පැවැති 1965 සංඛ්‍යා සමඟ සසඳන විට මෙම පහත වැටීම වඩාත්ම කැපී පෙනෙයි. එම වසරේ ලෝක තේ වෙළඳාමෙහි ශ්‍රී ලංකාව දැරූ කොටස සියයට 52.5 කි. මෙහිදී ශ්‍රී ලංකාවේ අත්දැකීම අනෙක් සාම්ප්‍රදයික තේ නිෂ්පාදන රටවල් දෙක වන ඉන්දියාව සහ ඉන්දුනීසියාව සමඟ සඳහා බැලීමද යෝග්‍යය. රටතුළ ඉල්ලුම වැඩිවෙමින් පවතින තත්ත්වයක් යටතේ වුවද, මෙම කාලය තුළ ලෝක අපනයනය තුළ තම කොටස සියයට 37 මට්ටමට පවත්වා ගැනීමට ඉන්දියාව සමත්විය. 1970-72 අතර කාලයෙහි සියයට 7 ක් පැවැති ඉන්දුනීසියාවේ අපනයන කොටස 1979-81 දි සියයට 10 දක්වා ඉහළ ගියේය. (දත්ත ලබාගන්නා ලද්දේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ TRADE YEARBOOK නමැති සංග්‍රහයෙනි)

රබර් සම්බන්ධයෙන් අපනයන ප්‍රමාණය පහත වැටීම එතරම් බෙදජනය නොවේ. කෙසේ වුවද සමස්තයක් වශයෙන් ගත්විට

වගුව 5

**වෙළඳ භාණ්ඩ මුළු අපනයන, ආනයන හා වෙළඳ ශේෂය (1953-1983)**
**(ඩොලර් දශලක්ෂ)**

| වර්ෂය | දේශීය අපනයන | මුළු අපනයන | ආනයන | වෙළඳ ශේෂය | ඒ. ජ. ඩො. සමාන රුපියල්වලින් |
|---|---|---|---|---|---|
| 1953 | 312.9 | 329.3 | 337.6 | - 8.3 | (4.7619) |
| 1954 | 361.0 | 379.9 | 293.4 | + 86.5 | " |
| 1955 | 393.1 | 407.4 | 306.5 | + 100.9 | " |
| 1956 | 347.0 | 364.3 | 342.2 | + 22.1 | " |
| 1957 | 333.5 | 353.1 | 378.9 | - 25.8 | " |
| 1958 | 346.8 | 359.2 | 360.5 | - 1.3 | " |
| 1959 | 355.3 | 368.3 | 421.0 | - 52.7 | " |
| 1960 | 372.7 | 384.6 | 411.5 | - 26.9 | " |
| 1961 | 352.9 | 363.9 | 357.7 | + 6.2 | " |
| 1962 | 370.9 | 379.3 | 348.5 | + 30.8 | " |
| 1963 | 357.9 | 363.4 | 315.0 | + 48.4 | " |
| 1964 | 386.7 | 393.9 | 414.6 | - 20.7 | " |
| 1965 | 402.3 | 409.2 | 309.6 | + 99.6 | " |
| 1966 | 352.0 | 357.0 | 425.9 | - 68.9 | " |
| 1967 | 333.3 | 345.4 | 355.3 | - 9.9 | (4.8924) |
| 1968 | 331.8 | 341.9 | 365.1 | - 23.2 | (5.9524) |
| 1969 | 315.0 | 321.9 | 427.3 | - 105.4 | " |
| 1970 | 335.2 | 341.6 | 410.7 | - 69.1 | " |
| 1971 | 337.3 | 340.2 | 356.0 | - 15.8 | " |
| 1972 | 324.2 | 326.7 | 364.5 | - 37.8 | (6.1488) |
| 1973 | 407.1 | 410.5 | 425.8 | - 15.3 | (6.3752) |
| 1974 | 517.0 | 520.7 | 683.0 | - 162.3 | (6.6677) |
| 1975 | 552.1 | 553.6 | 739.1 | - 185.5 | (7.1049) |
| 1976 | 569.8 | 571.4 | 551.3 | 20.1 | (8.4259) |
| 1977 | 743.4 | 746.0 | 675.1 | + 70.9 | (8.8982) |
| 1978 | 844.6 | 846.6 | 941.4 | - 94.8 | (15.60) |
| 1979 | 978.3 | 981.1 | 1448.0 | - 466.9 | (15.58) |
| 1980 | 1046.2 | 1051.9 | 2034.9 | - 983.0 | (16.53) |
| 1981 | 999.4 | 1026.8 | 1806.3 | - 779.4 | (19.67) |
| 1982 | 996.6 | 1015.6 | 1772.9 | - 757.3 | (20.80) |
| 1983 | 1056.3 | 1070.7 | 1786.6 | - 715.9 | (23.52) |



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දක්නට ලැබෙන්නේ පහත වැටීමේ නැඹුරුවකි. නිදසුනක් වශයෙන් 1976 න් පසුව කිසිම වසරකදී 1976 පැවති ප්‍රමාණය වන සියයට 4.4 ඉක්මවා යැමට නොහැකි විය.

පොල් මද නිෂ්පාදන වර්ග තුන සාපේක්ෂ වශයෙන් ඉතාම අසතුටුදයක වර්ධන රටාව පෙන්නුම් කර ඇත. කපාපු පොල් ආනයන ප්‍රමාණය 1976 දී සියයට 35.3ක්ව පැවැති අතර 1982 දී සියයට 22.5 ක් දක්වා පහත වැටුනි. ලෝක කොප්පරා වෙළෙඳ පොලේ ශ්‍රී ලංකාවට හිමි ස්ථානය 1982 වන විට ඉතාම නොවැදගත් තත්ත්වයට පත්වී තිබුනි. පොල්තෙල් වෙළඳ පොලේ හිමි තත්ත්වය ද බෙහෙවින් අස්ථායී ස්වරූපයක පැවැති අතර සමස්ථයක් වශයෙන් ගත්විට ආදල කාලයේදී එය බ්ලවත් ලෙස පහත වැටී ඇති බව පෙනේ.

සාම්ප්‍රදයික අපනයන භාණ්ඩවලින් ලබන අපනයන ආදයම එක තැන පල්වීම සම්බන්ධයෙන් ලෝක ඉල්ලුම් තත්ත්වයට දොස් පැවරීම බෙහෙවින් අයිරුබව මෙම දත්තවලින් පැහැදිලි වෙයි. ඊට හේතු සොයාගත යුත්තේ ශ්‍රී ලංකාවට සිය වෙළඳ පොල තත්ත්වය පවත්වා ගැනීමට බාධක වශයෙන් පැවැති විවිධ සැපයුම් සංරෝධක විග්‍රහ කිරීමක් තුලිනි.

වගුවෙහි දක්වා ඇති සුළු කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ හය අතරින් ලෝක වෙළඳ පොළේ ශ්‍රී ලංකවට යම් වැදගත් ස්ථානයක් හිමි වී තිබෙන්නේ කුරුඳු සහ සුළු වශයෙන් කරාබු නැටිද පිලිබඳ පමණකි. සියළුම කුළු බඩු වර්ග අතරින්, ලෝක පරිභෝජනය ඉහළ යෑම තුලින් ඉතා අඩු වෙන් වාසි ලැබුණේ කුරුඳුවලටය. මීට ප්‍රධාන හේතු දෙකක් තුඩුදී ඇත.

1. ලෝකයේ කුරුඳු පරිභෝජනයෙන් ඉතා විශාල කොටසකට (සියයට 70 ක් පමණ) වගකියන තනි රටවන මෙක්සිකෝවෙහි මෑත වසරවල හටගත් තදබල ගෙවුම් ශේෂ අර්බුදය,

2. මිලෙන් අඩු එහෙත් කුරුඳුවලට අංග සම්පූර්ණ ආදේශකයක් ලෙස සැලකෙන 'කැසියා' නමැති කුළු බඩු විශේෂය ඉතා සීග්‍රයෙන් වෙළඳ පොල තුළ ව්‍යාප්තවීම.

ලෝකයේ කුරුඳු වෙළෙඳාම අතින් ඉහළම තැන ශ්‍රී ලංකාවට ලැබී තිබුණු නමුදු පසුගිය වසර වලදී මෙයින් ලබන අපනයන ආදයම ඉතාසෙමින් වර්ධනයවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වෙළඳ පොලෙහි පැවති මෙම අහිතකර තත්ත්වයය. කරාබු නැටිවල වෙළඳපොල කොටස බෙහෙවින් පහත වැටුණේ අපනයන ආදයම තීරණය කෙරෙන දේශීය සැපයුම් සාධක බලපෑමෙනි. අනිකුත් අයිතම සම්බන්ධයෙන්ද එම කරුණ අදලවෙයි. එපමණක් නොව දනට පවත්නා ලෝක ඉල්ලුම යටතේ වුවද මෙම අනිකුත් අයිතමයන්හි අපනයන පුළුල්කළ හැකි බැව් ඒවායේ වෙළඳපොල කොටස තවමත් ඉතාමත්ම පහත් මට්ටමක පැවතීමෙන් පෙනේ.

බණිජ නිෂ්පාදන සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් අරුත්බර සැසඳීමක් කිරීම සඳහා ලෝක වෙළඳපොල දත්ත සපයාගත නොහැකිය. කෙසේ වුවද එම වෙළඳ ද්‍රව්‍යවල අපනයන කටයුතු අසතුටුදයක ලෙස වර්ධනය වීම සම්බන්ධයෙන් ලෝක ඉල්ලුම් තත්ත්වයට දොස්පැවැරීම ඉතා දුෂ්කර බවට සාක්ෂි ඇත. 'ආර්ථික විමසුම' සඟරාවේ. 1982 අගෝස්තු කලාපයේ පළවූ සිත් ගන්නා සුළු ලිපියක 1972–77 අතර කාලයේ වාර්තාගත ලෙස මැණික් අපනයනය වැඩිවීමටත්, ඉක්බිතිව එය පහළ වැටීමටත්, හේතුවූ කරුණු එන්. යූ. ජයවර්ධන විසින් මැනැවින් විග්‍රහකර ඇත. මුල් කාලයේදී මැණික් අපනයනය ඉහළ යැමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1972 දී හඳුන්වා දෙන ලද (පරිවර්ත්‍ය රුපියල් ගිණුම CRA) ක්‍රමයයි. ආනයන වෙළඳ කටයුතු දැඩි ලෙස සීමාකර තිබුණු එම යුගයේ CRA තැන්පත් (මුලදී මුළු අපනයන ඉපැයුම්වලින් සියයට 25 ක් හා පසුව සියයට 20 ක්) ආනයන වෙළඳ කටයුතු සඳහා යෙදවීමට මැණික් ව්‍යාපාරිකයින්ට අවසර දී තිබුණු අතර ඒ මගින් සියයට 150 සිට සියයට 200 ක ලාභයක් ඉපයීමට ඔවුන්ට හැකිවිය. එහි අදහස වූයේ හොර ජාවාරම් මගින් මැණික් රටින් පිට කිරීම අධෛර්යමත් කර, විවෘත වෙළඳ පොලේ මැණික් අලෙවි කිරීමට වැඩිපුර ඉඩකඩ සලසා දීමයි. 1977 නොවැම්බර් මාසයේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය ඇරඹීමත් සමඟ පරිවර්තන රුපියල් ගිණුම් ක්‍රමය අහෝසිකරන ලද්දේ නිදහස් වෙළඳ ප්‍රතිපත්ති යටතේ මෙබඳු වැඩ පිලිවෙලක් තවදුරටත් අදල නොවන හෙයිනි. කෙසේ වුවද, ඊට ආදේශක වශයෙන් කලින් පැවැති 'වාර්තාගත' මැණික් අපනයන වෙළඳාම එලෙසින්ම ආරක්ෂිතව පවත්වාගෙන යැමට කිසිදු නව දිරිගැන්වීමේ ක්‍රමයක් ඇති නොකරන ලදී. එහි ප්‍රතිපලයක් වූයේ නීති විරෝධී ලෙස මැණික් අපනයනය ක්‍රීම යළිත් ඇරඹීමයි. 1980 දී මැණික් අපනයන කටයුතු වලින් සියයට 5 ක ව්‍යාපාර පිරිවැටුම් බද්දක් අයකිරීමට පටන් ගැනීමත් (1983 දී මෙය ඉවත් කරන ලදී) තායි ජාතිකයන් විසින් නීති විරෝධී ලෙස මැණික් ව්‍යාපාර කටයුතුවල යෙදීම සාර්ථකව වැළැක්වීමට නිසි පියවර නොගැනීමත් හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් අයහපත් විය.

ලෝකයේ මිනිරන් වෙළඳ පොලෙහි ශ්‍රී ලංකාවට හිමි ස්ථානය පිළිබඳව ප්‍රයෝජනවත් සාක්ෂි කිහිපයක් මෑතකදී ආසියානු සංවර්ධන බැංකුව විසින් කරන ලද

වගුව 6

**නිෂ්පාදිත අපනයන ආනයන මත රැඳියාව**

| | මුළු නිෂ්පාදිත අපනයනවලට දයකත්වය % | අපනයනවලින් ආනයන පංගුව % |
|---|---|---|
| ආහාර, පාන හා දුම්කොළ | 8.25 | 17.91 |
| ඇඟලුම් | 46.57 | 71.23 |
| සම්භාණ්ඩ හා පාවහන් | 0.70 | 48.71 |
| බණිජ තෙල් නිෂ්පාදනය | 39.10 | 85.88 |
| රබර් භාණ්ඩ | 1.40 | 22.18 |
| පිඟන් වෝල්ටයිල් | 1.75 | 19.76 |
| යන්ත්‍රෝපකරණ | 1.52 | 43.20 |
| අනෙකුත් නිෂ්පාදිත භාණ්ඩ | 0.72 | 31.25 |
| මුළු නිෂ්පාදිත භාණ්ඩ | 100 | 68.78 |
| බණිජ තෙල් හැරෙන්නට නිෂ්පාදිත භාණ්ඩ | 60.90 | 60.00 |

මූලාශ්‍රය : 1 තීරුව. ශ්‍රී ලංකා රේගු වාර්තා.
2 තීරුව. අ. සං. ම. වාර්තා.
1980 නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ සමීක්ෂණය.
ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත.





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# අපනයන මූල්‍යකරණ හා අපනයන ණය රක්ෂණ පහසුකම්

## (1) අපනයන මූල්‍යකරණ පහසුකම්

පහසු ක්‍රමයට අපනයන කරුවන්ට මූල්‍ය පහසුකම් සැපයීමේ දනට පවත්නා ක්‍රම, කොටස් දෙකකට බෙදිය හැකිය.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව සපයන ප්‍රති-මූල්‍ය කරණ පහසුකම්.

(ආ) අපනයන සංවර්ධන මණ්ඩලය කලින්ම සපයන මූල්‍ය පහසුකම්.

### (අ) මහ බැංකුව සපයන ප්‍රති - මූල්‍යකරණ පහසුකම්

මහ බැංකුව විසින් සපයනු ලබන අපනයන ණය ප්‍රති-මූල්‍යකරණ පහසුකම් වර්ග තුනකට අයත් වේ. නැව් ගත කිරීමට පෙර ණය සැපයීමේ ප්‍රති-මූල්‍යකරණ ක්‍රමය, පරිපූරක මූල්‍යකරණ පහසුකම සහ මධ්‍යකාලීන හා දීර්ඝ කාලීන ප්‍රති මූල්‍යකරණ ක්‍රම යනුවෙනි.

සම්ප්‍රදායික නොවන අපනයන ප්‍රති-මූල්‍යකරණ ක්‍රමය 1977 දෙසැම්බරයේදී හඳුන්වාදෙන ලදුව 1978 දෙවන භාගයේ සමණ සිට ක්‍රියාත්මක විය. කලින් නියම කරගත් සහනදායී අනුපාතයකට හෝ ඊට අඩුවෙන් මහ බැංකුව විසින් අපනයනකරුවන්ට දෙන ලද ණය සම්බන්ධයෙන් මහ බැංකුව ප්‍රති-මූල්‍යකරණ පහසුකම් මෙම ක්‍රමය යටතේ සපයයි. ආරම්භයේදී, බැංකුවලට ඉඩ දෙන ලද ප්‍රති-මූල්‍යකරණ අනුපාතය හා උපරිම අනුපාතය අනු පිළිවෙලින් සියයට 10 ක් හා 14 විය. මේවා 1980 ජනවාරියේදී සියයට 12 හා 16 ක් තෙක් වැඩි කර 1983 ජනවාරියේදී සියයට 10 හා 13 තෙක් අඩු කරන ලදී. සෑම ප්‍රති-මූල්‍යකරණ ණයක්ම ප්‍රථමයෙන් දින 90 ක කාලයක් සඳහා දෙනු ලැබේ. සමහර විට උපරිම වශයෙන් දින 180 තෙක් එම කාලය දික් කෙරේ.

මෙම ක්‍රමය යටතේ වර්ෂාවසානයේ ඉතිරි ශේෂය 1978 සවැනි දස ලක්ෂ 71.2 ක සිට 1980 දී රු. දස ලක්ෂ 188.4 දක්වා ද 1982 දී රු. දස ලක්ෂ 458 දක්වා විශ්මය ජනක ලෙස වැඩි වී ඇත. 1983 සැප්තැම්බර් 31 දින වන විට එම ශේෂය රු. දස ලක්ෂ 1234.1 දක්වා වැඩි වී තිබිණි.

ඉහත සඳහන් පහසුකමට අමතරව, 1983 මාර්තු මස 06 දින සිට මහ බැංකුව පරිපූරක මූල්‍යකරණ පහසුකමක් සපයයි. එනම් වාණිජ බැංකු විසින් අපනයන කරුවන්ට වට්ටම් සලසා ඇති පොරොන්දු නෝට්ටු සියයට 12 කට වැඩි නොවන අනුපාතයකින් පිළි වට්ටම් කිරීමය. මෙම නැව්ගත කිරීමට පෙරාතු ප්‍රති-මූල්‍යකරණ නව ක්‍රමය අරමුණු වී තිබෙනුයේ තේ, රබර්, පොල් සහ එම නිෂ්පාදනවලින් ලබාගත් නිෂ්පාදනවලද, ඇඟලුම්, මැණික්, සාගර නිෂ්පාදන සහ ඛණිජ තෙල් නිෂ්පාදන ද අපනයනය කිරීම හා සම්බන්ධ වියදම් දැරීම සඳහා පමණි. එම ක්‍රමය ක්‍රියාත්මක වී මාස හයකට (සැප්තැම්බර්) පසු මෙම ක්‍රමය යටතේ මුළු ණය ශේෂය රු. දස ලක්ෂ 190 ක් විය. (මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන අනුවය.)

අපනයනයට යොමු වූ ව්‍යාපෘතිවලට මධ්‍ය කාලීන හා දීර්ඝකාලීන ප්‍රති-මූල්‍යකරණ ක්‍රමයක් අරඹන ලද්දේ 1981 දීය. අපනයන සංවර්ධන මණ්ඩලය අනුමත කළ අපනයන ව්‍යාපෘතිවලට අවුරුදු 3 – 15 කාලය දක්වා යනතුරු ණය සැපයීම සඳහා මහ බැංකුව මෙම ක්‍රමය යටතේ වාණිජ බැංකුවලට ජාතික සංවර්ධන බැංකුවට හා සංවර්ධන මූල්‍ය සංස්ථාවට මූල්‍ය පහසුකම් සපයයි. මහ බැංකුව සියයට 10 ක පොලී අනුපාතයක් අය කරන අතර, යථෝක්ත ණය දෙන ආයතනවලට සියයට 13 ක උපරිම පොලියක් අය කිරීමට ඉඩ දෙනු ලැබේ. මුල් අවස්ථාවේදී, මහ බැංකුව සැලසුම් ව්‍යාපෘතියකට සැපයූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 80 ක් පමණි. වාණිජ පරිමාණයේ නිෂ්පාදනයේ ප්‍රථම වර්ෂයේදී, මුළු නිෂ්පාදනයෙන් අඩු වශයෙන් සියයට 25 ක් වත් අපනයනය කිරීමට භාර ගනු ලබන අපනයන ව්‍යාපෘතිවලටම, රු. දස ලක්ෂ 30 ක උපරිම සීමාවකට යටත්ව මුදල් පහසුකම් ලබා ගැනීමට මෙම ක්‍රමය යටතේ හැකිය.

1981 වර්ෂය අවසන් වන විට, රු. දස ලක්ෂ 160 ක් වූ මුළු ණය ප්‍රමාණයකින් යුත් ව්‍යාපෘති 31 කට මූල්‍යකරණ පහසුකම් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අනුමත කර තිබුනි. එනමුත් ඒවා අතරින් මහ බැංකුව මූල්‍යකරණ පහසුකම් සලසා තිබුණේ රු. දස ලක්ෂ 35 ක ප්‍රමාණයකින් යුත් ව්‍යාපෘති 10 කට පමණි. මෙම ව්‍යාපෘතිවලට මූල්‍ය පහසුකම් සැපයීමට වාණිජ බැංකු විසින් වෙන් කළ අරමුදල්වලට ලැබෙන ප්‍රතිලාභ අඩුවීම නිසා එම ආයතනවල පැවැති අකැමැත්ත ඉන් දක්වේ. එබැවින්, 1982 ජනවාරියේදී ප්‍රති මූල්‍යකරණ අනුපාතය සියයට 100 දක්වා මහ බැංකුව වැඩි කළේය. 1982 අවසන් වන විට අපනයන සංවර්ධන මණ්ඩලය ව්‍යාපෘති 159 ක් ඇගැයුම් කර අනුමත කර තිබුණි. (එහි මුළු ආයෝජන ප්‍රමාණය රු. දස ලක්ෂ 390 කි.) ඉන් ව්‍යාපෘති 45 කට ප්‍රති-මූල්‍ය කරණය සඳහා මහ බැංකුවේ අනුමැතිය ලබා තිබුණි.

### අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍යකරණ ක්‍රමය

අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයනයට යොමු වූ තෝරාගත් ව්‍යාපෘතිවලට දෙයාකාරයක මූල්‍ය ආධාර සපයයි. එනම් සම ප්‍රාග්ධන සහභාගීත්වය සහ කෙටි කාලයක් තුළදී අපනයන ප්‍රමාණයන් පුළුල් කිරීමට විභවතාවය ඇති ව්‍යාපෘතිවලට කෙටි කාලීන මූල්‍ය පහසුකම් සැපයීමය.

සියයට 13 ක පොලියක් ඇති, නිදහස් කළ හැකි වරණීය කොටස්වල මුදල් ආයෝජනය කිරීමෙන්, අපනයන සංවර්ධන මණ්ඩලය, තෝරාගත් අපනයන ව්‍යාපෘතිවල සම ප්‍රාග්ධන ආයෝජනයෙහි යෙදෙයි. මෙම ක්‍රමයෙහි මූලික අරමුණ වනුයේ 'බීජ' ප්‍රාග්ධනය පමණක් සැලසීමෙන් අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි පෞද්ගලික ක්ෂේත්‍ර කටයුතු දිරි ගැන්වීමය. මේ අනුව ව්‍යාපෘතියේ කළමනාකාරිත්ව කටයුතු ආයෝජකයන්ට ඉතිරි කෙරේ. 1982 අවසන් වන විට රබර් අන්වැසුම්, මැලියම් රබර් 'අඩි' සහ වෛද්‍යාධාරක වැනි නිෂ්පාදන ක්ෂේත්‍රවල ව්‍යාපෘති ගණයක රු. දස ලක්ෂ 17 ක් මණ්ඩලය විසින් ආයෝජන කර තිබුණි.

කාර්මික අපනයන භාණ්ඩ සඳහා කෙටි කාලීන ණය ක්‍රමය, 1982 වර්ෂයේදී ඇති කරන ලද්දේ නවක්තා අපනයන ව්‍යාපාරවලට නිෂ්පාදනය පුළුල් කිරීමට සහ නිෂ්පාදනවල ගුණාත්මක බව දියුණු කිරීමටය. මෙම ක්‍රමය යටතේ, අදාල මුළු වියදමෙන් සියයට 50 තෙක් මූල්‍ය පහසුකම් අපනයන සංවර්ධන මණ්ඩලය සපයයි. මූල්‍ය පහසුකම් සැපයීම සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමේදී සොයා ගනු ලබන ප්‍රධාන මිණුම් දඬු වනුයේ අපනයන වෙළඳ පොළේ විභවිතාවය, අපේක්ෂිත විදේශ විනිමය ශුද්ධ ලාභය සහ ආපසු ගෙවීමේ කාලය වේ. 1983 න් අවසන් වූ කාලය වන විට රු. දස ලක්ෂ 90 ක අරමුදල් ප්‍රමාණයකින් ව්‍යාපාර 11 කට මෙම ක්‍රමය යටතේ ආධාර කර තිබුණි.

## (2) අපනයන ණය රක්ෂණය

මහ බැංකුවේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූලිකත්වය යටතේ 1977 ජනවාරියේදී ක්‍රියාත්මක වූ අපනයන ණය ඇපකරුම් සහතික ක්‍රමය, ශ්‍රී ලංකාවේ අපනයන ණය රක්ෂණ ක්ෂේත්‍රයේ ගනු ලැබූ ප්‍රථම පියවර විය. මෙම ක්‍රමය යටතේ වාණිජ බැංකු විසින් අපනයනකරුවන්ට නැව්ගත කිරීමට පෙර අවස්ථාවේදී සපයන ලද ණය සම්බන්ධයෙන් ඇතැම් වර්ගවල අවදානම් සඳහා ඇප වූහ. 1977 හා 1978 දී එවැනි ඇපවීම් යටතේ අවසර දෙන ලද මුළු ණය සීමාව අනුපිළිවෙලින් රු. දස ලක්ෂ 28 ක් හා 46 ක් විය. (ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 1979, 87 පිටුව.)

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 1979 පෙබරවාරි මස 8 වැනි දින පිහිටුවනු ලැබිණ. (1978 අංක 15 දරණ පනත) එය පිහිටුවීමත් සමගම, මහ බැංකුව ඇපකරුම් ණය ඇප ක්‍රමය ක්‍රියාත්මක කිරීම නතර කර සියවත්කම් හා බැරකම් යථෝක්ත සංස්ථාවට පැවරුවාය. දැන් එම සංස්ථාව සම්පූර්ණ අපනයන ණය රක්ෂණ සේවක්ම ක්‍රියාත්මක කරයි. අපනයන කරුවන් වෙනුවෙන් බැංකු ඇප සැපයීම සහ විදේශීය ගැනුම්කරු විසින් ගෙවීම් පැහැර හැරීමේ හෝ පමා වී ගෙවීමේ අවදානමෙන් ආරක්ෂා කිරීම එමගින් සැලසේ. බැංකු ඇප වර්ග තුනකට අයත් වේ. නැව්ගත කිරීමට පෙර ණය ඇපවීම, නැව්ගත කිරීමට පසු ණය ඇප වීම සහ අපනයන ක්‍රියාකාරීත්වය සඳහා ණය ඇපවීම යනුවෙනි. මෙම ඇපවීම් නිසා අපනයන කරුවන්ට වාණිජ බැංකුවලින්, පහසු කොන්දේසිවලට ණය ලබා ගැනීමට හැකි වේ. රක්ෂණ සහතිකවලින් ලැබෙන ආරක්ෂාව නිසා නව වෙළඳ පොලවලට හා නව ගැනුම්කරුවන්ට අපනයන කිරීමේදී සිදුවිය හැකි අවදානම්වලින් පසුබට නොවී පහසුදායක ණය ක්‍රම යටතේ, දැනට සිටින ගැනුම්කරුවන්ට වැඩියෙන් අපනයන කිරීමට අනුබල ලැබේ. නැව්ගත කිරීමෙන් පසු බැංකුවලින් ණය ලබා ගැනීමේදී අතිරේක ඇපයක් ලෙස මෙම ඇප ආධාර කර ගැනීමටත් අපනයන කරුවන්ට හැකිවේ.

නිකුත් කරන ලද ඇප සංඛ්‍යාව හා රක්ෂණ සහතික සංඛ්‍යාව අනුවත්, ගණුදෙනු කළ මුළු ප්‍රමාණය අනුවත් ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, පසුගිය වර්ෂ හතර තුළ සැලකිය යුතු කාර්ය වලයක් ලබා ඇත. සහන දක්වෙන වගු මගින් ඊට සම්බන්ධිත දත්ත කැටි කොට දක්වේ.

### ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ කාර්යසාධනය 1979 – 1983

| වර්ෂය | නිකුත් කළ ඇපකර | | පෙර හැවි ගත ඇපකර | | අපනයන කාර්ය කර ඇපකර | | ඇපකර යටතේ දෙනලද අත්තිකාරම්වල වටිනාකම | නිකුත්කළ අපනයන ණය රක්ෂණ ඔප්පු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | රැ. දෙ. ල. | | ආවරණයවූ නැව්ගත තොග වටිනාකම |
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | | සංඛ්‍යාව | වටිනාකම | |
| 1979* | 126 | 220.8 | 17 | 18.2 | 2 | 8.0 | 826.0 | 62 | 120.5 | 121.0 |
| 1980 | 212 | 423.3 | 37 | 32.2 | 14 | 80.7 | 1,274.0 | 128 | 184.3 | 270.0 |
| 1931 | 287 | 588.8 | 51 | 68.8 | 19 | 91.1 | 1,270.0 | 188 | 284.8 | 271.0 |
| 1982 | 334 | 792.6 | 61 | 78.2 | 22 | 92.0 | ල. නො. | 209 | 356.2 | ල. නො. |
| 1983** | 338 | 785.0 | 65 | 89.4 | 22 | 92.0 | ල. නො. | 215 | 390.2 | ල. නො. |

සටහන * අගෝස්තු දෙසැම්බර් සිට මස
** පළමු කාර්තුව ල. නො.

මූලාශ්‍රය : මහබැංකු වාර්තාව. 1983 අප්‍රේල් සටහන 20. මහබැංකු වාර්තාව සහ ආර්ථික විවරණ.

## විදේශීය සෘජු ආයෝජන සහ නිෂ්පාදිත භාණ්ඩ අපනයන

1970 මැද භාගය වන විට, අපනයනය නැඹුරු ශ්‍රම සූක්ෂම නිෂ්පාදන කර්මාන්තවලට විදේශීය ප්‍රාග්ධනය ගලා ඒමේ මුල් ලකුණු පැහැදිලි වන්නට විය. කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්තා අනුව, 1974 – 77 කාලය තුළ හවුල් නිෂ්පාදන ව්‍යාපාර 13 ක් (ඇඟලුම් – 9, දියමන්ති කැපීම – 1, මැණික් කැපීම – 1, පිඟන් භාණ්ඩ – 1, පිඟන් ගඩොල් – 1) අපනයන වෙළඳපලට නිෂ්පාදනය කිරීම උදෙසා පිහිටුවා තිබූ බව පෙනේ.

1977 දී ආරම්භ වූ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයට පසුව විදේශීය ආයෝජනයෙහි වේගවත් වර්ධනයක් ඇති විය. 1983 අග වන විට කටුනායක පිහිටි නිදහස් වෙළඳ කලාපයෙහි නිෂ්පාදනයෙහි යෙදුනු නිෂ්පාදිත කාර්මික ආයතන ගණන 56 දක්වා නැග තිබිණි. මින් ආයතන 51 ක්ම සඳහා විදේශීය ප්‍රාග්ධනය යොදවා තිබිණි. 1983 ජූනි 30 වන විට නිදහස් වෙළඳ කලාපයට බාහිරව (විදේශ ආයෝජන උපදේශක කමිටුවේ අනුමැතිය ඇතිව) පිහිටුවා තිබුණු කාර්මික නිෂ්පාදන ආයතන ගණන 114 ක් විය. රෙජිස්ට්‍රාර් වාර්තා සමග මේ ආයතන ලැයිස්තු සසඳා බැලූ විට මෙහි දෙවැනිව සඳහන් කළ ආයතනවලින් 50% ක් වත් පිය සම්පූර්ණ නිෂ්පාදනයෙන් කොටසක් හෝ අපනයනය කරන බව පෙන්නුම් කෙරේ. නිදහස් වෙළඳ කලාපීය මෙන්ම විදේශීය ආයෝජන උපදේශක කමිටුවෙන් අනුමත ආයෝජකයන් අතර ද වඩාත්ම සිත් ගන්නා ප්‍රධාන නිෂ්පාදනය වී ඇත්තේ ඇඟලුම්ය. අපනයනයට නැඹුරු නිෂ්පාදන කර්මාන්ත අතුරෙන් 70% ක්ම මේ ගණයට වැටේ. රබර් භාණ්ඩ (14%) මැණික් හා ස්වර්ණාභරණ (6%) සෙල්ලම් බඩු හා ක්‍රීඩා භාණ්ඩ (4%) සහ පාවහන් කොපු හා බුරුසු වැනි අඩු නිපුණත්වයක් අවශ්‍ය වඩාත් මිනිස් ශ්‍රමය යොදවන භාණ්ඩ නිෂ්පාදනය අනෙක් ආයෝජන ක්ෂේත්‍රයට අයත් වේ. මේ දක්වා උසස් – නිපුණත්වයක් අවශ්‍ය ශ්‍රමය වඩාත් යෙදිය යුතු විදුලිය හා විද්‍යුත්මය භාණ්ඩ නිෂ්පාදනය වැනි අපනයන කර්මාන්ත කෙරෙහි විදේශීය ප්‍රාග්ධනය ඇදී ඒමේ සැලකියයුතු නැඹුරුවක් දක්නට නැත.

1977, 1979 සහ 1982 යන වර්ෂ තුන තුළ විදේශීය ප්‍රාග්ධන සහභාගිත්වය (පහසුව තකා සංක්ෂේප වශයෙන් "විදේශීය ආයතන" යනුවෙන් මින් පසු හැඳින්වෙන) ඇතිව ඇරඹුනු ආයතනවල දායකත්වයෙහි සාපේක්ෂ ඇස්තමේන්තු පහත දැක්වෙන වගුවෙහි කොටසෙන් දක්වේ. 1977 දී අපනයනය කළ මුළු නිෂ්පාදිත භාණ්ඩවලින් විදේශීය ආයතනවලට හිමි ප්‍රතිශතය 24 කි. මෙය 1979 දී 31% දක්වා නැංග අතර 1982 දී එය 46 දක්වා ඉහළ ගියේය. එකී අපනයනයන්හි එම තුන් වර්ෂය තුළ අපනයනය කළ මුළු වෙළඳ ද්‍රව්‍ය වලින් එයට අයත් ප්‍රතිශතය පිළිවෙලින් සියයට 2, 4 සහ 14 ය.

වගුවෙහි දැක්වෙන අංක දෙකේ (SITC) වෙළඳ භාණ්ඩ කණ්ඩ සියල්ලම, සැම අවස්ථාවකදීම, දෙකක් එනම් දුම්කොළ හා (SITC 31) ආහාරමය නිම වර්ග හැර අධ්‍යයනයට භාජනය වන කාල පරිච්ඡේදය තුළ පැහැදිලිව ඉහළ යාමක් පෙන්වයි. වඩාත්දුරට වෙන්කර ගතහොත් රබර් භාණ්ඩ, පිඟන් බඩු හා පිඟන් ගඩොල්, පාවහන් හා සෙල්ලම් බඩු හා ක්‍රීඩා භාණ්ඩ යන අංශයන්හි විදේශීය ආයෝජනය ඉතා ඉහළම මට්ටමකින් පෙන්වයි. ශ්‍රී ලංකාවේ ප්‍රධානම නිෂ්පාදිත අපනයන භාණ්ඩය වන ඇඟළුම් සම්බන්ධයෙන් 1979 හා 1982 කාලය තුළ විදේශීය සහභාගිත්වය 60% ක (30% සිට 48% දක්වා) ඉහළ යාමක් පෙන්වයි.

නිෂ්පාදිත භාණ්ඩ අපනයනය සම්බන්ධයෙන් විදේශීය සහභාගිත්වය වැදගත් වීම ක්‍රමයෙන් වර්ධනය වීමේ රටාව කටුනායක නිදහස් වෙළඳ කලාපයේ නිෂ්පාදන ව්‍යාප්තිය හා කිට්ටුවෙන් සම්බන්ධ වී පවතී. නිදහස් වෙළඳ කලාපයෙන් බාහිරව පිහිටි විදේශීය ආයතනවලට මුළු නිෂ්පාදන අපනයනවලින් හිමි කොටස 1979 පැවැති 27% ක් 1982 වන විට 14% දක්වා පහළ වැටීම සැලකිය යුතු දෙයකි. අනෙක් අතට, මේ වර්ෂ දෙක අතරතුරේදී නිදහස් වෙළඳ කලාපීය අපනයන කොටස 4% සිට 31% දක්වා ඉහළ ගොස් ඇත. මේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එම වෙළඳ කලාපයෙන් ඇඟළුම් අපනයනය කිරීම සීඝ්‍ර ලෙස ව්‍යාප්තවීමයි.

මෙහිදී නිදහස් වෙළඳ කලාපයට අයත් නොවන විදේශීය ආයතන සාපේක්ෂිතව අසතුටුදායක වර්ධන නැඹුරුවක් පෙන්වීමට හේතුව සොයා බැලීම අවස්ථාවෝචිතය. ඉන් එක් පැහැදිලි හේතුවක් නම්, එකෙක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ ඇඟළුම්වලින් 15% ක් සඳහාම වගකියූ ඇඟළුම් නිෂ්පාදනය කළ ප්‍රධාන විදේශීය ආයතන දෙකක් 1981 දී වසා දැමීම (අභ්‍යන්තර පරිපාලනමය ප්‍රශ්ණ හේතුන් නිසා)ය. නිදහස් ආනයනය රජයන අවධියක "ආනයන – ආදේශක" ගණයේ විදේශීය ආයතන විසින් අපනයනය කෙරෙහි දක්වූ නොසැලකිලිමත් ආකල්පය, තවත් හේතුවක් ලෙස දැක්විය හැකිය. 1977 නොවැම්බර් මාසයට පෙර පැවැති දැඩි ආනයන සීමාවන් සහිත සමය තුළ සිය ආනයන අවශ්‍යතාවයන සපුරා ගැනීම ඉතාම සාර්ථක සහතිකයක් ලෙස මේ ආයතන විසින් සිය මුළු නිෂ්පාදනයෙන් කොටසක් අපනයනය කිරීමේ පුරුද්ද ඒ ක්‍රමය තුළම අන්තර්ගතව තිබූ බලපෑමක් විය. ආයතන මට්ටමේ අපනයන දත්ත පිලිබඳ සියුම් පරීක්ෂණයක් අනුව මේ කාලය තුළදී නිෂ්පාදනය කළ භාණ්ඩ අපනයනයෙන් වැදගත් කොටසක්, විශේෂයෙන්ම සකස් කළ ආහාර, රසායනික ද්‍රව්‍ය හා පාවහන් වැනි වර්ගවලට අයත් භාණ්ඩ නිෂ්පාදනය මේ වෙනනාව මගින් අම්භෙයවනු ලැබ තිබූ බව පෙනේ. ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය පහසුවෙන් ලබාගත හැකි හෙයින් නිදහස් ආනයන ප්‍රතිපත්තිය තුළ එවැනි බලපෑමක අවශ්‍යතාවයක් නැත.

(මේ ලේඛකයා විසින් විශාල බහුජාතික සමාගමක මෙරට අනු ආයතනයක ඉහළ නිළධාරියෙකුත් මේ විමසන ලද විට මේ නිගමනය සම්පූර්ණයෙන්ම තහවුරු කළේය. නිදහස් ආනයනය ඩිහිවන්නට පළමු මේ සමාගමේ අපනයනයන් එහි ආනයන අවශ්‍යතාවන්ට වඩා වැඩි විය. රෙජිස්ට්‍රාර් වාර්තා අනුව 1982 දී එම සමාගමේ අපනයනයන්ගෙන් ආනයන වියදම් පියවීමට යෙදුනේ, ඉන් 20% ක් පමණි.)



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මූලාරම්භක අංශ අනුව දේශීය වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා විදේශීය සමාගම්වල ප්‍රතිශතානුකූල සහභාගිත්වය 1977, 1979 හා 1982
(අපනයන වටිනාකම දහස් ගණන්වලින් දක්වේ)

| අපනයන මූළ එකතුව (1) | 1977 පිටරට සමාගම්වල අපනයන කොටස් ක ආ ප්‍රකා% (2) | ක ආ ප්‍රකා නොවන % (3) | එකතුව % (4)=(2+3) | 1979 පිටරට සමාගම්වල අපනයන කොටස් අපනයන මූළ එකතුව % (1) | ක ආ ප්‍රකා (2) | ක ආ ප්‍රකා නොවන % (3) | එකතුව % (4)=(2+3) | 1982 පිටරට සමාගම්වල අපනයන කොටස් අපනයන මූළ එකතුව % (1) | ක ආ ප්‍රකා % (2) | ක ආ ප්‍රකා නොවන % (3) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 31. ආහාර, බීම වර්ග හා දුම්කොල | 12535 | - | 10.29 | 10.29 | 19822 | - | 18.78 | 18.78 | 30159 | 2.04 |
| මත්ස්‍ය නිෂ්පාදන | 9075 – | - | 6.42 | 6.41 | 15279 | - | 11.61 | 11.61 | 18872 | |
| සකස් කළ තේ | 1228 | - | - | - | 1118 | - | - | - | 3332 | 9.36 |
| වෙනත් | 2232 | - | 30.52 | 30.52 | 3425 | - | .56.86 | 56.86 | 7955 | 3.81 |
| 32. රෙදිපිලි, ඇඟලුම් සහ සම්කර්මාන්ත industries | 14495 | - | 31.70 | 31.70 | 56308 | 5.70 | 25.29 | 30.99 | 153967 | 36.73 |
| ඇඟලුම් නිෂ්පාදන | 13737 | - | 29.49 | 29.49 | 55599 | 5.76 | 24.58 | 30.34 | 151699 | 36.38 |
| සම් නිෂ්පාදන/පාවහන් | 758 | - | 71.69 | 71.69 | 709 | 3.99 | 80.34 | 80.34 | 2268 | 60.56 |
| 35. රසායනික ද්‍රව්‍ය, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන | 1923 | - | 1.51 | 1.51 | 2676 | 2.24 | 7.74 | 9.98 | 6669 | 65.70 |
| රසායනික ද්‍රව්‍ය | 1642 | • | 0.50 | 0.50 | 2251 | | 4.35 | 4.35 | 2098 | - |
| රබර් භාණ්ඩ | 281 | - | 7.48 | 7.48 | 425 | 14.11 | 25.68 | 39.79 | 4571 | 95.86 |
| 36. පිඟන් භාණ්ඩ හා පිඟන් ගඩොල් | 2991 | - | 61.50 | 61.50 | 4801 | - | 85.51 | 85.51 | 5695 | 0.36 |
| 38. යන්ත්‍ර සූත්‍ර හා පිරියත | 2383 | - | 8.12 | 8.12 | 3889 | - | 2.28 | 2.28 | 4962 | 21.83 |
| 39. වෙනත් කාර්මික නිෂ්පාදන | 1389 | - | 35.89 | 35.89 | 2402 | 0.01 | 29.33 | 29.34 | 7628 | 37.51 |
| කොහු භ ණ්ඩ | 132 | - | - | - | 609 | - | - | - | 2255 | 26.01 |
| ස්වර්ණ ාරණ | 36 | - | - | - | 180 | 1.13 | - | 1.13 | 996 | 11.63 |
| සෙල්ලම්බ ු හා ක්‍රීඩා භාණ්ඩ | 43 | - | - | - | 150 | - | - | - | 1182 | 83.61 |
| වෙනත් | 1178 | - | 42.30 | 42.30 | 1464 | - | - | 48.31 | 3195 | 36.63 |
| මුළු නිෂ්පාදිත භාණ්ඩ එකතුව | 35718 | - | 23.64 | 23.64 | 99898 | 3.64 | 27.16 | 30.80 | 209080 | 31.34 |
| මුළු අපනයන වෙළඳ භාණ්ඩ එකතුව | 34846 | - | 1.90 | 1.90 | 756,486 | 0.43 | 3.76 | 4.19 | 902023 | 8.49 |

**සටහන්**

ශූන්‍ය අගයක් පෙන්වයි
තේ මළු සහ ක්ෂණික තේ
ඛණිජ තෙල්මය නිෂ්පාදන හැර

ක. ආ. ප්‍ර. ක. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය.

මූලාශ්‍රය : රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රසිද්ධියට පත් නොකළ ආයතන මට්ටමේ අපනයන වාර්තාවලින් සකස් කර ගන්නා ලදී.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යයනය කින් (Graphite Mining Project-Finland Report 1981) හෙළිවෙයි. එම අධ්‍යයනයෙහි සඳහන්වන පරිදි ඇමෙරිකා එක්සත් ජනපදයේ මිනිරන් ආයාතවල ශ්‍රී ලංකාවේ කොටස 1978 දී සියයට 7.5 ක්ව තිබුණු අතර 1980 දී එය සියයට 3.4 ක් දක්වා පහත වැටී ඇත. ජපානයේ වෙළඳ පොළෙහිද (ඇමෙරිකා එක්සත් ජනපදය හැරුණුවිට ඊළඟට ශ්‍රී ලංකාවේ මිනිරන් විශාල වශයෙන් අලෙවිවන වෙළඳපොල මෙයයි) අලෙවි කොටස එමවසර දෙක තුළදී සියයට 6.5 සිට සියයට 3.8 දක්වා පහත වැටුනි. වෙනත් තරඟකාරී සැපයුම් කරුවන්ගේ මිළ ගණන් පරීක්ෂා කිරීමෙන් තොරව දැඩි ලෙස මිල ඉහළ නැංවීම, ගැනුම් කරුවන් ගේ රුචිය ගැන නොතකා ඔවුන්ට උසස් වර්ගයේ මිනිරන් විකිණීමට තැත්කිරීම යන සඳොස් වෙළඳ උපාය මාර්ග භාවිතා කිරීමත් අසතුටුදායක වෙළෙඳ නැඹුරුවක් ඇතිවීමට ප්‍රධාන හේතු ලෙස මෙම අධ්‍යයනයෙන් පෙන්වාදී ඇත.

කාර්මික භාණ්ඩ ශ්‍රී ලංකාවෙන් ලෝක වෙළඳපොලට ඇතුළුවීම තවමත් ඉතා අඩු මට්ටමක පවතී (5 වන වගුව). වගුවෙහි දක්වා ඇති වෙළඳ භාණ්ඩ අට අතරින් සම්භාණ්ඩ, සපත්තු, සහ සබන් පිළිබඳව 1976 – 82 අතර කාලයේදී සංවර්ධනය වන රටවල අපනයනවලින් ශ්‍රී ලංකාවේ ප්‍රතිශතය අඛණ්ඩව අඩුවී ඇත. පිඟන් ගඩොල්, ස්වර්ණාභරණ සහ ධීවර නිෂ්පාදන වල ප්‍රතිශතයන් කලින් කලට වෙනස් වන අපනයන රටාවන්ගෙන් යුක්ත විය. මෙම අපනයන නිෂ්පාදන පවතින වෙළඳ පොල තත්ත්වයන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකිවන පරිදි තවමත් මනා ස්ථාවර පදනමක්මත සංවිධානය වී නොමැති බව මෙම කරුණු වලින් පැහැදිලි වේ.

ලැයිස්තුවේ සඳහන් වෙළඳ ද්‍රව්‍ය අතරින් වෙළඳපොල කොටස් අඛණ්ඩව හා සැලකියයුතු ලෙස වර්ධනය වූයේ පිඟන් භාණ්ඩ සහ නිමි ඇඳුම් සම්බන්ධයෙන් පමණකි. පිඟන් භාණ්ඩවල කොටස 1971 දී සියයට 0.39ක්ව තිබුණු අතර 1982 දී සියයට 5. 3 දක්වා ඉහළ ගියේය. නිමි ඇඳුම්වල නිෂ්පාදන 1971 දී 0.14 ක් වූ අතර 1982 දී සියයට 2.6 ක් විය. වෙනත් ආසියානු රටවල් සමඟ සසඳා බලනවිටද එම වෙළඳ භාණ්ඩ අපනයනය අතින් ශ්‍රී ලංකාව සාපේක්ෂ සතුටුදායකත්වයක් පෙන්වා ඇත. 1971 දී පිඟන් භාණ්ඩ අතින් ශ්‍රී ලංකාව දරණ ලද්දේ දකුණු කොරියාව, හොංකොං, මැලේසියාව, ඉන්දියාව, තායිලන්තය සහ පිලිපීනය යන රටවලට පහලින් එනම්, හත්වෙනි ස්ථානයයි. 1981 දී මැලේසියාව, ඉන්දියාව සහ හොංකොං අභිබවා යමින් හතරවෙනි ස්ථානය ලබාගත්තේය. නිමි ඇඳුම් අපනයනය අතින් ශ්‍රී ලංකාව සමස්ථයක් වශයෙන් ගත්විට, 'ආසියාවේ අළුතින් පැමිණි' අපනයනකරුවන් මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව යන රටවලට වඩා සාපේක්ෂ වශයෙන් යහපත් තත්ත්වයක් පෙන්වයි. 1982 දී ශ්‍රී ලංකාව ආසියාතික අපනයනකරුවන් අතරින් මැලේසියාව සහ ඉන්දුනීසියාවට වඩා ඉදිරියෙන් සිටියේය. පිලිපීනය සහ තායිලන්තය තවදුරටත් ශ්‍රී ලංකාවට වඩා ඉහලින් සිටින නමුදු එම රටවල මෙම අපනයන වාර්ෂිකව ප්‍රසාරණය වන අනුපාතිකය ශ්‍රී ලංකාවට වඩා සාපේක්ෂ වශයෙන් අඩුබව පෙනේ.

බහු කෙඳි ගිවිසුම (M F A) තුළ සිටින ප්‍රධානපෙළේ ආනයන රටවල් විසින් 1970 ගණන්වල දෙවැනි භාගයේදී ක්‍රියාත්මක කරන ලද ආනයන පංගු ක්‍රමය ශ්‍රී ලංකාවට හානිකර වී ඇත. බහුකෙඳි ගිවිසුම යටතේ පලමුවන පංගු ගිවිසුම 1976 දී අත්සන් කරන ලද්දේ නෝර්වේ රට සමගය. 1980 වන විට බටහිර යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාවේ පිහිටි අනෙකුත් ප්‍රධාන වෙළඳ පොලවලට යැවෙන අපනයනද මෙබඳු ගිවිසුම් යටතට පත්විය. මුලදී පංගු ක්‍රමයෙන් සීමාකරන ලද්දේ කමිස සහ හැට්ට පමණකි. එහෙත් ක්‍රමයෙන් අනිකුත් 'ජනප්‍රිය' ඇඟලුම් වර්ගද සීමාකිරීම්වලට යටත්විය. එක් එක් අපනයන කරුවාගේ දත්ත වෙනම පරීක්ෂා කිරීමකින් තොරව, අපනයන පංගු ක්‍රමයේ බලපෑම කෙතරම් තියුණුදැයි නිශ්චිතව පැවසීම දුෂ්කරය. කෙසේ වුවද, නිමි ඇඳුම් අපනයනය කරන්නන් සලාක ක්‍රමය පිළිබඳව අඛණ්ඩ දක්වන දැඩි අවධානයන් සහ ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ ඇති සමාගම්වලට ලබාදී ඇති පංගු වෙන්කිරීම ප්‍රමාණය අඩුකරන ලෙස එම කලාපයෙන් පිටත කටයුතු කරන අපනයන කරුවන් ඉල්ලා සිටීමෙන්, මෙම ප්‍රශ්ණයන් දරුණු බව පෙනීයයි.

අපනයන පරිමාව පුළුල්වීම කෙරෙහි ක්ෂණික ලෙස ඇතිකළ බලපෑම හැරුණු විට පංගු ක්‍රමය තවත් අතකින් නිමි ඇඳුම් කර්මාන්තයෙහි දිගු කාලීන ශක්‍යතාව කෙරෙහිද හානිකර බලපෑම් ඇතිකරයි. පංගු ක්‍රමය, නිෂ්පාදකයින්තුළ (ඇතැම්විට ප්‍රතිපත්ති සම්පාදකයන් තුළද) අපනයන කටයුතු කෙරෙහි උදාසීන බවක් ඇතිකර වන අතර එහෙයින් අපනයනයට ප්‍රමාණවත් වන පරිදි නිෂ්පාදන ධාරිතාවක් ඇති කිරීම හෝ නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට පියවරක් ගැනීම පිළිබඳ සංරෝධකයක් ලෙස ක්‍රියාකරයි. අපනයන නිෂ්පාදනයෙහි ඉහළ පිරිවැය දැරීමට නිෂ්පාදකයින් පෙලඹවීමට පැවැතිය යුතු පූර්ව අවශ්‍යතාවන් වන්නේ ප්‍රමාණවත් වෙළඳ පොල අවස්ථා පැවැතීමයි. සීමා ක්‍රමයක් තිබුණු පමණින්ම නිමි ඇඳුම් අපනයනයෙහි අනාගතය අඳුරු වෙතැයි සැලකිය නොහැකිය. දැනටමත් වෙළඳපොල බලය තහවුරු කරගෙන සිටින රටවල්වල තරඟය හමුවේ 'අළුතින් පිවිසෙන' රටවල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රයෝජනවත් මෙහෙය මෙම සීමාකිරීම්වලින් ඉටුවන බවට ඇතමෙකුට තර්කකළ හැකිය. විවෘත තරඟකාරී වෙළඳපොලක් පැවැතියේ නම් ශ්‍රී ලංකාවට පසුගිය සිව් වසරේදී වර්ධනය වූ වේගයෙන්ම බටහිර යුරෝපීය රටවල්වල සහ උතුරු ඇමෙරිකානු වෙළඳ පොලවල්වලද ප්‍රසාරණය වීමට හැකිවනු ඇතැයි සිතීම දුෂ්කරය. සලාක සීමා කිරීම නොමැති සහ දැඩි ගතිකතාවකින් යුත් වෙළඳපොලක් වන මැද පෙරදිග වෙළඳ පොලේදී නැගෙනහිර ආසියානු රටවල අපනයන කරුවන්ගේ තරඟය හමුවේ ශ්‍රී ලංකාවේ වෙළඳපොල පංගුව පහත වැටී තිබීමෙන් ඉහත සඳහන් කරුණු පැහැදිලි වෙයි.

1970 ගණන්වල මුල හරියේ සිටම හොංකොං, තායිවාන්, සහ කොරියාව යන රටවල අපනයන තදබල ලෙස පංගු සීමා කිරීම්වලට යටත්ව තිබෙ. මෙම සීමාකිරීම් තිබියදී වුවද ඉහත සඳහන් රටවල් තුන සංවර්ධන වන රටවල්වල මුළු අපනයන තුළ තම කොටස ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යෑමට සමත්වී ඇත. මෙම සාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් හේතුවූ කරුණු දෙකකි. සලාක ක්‍රමය යටතේ අපනයන වැඩිකර ගැනීමට ලැබුණු අවස්ථාව උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීම, විශේෂයෙන්ම අපනයනවල ඒකක අගය වැඩිකර ගැනීම ඉන් එකකි. අනික් කරුණ වන්නේ, නව වෙළඳ පොලවල්කරා, විශේෂයෙන්ම ඛණිජ තෙල් අපනයනය කිරීමෙන් ලබාගත් විශාල ප්‍රාග්ධන අතිරික්ත ඇති රටවල් කරා අපනයනය පුළුල් කිරීමයි.

ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් අපනයන කටයුතු තවමත් දැඩිලෙස සීමා වී ඇත්තේ කමිස, හැට්ට, සාය සහ කලිසම් වැනි සලකා සීමාවට අයත් අංගවලය. එහෙයින් වෙනත් නිමි ඇඳුම් වර්ග නිපදවා අපනයනය කිරීමෙන් කෙටිකාලීන වශයෙන් අපනයනය පුළුල් කිරීමට පංගු හැකියාවක් ඇත. එහෙත් අපනයන පරිමාව පුළුල්





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීමත් සමග එම නව නිමි ඇඳුම් වර්ගද සලාක ක්‍රමය යටතට පත්විය හැකිය. එහෙයින් දිගුකාලීන වශයෙන් බලාපොරොත්තු තැබිය හැක්කේ පවතින සලාක ක්‍රමය තුළ ඒකක අගය වැඩිකිරීමේ හැකියාව (වඩාත් හොඳ තත්ත්වයේ නිමි ඇඳුම් නිපදවීමෙන්) සහ සලාක ක්‍රමයට යටත් නොවන භාණ්ඩ අපනයනය ඇරඹීම මතය.

**කාර්මික අපනයනවල ආනයන රැඳියාව:-**

කාර්මික භාණ්ඩ අපනයනයෙන් ආර්ථිකයට සැලසෙන ශුද්ධ යහපත තක්සේරු කිරීමේදී සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණක් නම්, එම අපනයනවල කිනම් ප්‍රතිශතයක ආනයන යෙදවුම් අඩංගු වී තිබේද යන්නයි. ආනයන මත වැඩියෙන් රඳා පවතින තරමට ගෙවුම්ශේෂ තත්ත්වයට යම් අපනයන භාණ්ඩයකින් ලැබෙන ප්‍රයෝජනය අඩුය. අනික් අතට ආනයන මත දැඩිලෙස එල්බගෙන කටයුතු කිරීමෙන්, දේශීය අමුද්‍රව්‍ය භාවිතය මගින් එම අපනයනවලින් ආර්ථිකයේ සෙසු අංශවලට ඇතිවන 'පැතුරුම් ප්‍රතිවිපාකය' (කාන්දුවීම් ප්‍රතිවිපාක) සීමාවනු ඇත.

7 වන වගුවෙන් දැක්වෙන්නේ තෝරාගත් භාණ්ඩ කිහිපයක් පිළිබඳව 'නැවගත මිල' යටතේ අපනයන ආදායමෙහි ආනයන සංයුතිය සහ අපනයනය ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරුය. වගුවෙහි දැක්වෙන පරිදි කාර්මික භාණ්ඩවල සාමාන්‍ය ආනයන සංයුතිය සියයට 69 ක් පමණ වෙයි. ව්‍යතිරේකයක් ලෙස සලකා ඛණිජ තෙල් අපනයනය ඉවත්කළ විටද එම සංගුණකය සියයට 60 ක් වෙයි. ආනයන මත දැක්වෙන රැඳියාව මෙතරම් ඉහළ මට්ටමක පැවැතීමට හේතුව අපනයනවලින් ඉතා විශාල කොටසක් නිමි ඇඳුම් අපනයනය විසින් දැරීමයි. ඛණිජතෙල් නොවන අපනයනවලින් සියයට 78 ක් වන නිමි ඇඳුම් අපනයනයෙහි ආනයන සංගුණකය සියයට 71 ක් වෙයි. වෙනත් බොහෝ අපනයන භාණ්ඩවල, විශේෂයෙන්ම දේශීය සම්පත් මත පදනම් වූ අපනයන භාණ්ඩ වන ආහාර වර්ග, දුම්කොළ, රබර් භාණ්ඩ, පිඟන් භාණ්ඩ, සහ පිඟන් ගඩොල් වැනි ද්‍රව්‍යවල ආනයන සංගුණකය සැලකිය යුතු තරම් අඩුය. කෙසේ වුවද අපනයන විවිධාංගීකරණය කෙරෙහි වැඩි වැඩියෙන් අවධානය යොමු කෙරෙමින් තිබියදී වුවද එම භාණ්ඩ අපනයන සංයුතිය තුළ දරන වැදගත්කම තවමත් ඉතාම අඩු මට්ටමක පවතී

ආනයන සංගුණකය පිළිබඳ ඇස්තමේන්තුවලින් පමණක් හා කාර්මික අපනයනය ගෙවුම් ශේෂ මත ඇතිකරවන බලපෑම් ගැන සම්පූර්ණ තොරතුරු අනාවරණය නොවේ. 1977 සිට සෘජු විදේශීය ආයෝජනය (DFI) මෙම අංශයෙහි වැඩි වැඩියෙන් වැදගත් වී ඇත. (කොටුව බලන්න) සෘජු විදේශීය ආයෝජන සහභාගිත්වය ඇති සමාගම් විසින් කරනු ලබන ඛණිජතෙල් නොවන අපනයන 1977 දී සියයට 24 ක් ව පැවැති අතර, 1982 දී සියයට 46 ක් දක්වා ඉහළ ගියේය. තවද, වර්ෂ දෙක අතර වැඩිවුණු අපනයන ප්‍රමාණයෙන් සියයට 57 කට පමණ වගකියා ඇත්තේ මෙම සමාගම්ය. එම නිසා අපනයනය හා සම්බන්ධ වූ ලාභ සහ ලාභාංශ රටින් පිට යැවීම, කර්තෘභාග ගෙවීම් වැනි විදේශීය විනිමය පිටතට ගලායෑම් සහ වෙනත් වක්‍ර වූ ක්‍රම මගින් විදේශ විනිමය ඉවත්කර ගැනීම සැලකිය යුතුවෙයි. ගෙවුම් ශේෂ බලපෑම අර්ථවත් ලෙස ඇස්තමේන්තු කළ හැක්කේ මෙම සියළු කරුණු සැලකිල්ලට ගැනීමෙනි.

**නිගමනය :-**

1960 ගණන්වල මුල් භාගයේ සිට ශ්‍රී ලංකාවේ අපනයන කටයුතු පිළිබඳ වූ ඉහත සඳහන් විශ්ලේෂණයෙහි නිගමන මෙසේය. 1970 ගණන්වල මුල් භාගයේ සිට මේ දක්වා අපනයන ඉපයුම් (වි.ගැ.හි.) ඉහළ යෑමේ නැඹුරුවක් දක්නට ඇතත්, ආනයන මිළ ගණන්වල ඉහළයාම සහ මෙරට ආනයන ඉල්ලුමද සමග සසඳා බැලීමේදී එම ඉහළයෑම ප්‍රමාණවත් නොවන බව පෙනේ. මේ හේතුවෙන් ගෙවුම් ශේෂ දුෂ්කරතා මගහරවා ගැනීමට අප ආර්ථිකයට වැඩි වැඩියෙන් විදේශාධාර මත යැපීමට සිදුවී ඇත. දිගුකාලීන වශයෙන් ආර්ථිකයක වර්ධනය ගැන සලකන කල්හි එය ආර්ථිකය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකරවයි. ලෝකයේ අපනයන කටයුතු පසුබිම් අනුව බලනවිට ශ්‍රී ලංකාවේ අපනයන කොටස, ලෝකයේ අපනයන අතරින් පමණක් නොව ඛණිජ තෙල් අපනයන නොකරන සංවර්ධනය වන රටවල්වල අපනයන තුළද පිරිහෙමින් පවතින බව පෙනේ.

අපනයන භාණ්ඩ වෙන් වෙන් වශයෙන් හා කාණ්ඩ වශයෙන් ගෙන ඒවායේ අපනයන කටයුතු වෙනස් තරඟකාරී රටවල අපනයන සමඟ සසඳා විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ (කුරුඳු හා ඇතැම් විට නිමි ඇඳුම් ද හැරුණුවිට) අපනයනවල අසතුටුදායක තත්ත්වයට හේතු රටතුලින්ම ඇතිවන බවයි. තේ රබර් සහ පොල් යන සාම්ප්‍රදායික අපනයන තුනම ලෝක වෙළඳ තත්ත්වය අතින් දිගින් දිගටම පිරිහීමට හේතුවූයේ අපනයන පරිමාව සතුටුදායක ලෙස වර්ධනය නොවීම නිසාය. 1970 ගණන්වල මුල් භාගයේ සිටම, කාණ්ඩයක් වශයෙන් ගත්කළ සාම්ප්‍රදායික නොවන අපනයනවල තරමක වර්ධනයක් සිදුවිය. වර්ධන අනුපාතිකය අතින් අපනයන භාණ්ඩද විවිධාකාර බැව් පෙනේ. 1970 ගණන්වල කැපී පෙනෙන ගතිකතාවයක් දැක්වූ මැණික් අපනයනවල ප්‍රසාරණය ඉක්බිතිව සාමාන්‍ය මට්ටමකට අඩුවී 1977 න් පසුව සෘණ නැඹුරුවක් පෙන්නුම් කරමින් තිබිණි.

සාම්ප්‍රදායික නොවන අපනයන සමඟ සසඳා බලනවිට කාර්මික භාණ්ඩ අපනයනයෙහි වර්ධනය සිත්ගන්නා සුළුය. කෙසේ වුවද මෙම අංශයෙන් පවා ශ්‍රී ලංකාවේ අපනයන වර්ධන ප්‍රමාණය වෙනත් තරඟකාරී රටවල අපනයන වර්ධනය සමඟ ගැලපෙන්නේ නැත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නිමි අපනයන භාණ්ඩ අතරින් ලෝක වෙළඳාමෙහි කොටස දිගින් දිගටම වර්ධනයවී ඇත්තේ නිමි ඇඳුම් සහ පිඟන් භාණ්ඩවල පමණකි. පවතින ලෝක වෙළඳ අවස්ථාවන් සාර්ථක ලෙස උකහාගතහැකි අන්දමේ ශක්තිමත් පදනමක් මත තහවුරුවීමට අනෙකුත් අපනයන අයිතමයන් තවමත් සමත්වී නැත.

කාර්මික අපනයනය සමස්තයක් ලෙස ගත්විට වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වන්නේ දැඩි 'භාණ්ඩ සංකේන්ද්‍රනය' යි ඛණිජ තෙල් නොවන අපනයන අතරින් සියයට 80ක්ම නිමි ඇඳුම්ය. දැඩි ආනයන රැඳියාවක් සහිත අපනයන අයිතමයක් මත දැඩි ලෙස එල්බගැනීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිමි භාණ්ඩ අපනයනවල ආනයන ප්‍රතිශතය සියයට 60 ක පමණ (ඛණිජ තෙල් නිෂ්පාදන ද එක්වූ විට මෙය සියයට 69 ක්) මට්ටමක පවතී. මෙම දැඩි ආනයන රැඳියාව සහ සෘජු විදේශ අයෝජන මෙම ක්ෂේත්‍රයෙහි දරා තිබෙන වැදගත් ස්ථානය යන කරුණු දෙක අනුව බලනවිට, අපනයන ප්‍රසාරණය නිසා ඇතිවී ඇති ශුද්ධ ගෙවුම් ශේෂ පලපෑම, 'නැව්ගත මිල යටතේ' ගණන් කෙරෙන 'දළ' අපනයන ප්‍රසාරණ වේගයට වඩා බෙහෙවින් අඩුය.



Appropriate Technology Services
121, POINT-P... O ROAD
NALLUR, JAFFNA
No.......



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නාගරික පළාත්බද සංවර්ධනය දිරිගැන්වී-මෙහිලා නාගරික සේවාවන් සහ කොටස් වෙළඳ පොලේ මෙහෙයුම් කටයුතු

එම්. ඩබ්ලිව්. ජේ. ජී. මැන්දිස්

**1980 ට පසු කාලය තුළ ශ්‍රී ලංකාවේ කොටස් නිකුතුව පිළිබඳ විශ්ලේෂණයකි.**

කඩිනම් මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය, මහ කොළඹ ආර්ථික කොමිසමේ නිදහස් වෙළඳ කලාපය සහ නාගරික සංවර්ධනය හා නිවාස වැඩ සටහන යන ප්‍රධාන පෙළේ ව්‍යාපෘති තුනෙහි රාජ්‍ය අංශයේ ආයෝජන කෙරෙහි වඩාත් විශාල රුදියාවක් දක්වීම ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ගය වී පවතියි. ජනතාවගේ ජීවන තත්ත්වය නාගා සිටුවීම අරමුණු කොටගත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයේ විශාල ක්‍රියාදාමයක් ජනිත කිරීමට අවශ්‍ය ධාරිතාවය, දිරිය හා උද්යෝගය මෙකී ප්‍රධාන පෙළේ ව්‍යාපෘතිවලින් අපේක්ෂා කෙරේ.

එම තත්ත්වය යටතේ නාගරික සංවර්ධනය සාමූහික ක්‍රියාදාමයක වැදගත් ක්ෂේත්‍රයක්ව පවතියි. ...... (නිශ්චිත) නාගරික ප්‍රදේශවල ආර්ථික, සාමාජයීය සහ භෞතික සංවර්ධනය සම්බන්ධිත ඒකාබද්ධ සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම[1] අරභයා රජය විසින් 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබීය. අධිකාරිය වෙත පැවරී ඇති කර්තව්‍යයන් හා යුතුකම් ඉටුකිරීම සඳහා විශාල වශයෙන් පුළුල්වූ බලතල රැසක් එයට ලබාදී තිබේ. ඇතැම් නාගරික ප්‍රදේශ සඳහා දැනටමත් අධිකාරිය විසින් සැලසුම් (කෙටුම්පත්) සකස් කොට ඇති අතර ඒ යටතට ගැනෙන සියළුම ප්‍රදේශවල ගොඩනැගිලි සංවර්ධනය පිළිබඳ පොදු පාලනය අධිකාරිය වෙත පැවරී ඇත.

එයට අමතරව අධිකාරිය විසින් 1981 වර්ෂය අවසන දක්වා රු. බිලියන 2.2 ක පමණ අරමුදල් ප්‍රමාණයක් සිය කැමැත්තෙන්ම ආයෝජනය කර ඇත.[2] මෙම අරමුදල්වලින් බහුතර ප්‍රමාණයක් කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිලි සංකීර්ණය සහ පරිපාලන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගෙන ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ නගරයේ සහ වෙනත් නාගරික කේන්ද්‍රස්ථානවල ඉඩම් කෙලින්ම මිලයට ගෙන කාර්යාල, වාණිජ සහ සංචාරක සංකීර්ණ සංවර්ධකයින්ට බදු දී ඇත.

අනුමත දේපල සංවර්ධනය[3] සඳහා දස වසරක බදු විරාමයක් සහ සියයට සියයක ආයෝජන සහනයක් ඇතුළුව සිත්ගන්නා සුළු බදු දිරිගැන්වීම් පිරිනැමීමත් සමගම නාගරික සංවර්ධන ක්ෂේත්‍රයෙහිද පුනර්-ජීවනයක් දක්නට ලැබිණ.

ලිහිල් වෙළඳ ප්‍රතිපත්ති සහ මේ රටේ දේශීය හා විදේශික ආයෝජන සඳහා දී ඇති තත්ත්වාකාර දිරිගැන්වීම විශේෂ කොට ඇති ගොඩනැගිලි ඉදිකිරීම් සහ වෙනත් භෞතික මූලික සැලසුම් නිර්මාණ ක්ෂේත්‍රයන්හි රජයේ පොදු ප්‍රතිපත්ති නිසා නාගරික ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම හා අනෙකුත් පොදු කාර්ය ව්‍යුහ වර්ධන සම්බන්ධයෙන් උද්යෝගයක් පවතියි.

මෙකී දිරිගැන්වීම් සංඛ්‍යාවෙහි සමුච්චිත බලපෑම වී පවත්නේ විවිධ නාගරික සංවර්ධන කාර්යාවලියෙහි වැඩිවෙමින් පවත්නා වර්ධන වේගයයි. නාගරික ප්‍රාග්ධන වෙළඳපොල සහ ඒ අනුබද්ධ සේවාවන් ව්‍යාප්ත වීමත් මෙයට ඇතුළත් විය.

වර්ධන වේගය පෙන්නුම් කරන්නා වූ කේන්ද්‍ර ස්ථානය වී ඇති කොළඹ නගරයෙහි මෙය වඩාත් කැපී පෙනෙයි. වෙනස් වන සුළු නාගරික ආර්ථිකයක පැවැත්මට අවශ්‍ය වන ප්‍රාග්ධන වෙළඳ පොලක විවිධ අංගයන් ක්‍රමයෙන් ස්ථාපිත වීමෙන් එහි ආරම්භක අදියරේ ස්වයං ජනන බලය වඩාත් ප්‍රකටව ඇත. ඒ අනුව නව විදේශ වාණිජ බැංකු විසිහතරක් කොළඹ නගරය තුළ ස්වකීය කාර්යාල විවෘත කොට ඇත. එයට අමතරව විශේෂිත වාණිජ බැංකු දෙකක් මුදල් තැරැව්කාර සමාගම් හයක් බදු මූල්‍ය සමාගම් සතරක් සහ තවත් එක් සංවර්ධන බැංකුවක් කොළඹ නගරයෙහි ව්‍යාපාර කටයුතු අරඹා ඇත. තවද, වෙළඳ ද්‍රව්‍ය ඉදිරි වෙළඳ පොලක (Commodity Futures) කටයුතු තරමක් දුරට නගරයෙහි ආරම්භ කොට තිබේ.[4] එපමණක් නොව ප්‍රාග්ධන වෙළඳ පොල දිරිගැන්වීමට සහ සංවර්ධනය කිරීම සී/ස. කොළඹ ස්කන්ධ වෙළඳ (Stock Exchange Ltd.) සමාගම නොබෝද පිහිටුවා ඇත. ප්‍රාග්ධනය අවශ්‍ය අයට ප්‍රාග්ධන සංචලනය හා බෙදහැරීම සඳහා නා නා උපකරණ මෙබඳු මූල්‍ය ආයතන විසින් සොයාගෙන ඇති අතර ඒවායින් වඩාත් කැපී පෙනෙන්නක් වනුයේ ''තැන්පතු සහතික'' (C.D.) ය.

නාගරික ප්‍රදේශයන්හි ප්‍රාග්ධන වෙළඳ පොල ව්‍යාප්තිය සම්බන්ධයෙන් වැදගත් වන්නා වූ තවත් අංගයක් නම් මහජන දායකත්වය සඳහා රු. බිලියන 1.7 ක් වටිනා මේ තාක් නොවූ විරූ තරමේ කොටස් මිලියන 170 ක් සාර්ථකව නිකුත් කර

---

(1) 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනත (1) පිටුව.

(2) 1982 පෙබරවාරි මස 22 දින 'සිලෝන් ඩේලි නිව්ස්' පත්‍රයේ වාර්තා වී ඇත.

(3) දේපල සංවර්ධනයෙහි නිරතව සිටින ව්‍යාපාර සඳහා බදු දිරිගැන්වීම 1980 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 228 වැනි වගන්තිය යටතේ පිරිනමා ඇත. කෙසේ වුව ද, 1983 මාර්තු මස 31 වනදයින් පසු පිහිටුවන ලද ව්‍යාපාර සඳහා මෙම දිරිගැන්වීම අඩු කොට ඇත.

(4) රජය (අපනයන සංවර්ධන මණ්ඩලය මගින්) වෙළඳ ද්‍රව්‍ය වෙළඳ පොලක් කොළඹ පිහිටුවීම සලකා බලන බව 1983 මාර්තු 28 දිනැති 'ද අයිලන්ඩ්' පුවත්පතේ වාර්තා විය.

(5) ''1975 දී සමාගම් දෙකක් පමණක් මහජනයාට කොටස් නිකුත් කළ අතර 1980 දී නැගීමක් ඇතිවී දිගින් දිගටම වර්ධනය වූයේ... මෙමගින් කොටස් වෙළඳ පොලේ ක්ෂණික පිබිදීමක් දක්නට ලැබුණා'' යි 1983 මාර්තු 21 දිනැති ඔබ්සර්වර්' පුවත්පතේ පළවිය.





Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබීමයි. මෙය ශ්‍රී ලංකාවේ 1980 වර්ෂයෙන් පසු කාලයේ සීග්‍රයෙන් වර්ධනය වූනුුු ප්‍රපංචයකි. එබැවින් මෙය විවිධ ව්‍යවසායයන් සඳහා ප්‍රාග්ධනය සංචලනය කිරීමේ ක්‍රමයක් පමණක් නොව ස්වකීය ප්‍රදේශවල මෙන්ම රටේ අනෙකුත් ස්ථානවල සංවර්ධනය උනන්දු කරවීමෙහි ලා නාගරික සේවාවන්ගේ වර්ධනය වෙමින් පවත්නා ධාරිතාවය හා හැකියාව පෙන්නුම් කරන දර්ශකයකි.

කොටස් නිකුතුවල වර්තමාන සාර්ථකත්වයේ වේගය කොටස් වෙළඳ පොල ගණුදෙනු ඉතා ඉහළ අංශුවකින් ක්‍රියාශීලීවීමේදී ඇතිවන කොටස්වෙළඳමෙහි ආවේනික විභවතාවය පෙන්නුම් කරන්නකි. ප්‍රවර්තන නිකුතු විසින් ව්‍යවසායකයන් තුළ විශ්වාසයක් වර්ධනය කොට ඇති අතර වඩාත් ව්‍යාපාර පිහිටුවීමෙහිලා එය උනන්දුවක් දක්වනු ඇත.

මෙම තත්ත්වයන් යටතේ කොටස් නිකුතුවෙහිලා නාගරික සැලසුම්කරුවෝ තුන් ආකාරයක උනන්දුවක් දක්වති. පළමුවෙන්ම මෙම සේවාවන් සම්පාදනය කරන්නා වූ නාගරික ප්‍රදේශවල ආර්ථික පදනම ශක්තිමත් කිරීමට ඒවා තුඩුදෙති. දෙවනුව, නියම ව්‍යාපෘතිය කේන්ද්‍රගතව පිහිටිය හැකි වෙනත් ප්‍රදේශවල සංවර්ධනය සහ නාගරික කර්තව්‍යයන් අතර සම්බන්ධයක් ඇති කරයි. තෙවනුව ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ ව්‍යාවසායක ධාරිතාවය සහිත නාගරික සංවර්ධන සැලැස්මක් ඒවායින් සලසනු ලබයි.

එබැවින්, පෞද්ගලික ව්‍යවසාය සමග නාගරික සංවර්ධන උනන්දු කරවීමෙහිලා කොටස් නිකුතුවල ස්වභාවයන් අවබෝධ කර ගැනීම පිණිස 1980 වර්ෂයෙන් පසු කාලපරිච්ඡේදය තුළ කොටස් නිකුතුව මෙම රචනයෙන් විශ්ලේෂණය කෙරෙනු ඇත.

**විධික්‍රමය හා අන්තර්ගතය.**

මෙම රචනයෙහිලා භාවිතා අධ්‍යයන විධික්‍රමය වනුයේ ශ්‍රී ලංකාවේ බ්‍රෝකර්-වරුන්ගේ සංගමය මගින් සහ එදිනෙද පුවත්පත්වලට දැන්වීම මගින් දැනගත් කොටස් නිකුතු සංඛ්‍යාව සමීක්ෂණයයි. මෙ සම්බන්ධයෙන් පැහැදිලිව හඳුනා ගත හැකි "කොටස් උද්ගතයන්"* දෙකකට අනුව කොටස් එකතුව අධ්‍යයනය කර ඇති අතර 1980 පෙබරවාරි මාසයේ සිට 1982 මැයි දක්වා කාලය පළමුවද, 1982 දෙසැම්බර් සිට 1983 මාර්තු දක්වා කාලය දෙවනුවටද අධ්‍යයනය කර ඇත. රජය විසින් ස්වකීය රාජ්‍ය ආයෝජන වැඩ සටහනෙහි "මූලික ව්‍යාපෘතියක්" වශයෙන් නාගරික සංවර්ධනය නම්කොට තිබීමෙන් පසු මේ "උද්ගත" දර්ශනය වේ.[7]

මෙම අධ්‍යයනයෙහි විශ්ලේෂණය සඳහා සෑම නිකුතුවක් වෙනුවෙන් නිකුත් කරන ලද විස්තර පත්‍රිකාවක්ද උපයෝගි කරගෙන ඇත. ආයෝජන වර්ගය නිකුත් කළ කොටස් ප්‍රමාණය සහ ඒවායේ වටිනාකම සැදී ඇති අයුරු සැලකිල්ලට ගනිමින් කොටස් නිකුතුව මෙම රචනයෙන් විශ්ලේෂණය කොට තිබේ. කොටස් නිකුතුවල සඳහන් වන ව්‍යාපෘතිවල නිශ්චිත පිහිටීම පිළිබඳ විශ්ලේෂණයක්ද කරනු ලබන නිකුතු සංඛ්‍යාවේ ප්‍රවණතාවයන්ද විශ්ලේෂණයට ඇතුළත් වේ.

**රචනයේ අරමුණු**

රචනයේ ප්‍රධාන අරමුණු පහත සඳහන් පරිදි වේ.

i කොටස් නිකුතු ප්‍රමාණය දර්ශකයක් වශයෙන් ගෙන සංවර්ධනය උනන්දු කරවීමෙහිලා නාගරික ආර්ථික සේවාවන්ගේ ධාරිතාවෙහි ප්‍රවණතාවන් නිශ්චය කිරීම.

ii කොටස් නිකුතුවල සංයුතියෙන් පෙන්නුම් කෙරෙන නාගරික සේවා ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ආර්ථිකයේ කොටස් නිර්ණය කිරීම.

iii කොටස් නිකුතුවල ඇතුළත් ව්‍යාපෘතිවල නියම පිහිටීම මගින් පිළිබිඹු කරන පරිදි නාගරික සේවාවන් තුළින් කලාපීය සංවර්ධනය මත බලපෑම විශ්ලේෂණය කිරීම.

iv කොළඹ නගරය විශේෂකොට නාගරික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට පෞද්-ගලික ව්‍යාපාර උනන්දු කරවනු ඇති. නාගරික භෞමික නිර්මිතියෙහිලා මූල්‍ය සේවා අවශ්‍යතාවයන් හා නාගරික මූල්‍ය සේවාවල ස්වභාවය නිර්ණය කිරීම.

v ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සම්පාදනය හා සංවර්ධනය වැඩි දියුණු කිරීමෙහිලා උපකාරී වනු ඇති. නාගරික සංවර්ධන කාර්යවලී දැනීම් සම්භාරයට පොදුවේ දයකවීම.

**නාගරික ආර්ථික සේවා සම්බන්ධවූ කොටස් නිකුතුව.**

නාගරික ප්‍රදේශයන්හි දක්නට ලැබෙන්නාවූ වෘත්තීමය විශේෂිතතාවය විශාල නගරවල වඩාත් කැපී පෙනෙයි. එබැවින් රටේ අනෙකුත් නාගරික මධ්‍යස්ථානවලට වඩා වැඩි ආර්ථික සේවා සමූහයක් කොළඹ නගරය පිරිනමයි.

1978 වර්ෂයෙන් පසු ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමත් සමගම කොළඹ නගරයේ මෙකී සේවාවන්ගේ ස්වරූපයෙහි හා ප්‍රමාණයෙහි සැලෙන ව්‍යාප්තියක් දක්නට ලැබුණි. ප්‍රාග්ධන වෙළඳ පොල හා සම්බන්ධ කටයුතුවලදී මෙම ව්‍යාප්තිය වැඩිමනත්ම කැපී පෙනුනි.

